www.AlevelApi.com

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2015

23 - දේශපාලන විද්‍යාව

ලකුණු දීමේ පරිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂණ සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2015

23 - දේශපාලන විද්‍යාව

ලකුණු බෙදීයාම

I පත්‍රය

කාලය පැය 02 යි

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 100 කි.**

II පත්‍රය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03කින් යුක්තය.

A කොටස - කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20 කි.

B කොටස - අර්ධ ව්‍යූහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 04කි. ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

C කොටස - අර්ධ ව්‍යූහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 04 කි. දෙකකට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම: **I පත්‍රය = 100**

II පත්‍රය= 100

අවසාන ලකුණ = 200+2 =100

Alevel ඇලවි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

පරීක්ෂකවරුන්ට උපදෙස්

මෙම සංග්‍රහය තුළ අන්තර්ගත වන්නේ අ.පොෂ.සා. (උ.පෙළ) 2015 අගෝස්තු මාසයේදී පවත්වන ලද විභාගය සඳහා අංක 23 දේශපාලන විද්‍යාව විෂය නිර්දේශයට අයත් පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර වල අඩංගු ප්‍රශ්න සඳහා පාලක පරීක්ෂක මණ්ඩලය විසින් සකසන ලද ආදර්ශ පිළිතුරු මාලාවය. මෙම පිළිතුරු සහකාර පරීක්ෂකවරුන්ට පිළිතුරු ඇගයීම සඳහා මඟ පෙන්වීමක් පමණක් වේ. පිළිතුරු වල අඩංගු වන්නේ අසා ඇති ප්‍රශ්නයට අදාළවන මූලික කරුණු පමණි. මෙම කරුණු වලට අමතරව අපේක්ෂකයින් තවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් ඒවායේ අදාළ භාවය සැළකිල්ලට ගෙන ඒ සඳහා ද ලකුණු ලබා දීමට පරීක්ෂකවරයා ක්‍රියාකළ යුතුය. පිළිතුරු සඳහා ලකුණු ලබා දීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි පරීක්ෂවරයා විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය.

(අ) ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන තිබේද? ප්‍රවේශය මඟින් අවබෝධ කර ගත හැක.

(ආ) ප්‍රශ්නයට අදාළ කරුණු නිවැරදිව තෝරා ගෙන තිබෙනවාද සහ එම කරුණු නිවැරදිව විධිමත් අයුරින් සංවිධානය කොට ඉදිරිපත් කර තිබෙනවාද යන්න.

(ඇ) කරුණු ප්‍රමාණවත් අයුරින් විශ්ලේෂණය කර තිබෙනවාද යන්න.

(ඈ) අවසාන නිගමනයකට එළඹ තිබේද යන්න සහ එම අවසාන නිගමනය තාර්කික එකක් වනවාද යන්න.

අපේක්ෂකයින් පිළිතුරු තුළ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව යම් ගැටළු සහගත තත්වයක් පවතින්නේ නම් ඒ පිළිබඳව ප්‍රධාන පරීක්ෂකවරයාගේ අවධානයට ලක් කොට තීරණයක් ගත යුතුය.

ප්‍රශ්න පත්‍රවල අභිමතාර්ථය

I වන ප්‍රශ්න පත්‍රය

දේශපාලන විද්‍යාව විෂය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ ව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වේ. මේ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳ ව සෘජුවම අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මඟින් තෝරාගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ.

II වන ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවැති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණ වල බලපෑම හා එහි ප්‍රතිඵල පිළිබඳවත්, නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ දේශපාලනය හා ආණ්ඩුක්‍රම වර්ධනය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධ පරීක්ෂාවට ලක්කිරීමය. මෙයට අමතරව ශ්‍රී ලංකාව සහ අන්තර්ජාතික සමාජය අතර පවත්නා සම්බන්ධතාවයන්හි ස්වරූපය පිළිබඳව ද අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම තවත් අරමුණක් වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதர பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

දේශපාලන විද්‍යාව அரசியல் விஞ்ஞானம் Political Science	I I I	23 S I	පැය දෙකයි இரண்டு மணித்தியாலம் Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100කි.**

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා අදාළ ව සපයන ලද ප්‍රකාශ පහකිනි. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනයේ දී සැලකිලිමත් වන කරුණු වන්නේ:
A - රාජ්‍ය සහ ආණ්ඩුව
B - දේශපාලන බලය
C - පුද්ගලයින්ගේ දේශපාලන චර්යාව
D - ජනතාව, ආණ්ඩුව හා රාජ්‍ය අතර පවත්නා සම්බන්ධතාව
E - ලෞකික ජීවිතයෙන් මිනිසුන් මුදවා ගැනීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2. දේශපාලනය:
A - බල අරගලයේ ප්‍රායෝගික ප්‍රකාශනය වේ.
B - දේශපාලන, ආර්ථික හා සමාජ කරුණු පිළිබඳ ව පවතින ප්‍රතිවිරුද්ධ ආශාවන්ගේ ප්‍රතිඵලය වේ.
C - පුද්ගලයින්, දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ විසින් කරනු ලබන ක්‍රීඩාවක් වේ.
D - මහත්වරුන්ගේ ක්‍රීඩාවක් ලෙස ද සැලකේ.
E - කාට, කුමක්, කුමන අවස්ථාවක, කෙසේ හිමිවන්නේ ද යන්න තීරණය කෙරෙන ක්‍රීඩාව වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

3. චර්යාවාදය:
A - නිරීක්ෂණය කළ හැකි මානව චර්යාව පමණක් පදනම් කරගෙන සමාජ න්‍යායන් ගොඩනැගිය යුතු ය යන විශ්වාසය මත ගොඩනගා ඇත.
B - දේශපාලන විද්‍යාව සැලකිලිමත් වන අවසාන අඟය කිරීම් සහිත කරුණු අධ්‍යයනය කිරීම සඳහා වඩාත් සැලකිලිමත් විය යුතු බව අවධාරණය කර ඇත.
C - පර්යේෂණ සහ සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කිරීම මඟින් ප්‍රමාණීකරණය කළ හැකි දත්ත එක්රැස් කිරීම හා සම්බන්ධ වේ.
D - අනාවැකි පළ කිරීමේ හැකියාව සහිත ප්‍රත්‍යක්ෂ මූලික න්‍යායන් ගොඩනැගීමට උත්සාහ දරා ඇත.
E - සත්‍යතාව පරීක්ෂා කළ හැකි විස්තරාත්මක න්‍යායන් මත විද්‍යාත්මක දැනුම වර්ධනය කළ හැකි බව අවධාරණය කර ඇත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

4. රාජ්‍යය:
A - දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජය වේ.
B - ජනතාවගේ සාමූහික කැමැත්ත නියෝජනය කරන ඒජන්තවරයා වේ.
C - දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කළ උසස් ම දේශපාලන සංවිධානය වේ.
D - ස්වාධිපති බලය නමින් හැඳින්වෙන උත්තරීතර බලයේ තනි හිමිකරුවා වේ.
E - භූමිය, ජනගහනය, ආණ්ඩුව හා ස්වාධිපති බලය යන මූලික සාධකවලින් සමන්විත වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. ජාතික රාජ්‍යය:
- A - සංස්කෘතික විවිධත්වය සහ දේශපාලන අසමගිකම් ආරක්ෂා කරන්නා වූ රාජ්‍ය ක්‍රමය ලෙස පොදු පිළිගැනීමට ලක්ව ඇත.
- B - පුරවැසිභාවය සහ ජාතිකත්වය සමඟ සම්බන්ධ දේශපාලන බැඳීම් මත ගොඩනගා ඇති ස්වාධීන දේශපාලන සමාජය වේ.
- C - බහුජාතික අධිරාජ්‍ය ක්‍රමයට සහ නාගරික රාජ්‍ය ක්‍රමයට එරෙහි විකල්පයක් ලෙස 16 වන සියවසේ දී පැනනැඟුණු රාජ්‍ය ක්‍රමයක් වේ.
- D - 'සෑම ජාතියකට ම රාජ්‍යයක් සහ සමස්ත ජාතියට ම එක් රාජ්‍යයක්' යන මූලධර්මය මත ගොඩනැඟී ඇත.
- E - අන්තර්ජාතික දේශපාලනයේ මූලික ඒකකය ලෙස පොදුවේ පිළිගනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

6. ස්වාධිපති න්‍යාය:
- A - රාජ්‍යයේ බලය ගැන සලකා බලන න්‍යාය වේ.
- B - අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය උත්තරීතරභාවයක් රාජ්‍යයට තිබෙන බව අවධාරණය කර ඇත.
- C - රාජ්‍යයේ නීතිවලට සුජාතභාවය සපයනු ලැබේ.
- D - ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය හා පැවැත්ම සාධාරණීකරණය කර ඇත.
- E - දෙවියන් වහන්සේ දේශපාලන බලයේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස පිළිගෙන ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

7. ආණ්ඩුව:
- A - රාජ්‍යයේ ස්වාමියා වේ.
- B - රාජ්‍යයේ මොළය ලෙස සලකනු ලැබේ.
- C - රාජ්‍ය වෙනුවෙන් ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ඒජන්තවරයා වේ.
- D - රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වේ.
- E - රාජ්‍යය සහ ජනතාව එකට යා කරන මාධ්‍යය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

8. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ:
- A - එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත ක්‍රියාත්මක වීම
- B - විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර බලය බෙදා තිබීම
- C - ව්‍යවස්ථාදායකය හා විධායකය මත පතිත වී ඇති අධිකරණයේ ආධිපත්‍යත්වය
- D - පාලකයන් ජනතාවට වගකීම
- E - කලින් කල පවත්වන තරඟකාරී මැතිවරණ මඟින් ජනතාව විසින් පාලකයින් තෝරාපත් කිරීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

9. සමාජවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ:
- A - ආණ්ඩුව එක් පක්ෂයක් මත පමණක් ගොඩනගා තිබීම
- B - ඒකබලවාදී පාලන ක්‍රමයක් පැවතීම
- C - කොමියුනිස්ට් සමාජ ක්‍රමයක් ගොඩනැඟීම සඳහා ක්‍රියා කිරීම
- D - සමාජ බහුවිධතාව ප්‍රතික්ෂේප කිරීම
- E - තම කැමැත්ත අනුව ආණ්ඩුව වෙනස් කිරීමට ජනතාවට බලය තිබීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ:
- A - පැහැදිලි දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයක් නොමැති වීම
- B - තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක් නොමැති වීම
- C - අනුග්‍රාහක පත් කිරීම් මත ආණ්ඩුව පැවතීම
- D - කලින් කල පවත්වන මැතිවරණ මඟින් ජනතාව විසින් පාලකයින් තෝරා ගැනීම
- E - පාලකයා විසින් තම අභිමතය පරිදි රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
- A - මධ්‍යම ආණ්ඩුවේ ආයතන තුළ දේශපාලන බලාධිකාරය ඒකරාශී වීම
- B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බලය අවධාරිත කරන ලද පළාත් පාලන ආණ්ඩුක්‍රමයක පැවැත්ම
- C - ස්වාධිපති බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරීත්වය
- D - මධ්‍යම ආණ්ඩුව මඟින් පමණක් ජාතියේ ආශාවන් ප්‍රකාශ කිරීම
- E - එක් පුරවැසිභාවයක්, නීති ක්‍රමයක්, අධිකරණ ක්‍රමයක් හා සිවිල් සේවයක් පැවැතීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

12. සන්ධිය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:

A - එකිනෙකට වෙනස් තල දෙකක ආණ්ඩු පැවැතීම
B - මධ්‍යය හා පරිධිය ස්වාධිපති බලය හවුලේ ක්‍රියාවට නැංවීම
C - පරිධියේ ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත් වීම
D - මධ්‍යයේ සහ පරිධියේ බලතල, කාර්ය සහ වගකීම් මූලික නීතිය මගින් බෙදාහැර තිබීම
E - මධ්‍යය සහ පරිධිය අතර ඇති වන ආරවුල් විසඳීම සඳහා මැදිරුම්කරුවකු ලෙස ක්‍රියා කරන ස්වාධීන අධිකරණයක පැවැත්ම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. කැබිනට් ආණ්ඩුක්‍රමයක සත්‍ය විධායකය:

A - ව්‍යවස්ථාදායකය විසින් එහි බහුතර පක්ෂයේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත්කරනු ලැබේ.
B - දේශපාලන විධායකය ලෙස ද හඳුන්වනු ලැබේ.
C - නාමික විධායකයේ නාමයෙන් විධායක කාර්යයන් ක්‍රියාවට නැංවීම පැවරී ඇත.
D - විධායක කාර්යයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී ඇත.
E - ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ හැකි ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. ජනාධිපති ආණ්ඩුක්‍රමය:

A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා යොදා ගැනෙන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට ඇති එක් විකල්පයක් වේ.
B - ගොඩනැඟී තිබෙන්නේ ව්‍යවස්ථාදායකයට වඩා නොකියන ජනාධිපති නමින් හඳුන්වන විධායකයක් පදනම් කරගෙන ය.
C - වඩාත් කාර්යක්ෂම නමුත් ප්‍රජාතන්ත්‍රවාදය අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
D - ගොඩනැඟී තිබෙන මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායකය හා විධායක අතර පවතින දුරස්ථ සම්බන්ධතාවයි.
E - ලෝකයට ප්‍රථමවරට හඳුන්වා දුන්නේ 1958 ඩිගෝල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. සිවිල් සමාජය:

A - රාජ්‍යයේ අධිකාරී බලයෙන් ජනතාවගේ සිවිල් බලය වෙන් කර දැක්වීම සඳහා යොදා ගැනෙන සංකල්පය වේ.
B - සමාජයේ ස්වාධීන කණ්ඩායම් හා පෞද්ගලික සංවිධානවල එකතුවෙන් ගොඩනැඟී ඇත.
C - ඒකබලවාදී පාලන ක්‍රම තුළ පවා පූර්ණ ක්‍රියාත්මක නිදහස භුක්ති විඳියි.
D - සමාජයේ 'කුඩා හට සේනාංක' ඒකරාශි වීමක් ලෙස ද හැඳින්වේ.
E - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **16** සිට **21** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. එම **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

16. ජාතිකවාදය:

(1) 'දේශපාලන සංවිධාන ව්‍යුහයේ කේන්ද්‍රීය මූලධර්මය ජාතිය වනවා' ය යන විශ්වාසය මත ගොඩනගන ලද දේශපාලන මතවාදයකි.
(2) නූතන ලෝකයේ වර්තමාන තත්ත්වය හැඩගැස්වීම සඳහා බෙහෙවින් ම බලපෑම් කර ඇති වඩාත් බලවත් දේශපාලන මතවාද අතුරෙන් එකකි.
(3) දේශපාලන ජාතිකවාදය හා සංස්කෘතික ජාතිකවාදය යනුවෙන් පැතිකඩ දෙකකින් යුක්ත ය.
(4) 'සෑම ජාතියක් ම ස්වාධීන රාජ්‍යත්වයකට හිමිකම දරනු ලැබේ' යන උපකල්පනය මත පදනම් වී ඇත.
(5) දේශපාලන සංකල්පයක් වන අතර එය පැන නැඟුණේ මාක්ස්වාදය, පැසිස්ට්වාදය හා නාසිවාදයට එරෙහිව ය.

17. පුරවැසිභාවය:

(1) පුද්ගලයා හා රාජ්‍ය අතර පවතින සම්බන්ධතාව ප්‍රකාශ වන මාධ්‍යය වේ.
(2) රාජ්‍යයේ පූර්ණ සාමාජිකත්වයට හිමිකම් කිම සඳහා තිබිය යුතු මූලික පූර්ව අවශ්‍යතාව වේ.
(3) රාජ්‍යයේ පූර්ණ සාමාජිකයින් ලෙස නොසලකන යටත් වැසියන්ට හා විදේශිකයන්ට හිමි නොවේ.
(4) සම්බන්ධ වන මූලික බැඳීමක් වන්නේ රාජ්‍යයේ පැවැත්ම උදෙසා අවශ්‍ය සමහර යුතුකම් ඉටු කිරීමට පුරවැසියන්ට සිදු වීම ය.
(5) හිමි අයට තම කැමැත්ත අනුව ඕනෑම අවස්ථාවක සියදිවි හානිකර ගැනීමේ අයිතිය හා නිදහස ඇත.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

18. දේශපාලන පක්ෂ:
(1) මැතිවරණ ජයග්‍රහණය කිරීම මඟින් දේශපාලන බලය ක්‍රියාවට නැංවීම ඉලක්ක කරගත් ජනතා සංවිධාන වේ.
(2) නිල කාඩපතක් සහිත සාමාජිකත්වය දරන සංවිධාන වේ.
(3) ජනතාවාදී සහ කේඩර, ව්‍යවස්ථානුකූල සහ විප්ලවකාරී, නියෝජන සහ ඒකාබද්ධ කිරීමේ පක්ෂ යනාදි වශයෙන් වර්ග කරනු ලැබේ.
(4) නූතන දේශපාලනය තුළ ජනතාව සංවිධානය කිරීමේ ප්‍රධානතම මාධ්‍යයක් වේ.
(5) දේශපාලන සමාජානුයෝජනයේ ඒජන්තවරුන් අතුරෙන් ඉතා ම වැදගත් ඒජන්තවරයකු වේ.

19. බලපෑම් කණ්ඩායම්:
(1) ආශා කණ්ඩායම් ලෙස ද හඳුන්වනු ලැබේ.
(2) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකර දෙයක් ලෙස සලකනු ලැබේ.
(3) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ පමණක් දැකිය හැකි ය.
(4) ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට හෝ ක්‍රියාවලට හෝ බලපෑම් කිරීමේ අරමුණෙන් ගොඩනැගුණු සංවිධාන වේ.
(5) සාමාන්‍යයෙන් සැලකිලිමත් වන්නේ විශේෂිත කරුණක් හෝ විශේෂිත කණ්ඩායමක ආශා හෝ පිළිබඳව ය.

20. දේශපාලන නියෝජනය:
(1) පුළුල් ජනතා කණ්ඩායමක් වෙනුවෙන් එක් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ පෙනී සිටින හෝ ක්‍රියාකරන හෝ ආකාරය පෙන්නුම් කරන සම්බන්ධතාව වේ.
(2) නූතන තත්ත්ව යටතේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවිය හැකි එකම මාධ්‍යය ලෙසට පුළුල් පිළිගැනීමක් ඇත.
(3) ප්‍රධාන වශයෙන් ක්‍රියාවට නැංවෙන්නේ මහජන මැතිවරණ මඟිනි.
(4) සෘජුව ම ආණ්ඩුකරණයට සහභාගි වීමට ජනතාවට ඉඩ සැලසෙන මාධ්‍යය වේ.
(5) ජනතා අප්‍රසාදයට පත් වූ දේශපාලකයින් හා ආණ්ඩු, දේශපාලනයෙන් ඉවත් කිරීම සඳහා ජනතාවට ඇති එකම ප්‍රජාතාන්ත්‍රික ක්‍රමය වේ.

21. මානව හිමිකම්:
(1) දෙවියන් වහන්සේ විසින් ජනතාවට දෙන ලද අයිතීන් වේ.
(2) මිනිසුන් වීම නිසා ම මිනිසුන්ට හිමිවන අයිතීන් වේ.
(3) විශ්වීය මෙන් ම, මූලික ද වන බව පිළිගෙන ඇත.
(4) නිදහසට, සමානාත්මතාවට සහ සාධාරණත්වයට මග පාදන මූලික පදනම් ලෙස සැලකේ.
(5) මිනිසුන්ට යහපත් දේශපාලන හා සිවිල් ජීවිතයක් වර්ධනය කර ගැනීමට අත්‍යාවශ්‍ය ම දෙයක් ලෙස සලකනු ලැබේ.

● අංක **22** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් **හතරක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ කණ්ඩය තෝරන්න.

22. නිර්දිෂ්ට රටවල්වල දේශපාලන ක්‍රමයන්හි විශේෂ ලක්ෂණ කිහිපයක්:
A - මහා බ්‍රිතාන්‍ය තුළ කැබිනට් මණ්ඩලය දෙවන මණ්ඩලයේ බහුතර බලය හිමි පක්ෂයේ සාමාජිකයින් අතුරෙන් තෝරාපත් කරන අතර කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහික ව වගකීමට බැඳී සිටී.
B - ඇමෙරිකාව තුළ නියෝජිතයින් 538 කින් සමන්විත ඡන්ද විද්‍යාලයක් මඟින් වක්‍රව ජනාධිපතිවරයා තෝරන අතර ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කිරීම සඳහා මුළු නියෝජිත සංඛ්‍යාවෙන් 2/3 ක කැමැත්ත අවශ්‍ය වේ.
C - ඉන්දියාව තුළ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කර ඇති ඡන්ද විද්‍යාලය සමන්විත වන්නේ මධ්‍යම ව්‍යවස්ථාදායකයේ සහ ප්‍රාන්ත ව්‍යවස්ථාදායක සභාවල සියලු ම මන්ත්‍රීවරුන්ගෙනි.
D - 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ප්‍රංශය තුළ ස්ථාපිත කළ ජාතික සභාව, මහජන ඡන්දයෙන් තෝරාපත් කරන නියෝජිතයින්ගෙන් පමණක් සමන්විත වන අතර ජාතික සභාවේ නිල කාලය වූ අවුරුදු හතර ඉක්මවීමට ප්‍රථමයෙන් එය විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය නොමැත.
E - ස්විට්සර්ලන්තයේ සන්ධිය කවුන්සිලය නමින් හැඳින්වෙන මධ්‍යම රජයේ විධායකය සන්ධිය සභාව විසින් පත්කරන සාමාජිකයින් සත්දෙනෙකුගෙන් සමන්විත වන අතර සන්ධිය කවුන්සිලය තීරණ ගැනීමේ දී සාමූහිකව කටයුතු කිරීමට බැඳී සිටී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

23. අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යවල ප්‍රධාන අරමුණ වන්නේ:
A - ජාතික භාෂාව හා සංස්කෘතිය වර්ධනය කිරීම
B - ජාතික ආශාවන් වර්ධනය කිරීම
C - අනෙක් ජාතීන් සමඟ මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම
D - ජාතික මනවාදය වර්ධනය කිරීම
E - එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

24. රාජ්‍ය ප්‍රතිපත්ති:
A - ජනතාවගේ පොදු යහපත වර්ධනය කිරීම උදෙසා ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
B - ලාභය ඉහළ නැංවීම උදෙසා පෞද්ගලික සමාගමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
C - සාමාජිකයින්ගේ සුභසාධනය ඉහළ නැංවීම සඳහා ග්‍රාම සංවර්ධනය සමිතියක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
D - නිමැවුම ඉහළ නැංවීම සඳහා ආණ්ඩුවේ සංස්ථාවක් විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් වේ.
E - තම පෞද්ගලික ආශා ප්‍රවර්ධනය කිරීම සඳහා බලපෑම් කණ්ඩායමක් විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

25. සමාජ ගැටුමක් යනුවෙන් අදහස් කරන්නේ:
A - සංවිධානයක අභ්‍යන්තරයේ ඇති වන ගැටුමකි.
B - සමාජ කණ්ඩායම් අතර ඇති වන ගැටුමකි.
C - පුද්ගලයාගේ අභ්‍යන්තරයේ ඇති වන ගැටුමකි.
D - පක්ෂයක අභ්‍යන්තරයේ ඇති වන ගැටුමකි.
E - ආණ්ඩුවක අභ්‍යන්තරයේ ඇති වන ගැටුමකි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **26** සිට **38** තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.

26. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ වර්ධනය වූ, දේශපාලන හා ආර්ථික වශයෙන් වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් වන්නේ:
A - ජනතා නියෝජනය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය
B - නිදහස් ශ්‍රම වෙළෙඳපොළ
C - ස්වාධීන සහ ඒකීය අධිකරණ ක්‍රමය
D - මධ්‍යගත සහ ස්වාධීන පරිපාලන ක්‍රමය
E - පිරිවෙන් අධ්‍යාපනය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ:
A - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හේතුවෙන් කුල ක්‍රමය පරිහානියට පත් විය.
B - විවෘත වෙළෙඳපොළ ක්‍රමය හඳුන්වා දීම හේතුවෙන් දේශීය ආර්ථිකය අන්තර්ජාතික වෙළෙඳපොළට බද්ධ විය.
C - පසුකාලීනව ජාතික ව්‍යාපාරයට නායකත්වය දුන් දේශීය ධනපති පංතිය බිහි විය.
D - ආණ්ඩුවෙන් දෙන ලද පොහොර සහනාධාරය හේතුවෙන් ග්‍රාමීය කෘෂිකර්මය දියුණු විය.
E - කච්චේරි ක්‍රමය පදනම් කරගත් ප්‍රාදේශීය පරිපාලන ක්‍රමයක් වර්ධනය විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

28. වාර්ගික නියෝජනය:
A - 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන්නේ ය.
B - ලාංකික සමාජය තුළ වාර්ගවාදය උත්සන්න වීම කෙරෙහි බෙහෙවින් ම හේතු වූ දෙයක් විය.
C - සුළුතර ජන කොටස් බොහෝ සෙයින් ප්‍රියමනාපය දැක්වූ ක්‍රමයක් විය.
D - නියෝජනය සඳහා හොඳ මූලධර්මයක් ලෙස ලංකා ජාතික සංගමය පිළිගත්තේ ය.
E - 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

29. 1911 - 1924 කාලය තුළ ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ:
A - විධායක කාරක සභා ක්‍රමය පදනම් කරගත් ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කරන ලදී.
B - ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත සංඛ්‍යාව වැඩි කරන ලදී.
C - ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන්ගේ බලතල වැඩි කරන ලදී.
D - නිල නොලත් සාමාජික සංඛ්‍යාව වැඩි කරන ලදී.
E - සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. 1924 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින්:
A - ආණ්ඩුකාරවරයාගේ බලතල පූර්ණ ලෙස කප්පාදු කරන ලදී.
B - ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය පුළුල් කරන ලදී.
C - නිල නොලත් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරන ලදී.
D - වාර්ගික නියෝජනය වෙනස් නොකරන ලදී.
E - වගකීමෙන් බලය වෙන් කිරීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

31. ජාතික ව්‍යාපාරය:
A - බටහිර අධ්‍යාපනය ලත් මධ්‍යම පන්තිය විසින් ආරම්භ කොට මෙහෙයවන ලදී.
B - සමාජයේ සියලු ම සමාජ ස්ථර අන්තර්ගත ජනතා ව්‍යාපාරයක් විය.
C - ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හරහා වගකීමේ ආණ්ඩුවක් ලබා ගැනීමට උද්ඝෝෂණය කළේ ය.
D - විචාරකයින්ට අනුව දකුණු ආසියාවේ වඩාත් ම සාමකාමී ජාතික ව්‍යාපාරවලින් එකක් විය.
E - වර්ගවාදී බෙදීම හේතුවෙන් 1921 න් පසු කාලය තුළ දුර්වල විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

32. ලංකා ජාතික සංගමය:
A - 1919 දෙසැම්බර් 11 දින පිහිටුවන ලදී.
B - ඉහළ මධ්‍යම පන්තියේ උගත් හා ධනවත් පුද්ගලයින් විසින් සංවිධානය කළේ ය.
C - ඡාත්‍ර සංවිධානයක් විය.
D - නිදහස් ව්‍යාපාරය උදෙසා සාමාන්‍ය ජනතාව මෙහෙයවීමට උනන්දු නොවී ය.
E - පහතරට සිංහල බෞද්ධ මධ්‍යම පන්තියේ පුද්ගලයින් විසින් ඇරඹූ සංවිධානයක් විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

33. මුදල් කාරක සභාව:
A - පිහිටුවූයේ 1907 වර්ෂයේ දී හෙන්රි මැකලම් ආණ්ඩුකාරවරයා විසිනි.
B - සමන්විත වූයේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන ආදායම් පාලක නිලධාරී, භාණ්ඩාගාරික සහ සියලු ම නිල නොලත් සාමාජිකයින්ගෙනි.
C - ව්‍යවස්ථාදායක සභාවේ සැසිවාර නොපැවැත්වෙන අවස්ථාවල දී මුදල් පනත් පිළිබඳ ව ක්‍රියාකිරීමේ බලය භුක්ති වින්දේ ය.
D - 1912 සිට 1920 දක්වා පැවැති කෲව්-මැකලම් ආණ්ඩුක්‍රමය යටතේ නොසලකා හරින ලදී.
E - මුදල් කරුණු සම්බන්ධයෙන් මිත්‍රශීලිව කටයුතු කිරීමට නිලලත් සහ නිලනොලත් සාමාජිකයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

34. ලංකා සමසමාජ පක්ෂය:
A - පිහිටුවූයේ 1935 දෙසැම්බර් 18 දින දී ය.
B - ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ප්‍රථම වාමාංශික පක්ෂය මෙන් ම ප්‍රථම දේශපාලන පක්ෂය ද විය.
C - නිදහස් ව්‍යාපාරය මෙහෙයවීම සඳහා ලංකා ජාතික සංගමය සමග කිට්ටු සහයෝගයකින් ක්‍රියා කළේ ය.
D - ආරම්භ කළේ බටහිර අධ්‍යාපනය ලද මාක්ස්වාදයට නැඹුරු වූ මධ්‍යම පන්තික තරුණ රැඩිකල් කණ්ඩායමක් විසිනි.
E - ලංකාව තුළ සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවීම අරමුණ විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

35. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ පිහිටුවූ රාජ්‍ය මන්ත්‍රණ සභාව:
A - සාමාජිකයින් 61 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එයින් 50 දෙනෙකු තෝරාපත් කළේ ජනතාව විසිනි.
B - විධායක හා ව්‍යවස්ථාදායක යන කාර්ය දෙක ම පැවරිණි.
C - කථානායක නොමැති වූ විට ආණ්ඩුකාරවරයා මුලසුන දැරී ය.
D - වාර්ෂික අයවැය ප්‍රතික්ෂේප කිරීමේ සහ අමාත්‍ය මණ්ඩලය ඉවත් කිරීමේ බලය පවරා තිබිණි.
E - ආණ්ඩුකාරවරයාගේ තනි අභිමතය අනුව ඕනෑම අවස්ථාවක දී විසුරුවා හැරීමට යටත් විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

36. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලය:
A - සජාතීය සංගතයක් විය.
B - සාමාජිකයින් දස දෙනකුගෙන් සමන්විත විය.
C - සාමූහික වගකීමෙන් තොරව ක්‍රියාත්මක විය.
D - ප්‍රධාන ලේකම්වරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක විය.
E - වාර්ෂික අයවැය සහ අනෙක් මුදල් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වගකිව යුතු විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

37. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
A - විධායක කාරක සභා ක්‍රමය මත ගොඩනැඟී තිබුණ ආණ්ඩුක්‍රමය අහෝසි කොට කැබිනට් ආණ්ඩු ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
B - පූර්ණ ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය නොකළ අතර ප්‍රදානය කළේ අභ්‍යන්තර කරුණු සම්බන්ධයෙන් නිදහස පමණි.
C - බ්‍රිතාන්‍ය රැජින ලංකාවේ රාජ්‍ය නායක තනතුරෙහි තවදුරටත් තබා ගත්තේ ය.
D - අධිකරණ ඇමති සෙනෙට් සභාවෙන් තෝරාගත යුතු බවට නියම කළේ ය.
E - අධිකරණ කටයුතු සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලයට අභියාචනා කිරීමට ලාංකිකයින් භුක්තිවින්ද අයිතිය අහෝසි කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

38. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය:
A - ද්වී මාණ්ඩලික විය.
B - ස්ථාපිත කරනු ලැබුයේ පාර්ලිමේන්තු ස්වාධිපතීත්වය පිළිබඳ මූලධර්මය පදනම් කරගෙන ය.
C - 29 (2) වගන්තියට යටත්ව නීති පැනවීමේ බලය භුක්ති වින්දේ ය.
D - නාමකරණයෙන් හා තෝරාපත් කිරීමෙන් පත්වූ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය.
E - 'පාර්ලිමේන්තුව' යන නිල නාමයෙන් හැඳින්විණි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **39** සිට **44** තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් ප්‍රකාශ **හතරක්** වැරදි වේ. **වැරදි** ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.

39. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව:
A - ආණ්ඩුක්‍රමය තුළ බ්‍රිතාන්‍ය රැජිනගේ නායකත්වය එසේ ම රඳවා ගනු ලැබී ය.
B - ශ්‍රී ලංකාව සඳහා සන්ධිය ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේ ය.
C - ශ්‍රී ලංකාව නිදහස්, ස්වාධිපති, ස්වාධීන ජනරජයක් බවට ප්‍රකාශ කළේ ය.
D - ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් ලෙස නම් කළේ ය.
E - ශ්‍රී ලංකාව සඳහා නව ජාතික ගීයක් හඳුන්වා දුන්නේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

40. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වූ රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම මාලාව:
A - රාජ්‍ය විසින් පිළිපැදිය යුතු සමාජ, ආර්ථික, දේශපාලන සහ සදාචාරාත්මක මාර්ගෝපදේශ මාලාවක් විය.
B - පුරවැසියන්ට ප්‍රදානය කළ මූලික අයිතිවාසිකම් මාලාවක් විය.
C - ආණ්ඩුකරණයේ දී ආණ්ඩුව විසින් පිළිපැදිය යුතු බැඳීම් මාලාවක් විය.
D - මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් පාලන ආයතනවලට නිකුත් කරන ලද මෙහෙයුම් නියෝග පද්ධතියක් විය.
E - යුක්තිය පසිඳලීමේ දී අධිකරණය විසින් පිළිපැදිය යුතු නිර්ණායක පද්ධතියක් විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

41. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව:
A - ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කිරීම උදෙසා බෙහෙවින් දායක විය.
B - ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගමික ස්වරූපය වෙනස් කළේ ය.
C - ව්‍යවස්ථාදායකයේ බලතල, තත්ත්වය හා අධිකාරී බලය බෙහෙවින් ශක්තිමත් කළේ ය.
D - ශ්‍රී ලංකා රාජ්‍යයේ මූලික ව්‍යවස්ථානුකූල පදනම බවට ගෝලිස්ට් ජනාධිපති ක්‍රමය පත් කළේ ය.
E - රාජ්‍ය ධනවාදය සමඟ බද්ධ වූ ඉහළ මට්ටමේ සුභසාධන කාර්යයන් රාජ්‍යයේ ආර්ථික ප්‍රතිපත්තිය ලෙස පිළිගැනිණ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

42. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ:
A - ඇමරිකානු ක්‍රමයට සමාන ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
B - නීති සම්පාදනය සඳහා පූර්ණ ස්වාධිපති බලය සහිත ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කරන ලදී.
C - ජනාධිපතිවරයකු සහ කැබිනට් මණ්ඩලයකින් යුත් දෙමුහුන් විධායකයක් නිර්මාණය කරන ලදී.
D - අධිකරණ විවරණ බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවන ලදී.
E - දේශපාලන විධායකයේ බලපෑම්වලින් බිඳුණු රාජ්‍ය පරිපාලන සේවාවක් පිහිටුවන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

43. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු බලතල වන්නේ:
A - සැසිවාර කැඳවීම, කල්තැබීම හා විසුරුවා හැරීම
B - ජනාධිපති ආඥාවක් මගින් පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීම
C - පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද පනත්වලට අනුමැතිය ලබා දීම
D - විවාදවලට සහභාගි වීමේ දී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම
E - කථානායකවරයා තේරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. 1978 ව්‍යවස්ථාව මගින් ප්‍රදානය කළ මූලික අයිතිවාසිකම් යටතේ:
A - ජීවත්වීමේ අයිතිය ප්‍රකාශිතව ම සහතික කර ඇත.
B - කිසිදු මූලික අයිතිවාසිකමක් භුක්ති විඳීම සම්බන්ධයෙන් කිසිදු සීමාවක් පනවා නැත.
C - හදිසි අවස්ථා තත්ත්වයක් තුළ සමහර අයිතිවාසිකම් නිශ්ක්‍රීය කිරීමට ඉඩ ලබා දී ඇත.
D - මූලික අයිතිවාසිකම් ජනතා පරමාධිපත්‍යයේ කොටසක් ලෙස පිළිගෙන ඇත.
E - මූලික අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම් විමර්ශනය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා නැත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා නවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- පහතින් දක්වා ඇති ප්‍රකාශ පදනම් කරගෙන අංක **45** හා **46** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග තුනකින් සමන්විත වේ.
B - 1987 ඉන්දු-ලංකා සාම ගිවිසුමේ කොන්දේසි යටතේ පිහිටුවන ලදී.
C - පළාත් සභාවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
D - එක් පළාතකට එකක් බැගින් පිහිටුවා ඇත.
E - මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහ අනෙක් අමාත්‍යවරුන් පත්කරනු ලැබේ.
F - තමන්ගේ බල ප්‍රදේශය තුළ සමාජ ප්‍රයෝජ්‍යතා සේවා සැපයීමේ වගකීම පැවරී ඇත.
G - ප්‍රධාන විධායකය ආණ්ඩුකාරවරයා ලෙස හඳුන්වන අතර ඔහු පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි.
H - වසර හතරක නිල කාලයක් සඳහා ජනතා ඡන්දයෙන් තේරිපත් වූ සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වේ.
I - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පැවරුව ද ස්වාධිපති ආයතන නොවේ.
J - තම අභිමතානුසාරී බලය යොදවමින් ඕනෑම අවස්ථාවක විසුරුවා හැරීමට පළාත් මහ ඇමතිවරයාට හැකියාව ඇත.

45. පළාත් සභාවලට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) ABCD (2) EFGH (3) ABIJ (4) BDGI (5) DEFG

46. පළාත් පාලන ආයතනවලට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) ACDE (2) BEFG (3) ACFH (4) FGHI (5) GHIJ

- පහතින් දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ අදාළ කරගෙන අංක **47** හා **48** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පුළුල් අරමුණු සහිතව වර්තමාන ලෝකය තුළ ක්‍රියාත්මක වන විශාල ම අන්තර් ආණ්ඩු සංවිධානය වේ.
B - සීමිත අරමුණු සහිත මැදි මට්ටමේ අන්තර් ආණ්ඩු සංවිධානයක් වේ.
C - සාමාජිකත්වය ස්වාධිපති රාජ්‍යවලට පමණක් සීමා වූ ස්වේච්ඡා සංවිධානයක් වේ.
D - ප්‍රධාන අරමුණ වන්නේ ලෝක සාමය හා සුරක්ෂිතතාව ආරක්ෂා කොට පවත්වාගෙන යාම ය.
E - ලෝකයේ ව්‍යවස්ථාවක් නොමැති එකම අන්තර්ජාතික සංවිධානය වේ.
F - සාමාජික රාජ්‍යයවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ මූලධර්මය මත ක්‍රියාත්මක වේ.
G - යුරෝපා සංගමයේ අනුබද්ධ සංවිධානයක් වේ.
H - සමාජීය හා ආර්ථික ක්ෂේත්‍රයන්හි සාමාජිකයින් අතර සහයෝගය වර්ධනය කිරීම සැලකිලිමත් වන ප්‍රධානතම කරුණ වේ.
I - ප්‍රධාන ව්‍යවස්ථාදායක ආයතනය ආරක්ෂක මණ්ඩලය වන අතර එය මහලේකම්වරයාට වගකීමට බැඳී සිටී.
J - 1945 වර්ෂයේ දී පිහිටුවන ලදී.

47. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) ADFJ (2) BEGH (3) CHIJ (4) ADFH (5) AFGH

48. පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) ABCD (2) BCEH (3) DEFG (4) GHIJ (5) DFGH

- අන්තර්ජාතික යුක්ති අධිකරණයට සහ කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානික කලාපීය සංවිධානයට (SAARC) අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. එම ප්‍රකාශ පදනම් කරගෙන අංක **49** හා **50** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නීතිමය හස්තය වේ.
B - සීමිත අරමුණු සහිත කලාපීය සංවිධානයක් වේ.
C - සාමාජික රාජ්‍ය අතර නීතිමය ප්‍රශ්න සමථ කිරීමේ බලය හිමි වේ.
D - දකුණු ආසියානික රාජ්‍ය අටකින් සමන්විත වේ.
E - 1985 ඩකා ප්‍රකාශනය පදනම් කරගෙන පිහිටුවා ඇත.
F - එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා එහි අනුබද්ධිත ආයතනවලට උපදේශන අදහස් සපයනු ලැබේ.
G - ආරක්ෂක මණ්ඩලය සමග එක්ව මහා මණ්ඩලය විසින් පත් කරන විනිශ්චයකරුවන් නව දෙනෙකුගෙන් සමන්විත වේ.
H - අර්බුදකාරී නොවන සහ දේශපාලන නොවන ක්ෂේත්‍රයන්හි සාමාජික රාජ්‍ය අතර සහයෝගය වර්ධනය කිරීම සැලකිලිමත් වන ප්‍රධානතම කරුණ වේ.
I - යුද්ධ අපරාධ සඳහා වැරදිකරුවන් වන අයට මරණ දඬුවම නියම කිරීමේ බලය හිමි වේ.
J - සංවිධානයේ නායකයා ලෙස සාමාජික රාජ්‍ය විසින් ඉන්දියාව පත් කර ඇත.

49. අන්තර්ජාතික යුක්ති අධිකරණයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) ACEF (2) ABDF (3) BEGH (4) ACFG (5) EHIJ

50. කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානික සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න:
(1) AFIJ (2) BDEJ (3) CFGI (4) DHIJ (5) BDEH

* * *

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2015
க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2015

විෂයය අංකය 23 විෂයය **දේශපාලන විද්‍යාව**

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம் - I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	1	11.	4	21.	1	31.	4	41.	5
02.	5	12.	3	22.	1	32.	1	42.	3
03.	4	13.	2	23.	4	33.	5	43.	2
04.	3	14.	1	24.	2	34.	3	44.	5
05.	2	15.	3	25.	4	35.	3	45.	4
06.	1	16.	5	26.	1	36.	2	46.	3
07.	2	17.	5	27.	5	37.	1	47.	1
08.	3	18.	1	28.	5	38.	4	48.	2
09.	1	19.	2	29.	2	39.	3	49.	4
10.	5	20.	4	30.	2	40	2	50	5

විශේෂ උපදෙස්
விசேட அறிவுறுத்தல்

එක් පිළිතුරකට ලකුණු **02** බැගින්
ஒரு சரியான விடைக்கு புள்ள வீதம் 50

මුළු ලකුණු 2×50 = **100**
மொத்தப் புள்ளிகள்

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்று
General Certificate of Education (Adv. Level) Examination, August 2015

දේශපාලන විද්‍යාව II அரசியல் விஞ்ஞானம் II Political Science II	23 S II	පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours

විභාග අංකය: .....

A කොටස	
මුළු ලකුණු	20

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.
* **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

A කොටස

1. දේශපාලන ක්‍රීඩාව ක්‍රියාවට නංවන මාර්ග **දෙකක්** තිබේ. එම මාර්ග **දෙක** නම් කරන්න.

   (1) .....

   (2) .....

2. කරුණු දෙකක් හේතුවෙන් ග්‍රීක පෞර රාජ්‍යයන් තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක ව ක්‍රියාවට නැංවිය හැකි විය. එම කරුණු **දෙක** නම් කරන්න.

   (1) .....

   (2) .....

3. දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයයක් ලෙස හැඩගැස්වීමට සහ වර්ධනයට ග්‍රීක දේශපාලන දාර්ශනිකයින් දෙදෙනකු ප්‍රබල ලෙස දායක විය. එම **දෙදෙනා** නම් කරන්න.

   (1) .....

   (2) .....

4. (1) පොදු කැමැත්ත සහ (2) නීතියේ ආධිපත්‍යය යන සංකල්ප ක්‍රමවත් ලෙස ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

   (1) .....

   (2) .....

5. (i) "ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවට අයත් ජනතාව විසින් ජනතාව සඳහා ක්‍රියාත්මක වන්නා වූ ආණ්ඩුක්‍රමයක් වේ."

   (ii) "නූතන රාජ්‍යයන්හි විධායකය වූ කලී වෙනත් දෙයක් නොව ධනපති පංතියේ කටයුතු කළමනාකරණය කරන කමිටුව වේ."

   නූතන රාජ්‍යයන්හි ආණ්ඩු සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙක ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

   (1) .....

   (2) .....

Alevel ඇප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

6. (i) "විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව දුරස්ථ වේ."

(ii) "විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාව බෙහෙවින් ම සමීප වන අතර එම හේතුවෙන් ආයතන දෙක අතර පවතින්නේ අන්‍යෝන්‍ය රඳා පැවැත්මකි."

ඉහත දක්වා ඇති විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා දැකිය හැකි ආණ්ඩුක්‍රම **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) .....

(2) .....

7. (i) "දේශපාලන බලය අල්ලා ගැනීම ප්‍රධාන අරමුණ වේ."

(ii) "දේශපාලන බලය හසුරුවන අයට බලපෑම් කිරීම මගින් පෞද්ගලික ආශා වර්ධනය කර ගැනීම සැලකිලිමත් වන ප්‍රධාන කරුණ වේ."

ඉහත දක්වා ඇති ප්‍රකාශ දෙකට අදාළ වන සංවිධාන වර්ග **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) .....

(2) .....

8. (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ නිලකාලය සහ එක් පුද්ගලයකුට ජනාධිපති තනතුරට තේරී පත්විය හැකි වාර ගණන කොපමණ ද?

(ii) ප්‍රංශ ජනාධිපතිවරයාගේ නිලකාලය හා එක් පුද්ගලයකුට ජනාධිපති තනතුර දැරිය හැකි වාර ගණන කොපමණ ද?

(1) .....

(2) .....

9. (i) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි දේශපාලන විධායකය නම් කරන්න.

(ii) බ්‍රිතාන්‍යයේ අධිකරණ ව්‍යුහය තුළ ඉහළ ම අධිකරණය නම් කරන්න.

(1) .....

(2) .....

10. (i) ස්විට්සර්ලන්තයේ සන්ධිය මණ්ඩලයේ (Federal Council) සංයුතිය සහ එම මණ්ඩලයේ සාමාජිකයින් පත්වන ආකාරය දක්වන්න.

(ii) ඉන්දියාවේ මධ්‍ය ආණ්ඩුවේ රාජ්‍ය සභාව නමින් හැඳින්වෙන දෙවන මණ්ඩලය සමන්විත වන්නේ මන්ත්‍රීවරුන් දෙවර්ගයකිනි. එම මන්ත්‍රීවරුන් **දෙවර්ගය** නම් කරන්න.

(1) .....

(2) .....

11. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන ක්‍රමය යටතේ වාර්ගික නියෝජන ක්‍රමය හඳුන්වා දුන් සහ එම නියෝජන ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(1) .....

(2) .....

12. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඉතිහාසය තුළ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් සහ සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ **දෙක** පිළිවෙළින් දක්වන්න.

(1) .....

(2) .....

13. (i) බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයෙන් නිදහස ලබා ගැනීමේ ව්‍යාපාරය දියත් කිරීම සඳහා ලාංකිකයින් විසින් පිහිටුවන ලද ප්‍රථම ජාතික සංවිධානය කුමක් ද?

(ii) ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය නම් කොට එය ආරම්භ කළ වර්ෂය දක්වන්න.

(1) .....

(2) .....

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

14. (i) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව දක්වන්න.

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍යවරුන් පත් කිරීමේ බලය හිමි වූයේ කාට ද?

(1) .....

(2) .....

15. (i) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ ලංකා නියෝජිතයා හැඳින්වූ නිලනාමය කුමක් ද?

(ii) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රැජිනගේ නියෝජිතයා එම තනතුරට පත් කළ ආකාරය දක්වන්න.

(1) .....

(2) .....

16. (i) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය පත් කළ ආකාරය දක්වන්න.

(ii) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ නිලකාලය කොපමණ ද?

(1) .....

(2) .....

17. (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායකය සමන්විත වන්නේ කොටස් දෙකකිනි. එම කොටස් **දෙක** නම් කරන්න.

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ දේශපාලන විධායකයේ එක් කොටසක් පාර්ලිමේන්තුව තුළ සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මඟින් නිලයෙන් ඉවත් කළ හැකි ය. එම කොටස නම් කරන්න.

(1) .....

(2) .....

18. (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා ස්ථාපිත කරනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ කුමන වර්ෂයේ දී ද?

(ii) පළාත් සභාවල ප්‍රධාන විධායකය තනතුර නම් කරන්න.

(1) .....

(2) .....

19. (1) එක්සත් ජාතික පක්ෂය සහ (2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැඟීමේ දී පදනම් කර ගත් දේශපාලන හා ආර්ථික මතවාද නම් කරන්න.

(1) .....

(2) .....

20. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (1) ප්‍රධාන විධායක නිලධාරියා සහ (2) ප්‍රධාන සාකච්ඡා මණ්ඩලය නම් කරන්න.

(1) .....

(2) .....

Alevel ඇස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

23 දේශපාලන විද්‍යාව II

A කොටස

ප්‍රශ්න අංක 01

1. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග
2. විප්ලවකාරී ක්‍රියාමාර්ග/ප්‍රජාතන්ත්‍රවාදී නොවන

ප්‍රශ්න අංක 02

1. රාජ්‍යයේ භූමි ප්‍රමාණය කුඩාවීම
2. දේශපාලන බලය පුරවැසියන්ට පමණක් හිමිවීම.

ප්‍රශ්න අංක 03

1. ප්ලේටෝ
2. ඇරිස්ටෝටල්

ප්‍රශ්න අංක 04

1. ජීන් ජැක්විස් රූසෝ
2. ඒ.වී.ඩයිසි

ප්‍රශ්න අංක 05

1. ඒබ්‍රහම් ලින්කන් - 1863 නොවැම්බර් 19 දින ගෙට්ස්බර්ග් දේශනයේදී
2. කාල් මාක්ස් -1848 කොමියුනිස්ට් ප්‍රකාශනය

ප්‍රශ්න අංක 06

1. කැබිනට් ආණ්ඩුක්‍රමය
2. ජනාධිපති ආණ්ඩුක්‍රමය

ප්‍රශ්න අංක 07

1. දේශපාලන පක්ෂ
2. බලපෑම් කණ්ඩායම්

ප්‍රශ්න අංක 08

1. අවුරුදු 04 - වාර 02
2. අවුරුදු 05 - වාර 02

ප්‍රශ්න අංක 09

1. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
2. ශ්‍රේෂ්ඨාධිකරණය

ප්‍රශ්න අංක 10

1. සාමාජික සංඛ්‍යා 07 - පෙඩරල් ව්‍යවස්ථාදායකය විසින්
2. ජනාධිපති විසින් නාමකරණයෙන් 12, ප්‍රාන්ත රාජ්‍යන් විසින් 238 ක්.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රශ්න අංක 11

1. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය
2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

ප්‍රශ්න අංක 12

1. 1911 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය
2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

ප්‍රශ්න අංක 13

1. ලංකා ජාතික සංගමය
2. ලංකා සම සමාජ පක්ෂය 1935

ප්‍රශ්න අංක 14

1. ලාංකික අමාත්‍යවරුන් 07 රාජ්‍ය නිලධාරීන් 03
2. ආණ්ඩුකාරවරයා

ප්‍රශ්න අංක 15

1. අග්‍රාණ්ඩුකාරවරයා
2. අගමැතිගේ නිර්දේශ මහ බ්‍රිතාන්‍ය කිරීටය විසින්

ප්‍රශ්න අංක 16

1. අගමැති විසින්
2. අවුරුදු 04

ප්‍රශ්න අංක 17

1. ජනාධිපති සහ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
2. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය

ප්‍රශ්න අංක 18

1. 13 වන ව්‍යවස්ථා සංශෝධනය 1987
2. ආණ්ඩුකාරවරයා

ප්‍රශ්න අංක 19

1. ධනවාදය හා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය
2. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

ප්‍රශ්න අංක 20

1. මහ ලේකම්වරයා
2. මහාමණ්ඩලය

Alevel ඇප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

B කොටස

ප්‍රශ්න අංක 01
ඔබ ප්‍රායෝගික දේශපාලනයෙන් න්‍යායාත්මනක දේශපාලනය වෙන්කර ගන්නේ කෙසේද?

ප්‍රශ්නයේ අරමුණ:
දේශපාලනය හා දේශපාලන විද්‍යාව යන ක්ෂේත්‍ර දෙක අතර පවතින වෙනස අපේක්ෂකයින් අවබෝධ කරගෙන තිබෙනවාද යන්න පරීක්ෂා කර බැලීම.

පිළිතුර තුළ අඩංගු විය යුතු මූලික කරුණු

(අ) **ප්‍රවේශය**

- දේශපාලනය වූ කළී මිනිසුන්, රාජ්‍ය, ආණ්ඩුව සහ දේශපාලන බලය යන විචල්‍යයන් සතර අතර ඇතිවන අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය ලෙස හඳුනාගත හැක.
- මෙම ක්‍රියාකාරීත්වය ප්‍රායෝගික දේශපාලනය සහ න්‍යායාත්මක දේශපාලනය යනුවෙන් කොටස් දෙකකට බෙදා වෙන් කෙරේ.
- දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ දේශපාලන වශයෙන් මිනිසුන් හැසිරෙන ආකාරය, එම හැසිරීම රාජ්‍ය, ආණ්ඩුව හා දේශපාලන බලය යන විචල්‍යයන් තුන සමඟ සම්බන්ධ වන ආකාරය ප්‍රායෝගික දේශපාලනයෙන් නිරූපනය වේ.
- අනෙක් අතට මිනිසුන්, රාජ්‍ය, ආණ්ඩුව සහ දේශපාලන බලය යන විචල්‍යයන් ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද? එසේ ක්‍රියාත්මක වීම තුළින් අයත් කරගැනීමට අපේක්ෂා කරන ප්‍රතිඵල වඩාත් හොඳින් අයත් කර ගන්නේ කෙසේද? යන්න න්‍යායාත්මක දේශපාලනයෙන් පෙන්වා දේ. **(ලකුණු 03 යි)**

(ආ) **ප්‍රායෝගික දේශපාලනයේ ස්වභාවය**

- ප්‍රායෝගික දේශපාලනය වූ කලී දේශපාලනය වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ සියළුම මිනිසුන්ගේ සහභාගීත්වයෙන් කෙරෙන ක්‍රීඩාවක් වේ.
- මෙම ක්‍රීඩාව හඳුන්වන්නේ බලය සඳහා කෙරෙන අරගලය ලෙසය. බල අරගලය මූලික අරමුණු තුනකින් සමන්විත වේ. එනම් බලය අල්ලා ගැනීම, බලය තහවුරු කර ගැනීම සහ බලය ව්‍යාප්ත කර ගැනීමය. මෙම බල අරගලය දේශීය හා අන්තර්ජාතික වශයෙන් ස්වරූප දෙකකින් හඳුනා ගත හැක. දේශීය දේශපාලනය තුළ ප්‍රධාන රැගුම්කරුවන් වන්නේ දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂයන්ය. අන්තර්ජාතික දේශපාලන තුළ ප්‍රධාන රැගුම්කරුවන් වන්නේ නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්ය. බල අරගලය ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට මෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයට ද ක්‍රියාවට නැංවේ.
- දේශපාලනය උත්පාදනය වීම කෙරෙහි බලපාන මූලාශ්‍ර දෙකක් හඳුනාගත හැක.
  - I. දේශපාලන, ආර්ථික හා සමාජ කරුණු, ප්‍රශ්න හා ගැටළු විසඳීම සම්බන්ධයෙන් පිළිගත් එක් මතයක් නොතිබීම.
  - II. තමන් විශ්වාස කරන මතවාදය ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍ය බලය අල්ලා ගැනීමට පුද්ගලයින් හා පුද්ගල කණ්ඩායම් ක්‍රියා කිරීම.
- මේ අනුව පෙනී යන දෙය වන්නේ දේශපාලනය වූ කලී දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ අතර එකිනෙකට වෙනස් පරස්පර අදහස් උදහස් හා මතවාද තිබෙන විට ඒවා අන්‍යොන්‍ය වශයෙන් ගැටීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන දෙයක් වන බවය. මෙයින් පෙනී යන අනෙක් කරුණ වන්නේ ප්‍රතිවිරුද්ධ තත්වයන් නොපවතින තැනක දේශපාලනය පැවතිය නොහැකි බවය.
- මෙයින් එළඹිය හැකි නිගමනය වන්නේ ප්‍රායෝගික දේශපාලනය ප්‍රත්‍යක්ෂක මූලික සාධක පදනම් කරගෙන ක්‍රියාත්මක වන කලාවක් වන බවය. දේශපාලන බල අරගලයෙන් පෙන්නුම් කරන්නේ බල අරගලයේ නියුක්ත පාර්ශවකරුවන් තම අරමුණු වෙනුවෙන් ජනතාවට බලපෑම් කිරීම සහ ජනතාව පෙළඹවීම සඳහා ක්‍රියාකරන ආකාරයයි.

(ලකුණු 07 යි)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ඇ) **න්‍යායාත්මක දේශපාලනය**

- ප්‍රායෝගික දේශපාලනයේ න්‍යායාත්මක පැත්ත පෙන්නුම් කරන්නේ න්‍යායාත්මක දේශපාලනය මඟිනි. න්‍යායාත්මක දේශපාලනයේ මූලික අරමුණ වන්නේ දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ ජීවත්වන මිනිසුන්ගේ පොදු යහපත වඩාත්ම ප්‍රශස්ත මට්ටමින් දේශපාලනය හරහා ඉටුකර ගන්නේ කෙසේදැයන්න සොයා බැලීමය.

- මේ අනුව න්‍යායාත්මක දේශපාලනය වඩාත්ම සැළකිලිමත් වන කරුණු වන්නේ ජනතාවගේ පොදු යහපත උපරිම කිරීම සඳහා සුදුසු:
  - I. වඩාත්ම හොඳ රාජ්‍ය ක්‍රමය හා ආණ්ඩුක්‍රමය කුමක්ද?
  - II. කුමන මූලධර්ම හා න්‍යායන් පදනම් කරගෙන එම දේශපාලන ආයතන සංවිධානය කළ යුතුද?
  - III. දේශපාලන බල අරගලය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී අයුරින් ක්‍රියාවට නංවන්නේ කෙසේද? සහ ඒ සඳහා ජනතාව, දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ ක්‍රියා කළ යුත්තේ කෙසේද?
  - IV. ජනතා ශුභසිද්ධිය ගොඩනැගීම සඳහා වඩාත්ම සුදුසු දේශපාලන , ආර්ථික හා සමාජ මූලධර්ම මොනවාද? නැතිනම් මතවාද මොනවාද යන කරුණු පිළිබඳවය.

- මේ අනුව න්‍යායාත්මක දේශපාලනයේදී විදහත් වන්නේ දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ නොව දේශපාලන දාර්ශකයින්, දේශපාලන චින්තකයින්, දේශපාලන විද්‍යාඥයින් සහ ඔවුන් ඉදිරිපත් කර තිබෙන න්‍යායන්, මූලධර්ම හා මතවාදයන්ය. මෙම අදහස් කොටස් හතරකින් සමන්විත වේ.
  - I. දේශපාලන න්‍යාය Political Theory
  - II. දේශපාලන චින්තනය Political Thought
  - III. දේශපාලන දර්ශනය Political Philosophy
  - IV. දේශපාලන මතවාද Political Ideology

- අවසාන වශයෙන් කිවහැක්කේ න්‍යායාත්මක දේශපාලනය ගොඩනැගී තිබෙන්නේ රාජ්‍ය, ආණ්ඩුව, දේශපාලන බලය හා දේශපලාන ක්‍රියාදාමය එනම් බල අරගලය ක්‍රියාවට නැංවෙන ආකාරය යන කරුණු අධ්‍යායනය කිරීම පදනම් කොටගෙන් බවය.

(ලකුණු 07 යි)

(ඇ) **නිගමනය**

- දේශපාලනය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවෙන ආකාරය ප්‍රායෝගික දේශපාලනයෙන් පෙන්නුම් කරන අතර එසේ ප්‍රායෝගික ක්‍රියාවට නැංවීමේදී අදාළ වන න්‍යායන් හා සිද්ධාන්ත පෙන්වා දෙන්නේ න්‍යායාත්මක දේශපාලනය මඟිනි.

- නමුත් නිරන්තරයෙන්ම දැකිය හැකි දෙය වන්නේ ප්‍රායෝගික දේශපාලනය හා න්‍යායාත්මක දේශපාලනය එකට ගමන් නොකරන බවය. න්‍යාය හා භාවිතය අතර බොහෝවිට දැකිය හැක්කේ සහසම්බන්ධතාවක් නොව පරස්පරතාවයක්ය. මෙයට හේතු වන්නේ මිනිසුන්, රාජ්‍ය, ආණ්ඩුව සහ දේශපාලන බලය යන විචල්‍යයන් හැසිරිය යුතු ආකාරය හා ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව සාමාන්‍ය මිනිසුන් සහ දේශපාලන විද්‍යාඥයින් සිතන ආකාරය හා තේරුම් ගන්නා ආකාරය අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් වීමය.

- දේශපාලනය සියළුම දෙනා සහභාගී වී කෙරෙන ක්‍රීඩාවක් වුවද එයට සහභාගී වන බොහෝ දෙනා එම ක්‍රීඩාව කරන්නේ ක්‍රීඩාවේ සැබෑ කියමයන් හා නීතිරීති ගැන දැනීමක් නොමැතිවය.

- මේ හේතුවෙන් න්‍යාය හා භාවිතය පිළිබඳව අතිශය පුළුල් පරස්පරතාවක් දේශපාලනය තුළ නිරන්තරවම දැකිය හැකිවේ. මෙම හේතුවෙනුයි ප්‍රායෝගික දේශපාලනය හා න්‍යායාත්මක දේශපාලනය යනුවෙන් ක්ෂේත්‍ර දෙකක් ඉස්මතු වී තිබෙන්නේ.

- මේවාට අමතරව දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අයත් කරුණු පිළිබඳව ඉදිරිපත්වී ඇති න්‍යායන් හා මතවාදයන්ද මෙයට අයත්වේ.

(ලකුණු 03 යි)

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රශ්න අංක 02

පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් විභාග කරන්න.

(I) බලතල බෙදීමේ න්‍යාය හා භාවිතය

(II) නීතියේ ආධිපත්‍යය

(III) ව්‍යවස්ථානුකූලවාදය

(IV) අධිකරණ විවරණ බලය

I. බලතල බෙදීමේ න්‍යාය හා භාවිතය

අරමුණ

බලතල බෙදීමේ න්‍යායේ සංකල්පිය පදනම, ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ උපකරණයක් ලෙස එහි ඇති ප්‍රයෝජනය, භාවිතයට ගැනීමේදී පවතින සීමාවන් යනාදිය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම

ප්‍රවේශය

- ආණ්ඩුවේ බලය සංවරණය කිරීමකින් හා පාලනය කිරීමකින් තොරව එක පුද්ගලයෙකු අත ඒකරාශි වීමට ඉඩහැරියහොත් එහිදී නිසැක ලෙසට අත්තනෝමතික හා ආඥාදායක පාලනයක් ඇතිවීම වැළැක්විය නොහැක.
- ඇක්ටන් ආම්වරයා ප්‍රකාශ කළ ආකාරයට "බලය මගින් මිනිසා දූෂණය වේ. අධික බලය මගින් අධික ලෙස මිනිසා දූෂණය වේ."
- බලය ඒකරාශි වීම හේතුවෙන් ඇතිවිය හැකි ආණ්ඩු අත්තනෝමතිකභාවය වලක්වාලීම සඳහා ඉදිරිපත් වී ඇති ඉතාම හොඳ සංරෝධකයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය පෙන්වා දිය හැක. (ලකුණු 01)

බලතල බෙදීමේ න්‍යායාත්මක පදනම

- ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ වශයෙන් කොටස් කර අනොන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධයක් නොමැති පුද්ගලයන් හෝ ආණ්ඩු මගින් ක්‍රියාවට නැංවීම මගින් ආණ්ඩුව ආඥාදායක වීම වළක්වා ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය යහතික කරමින් මිනිස් නිදහස ආරක්ෂා කළ හැකි බව බලතල බෙදීමේ න්‍යාය මගින් අවධාරණය කෙරේ.
- න්‍යාය ඉදිරිපත් කළේ ප්‍රංශ ජාතික දේශපාලන විද්‍යාඥයෙකු වූ මොන්ටෙස්කියු විසින් 1748 දී ප්‍රකාශයට පත්කළ The Spirit of Laws යන කෘතිය තුළිනි. මොන්ටෙස්කියු ප්‍රකාශ කරන ආකාරයට, "නිරන්තර අත්දැකීම් මගින් අපට පෙන්වාදෙන්නේ යම් පුද්ගලයෙකු අත බලය ඒකරාශි වේද නිසැක ලෙසම එම පුද්ගලයා බලය අයථා ලෙස භාවිතා කිරීමට පෙළැඹේ. එයාකාරව තවත් බලයක් මගින් එම බලයට සීමා පනවන තුරු එම පුද්ගලයා බලය අයථා ලෙස ක්‍රියාවට නැංවීම නතර නොකරනු ඇත. එබැවින් බලය මර්ධනය කිරීම බලය මගින්ම කළ යුතුය."
- මෙයින් පෙනී යන්නේ අධිකාරී බලය ක්‍රියාවට නංවන ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය සීමාවන්ට යටත් නොකළහොත් එහිදී හිතුවක්කාරී, අත්තනෝමතික හා ආඥාදායක පාලනයක් ඇතිවිය හැකි බවය. මෙම තත්වය වළක්වා ගත හැක්කේ ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ වශයෙන් කෙටස් කර ක්‍රියාවට නැංවීමෙන් පමණක් බව මොන්ටෙස්කියු කියා සිටී.
- ආණ්ඩුවේ බලයට සංරෝධකයක් ලෙස බලතල බෙදීම කාර්යක්ෂමව යොදා ගැනීමට නම් එය සංවරණ හා තුලන ක්‍රමයක් සමග බද්ධ කළ යුතුබව මොන්ටෙස්කියුගේ අදහස වේ. මෙයින් කරුණු දෙකක් අදහස් වේ.
  - i. බලය බෙදා වෙන් කළද එය තනිව හා ස්වාධීනව එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් ක්‍රියාවට නොනැංවිය යුතු බව
  - ii. එක් ආයතනයක් හෝ පුද්ගලයෙකු තම බල සීමාතුය ඉක්මවන විට අනෙක් ආයතන දෙක එයට එරෙහිව නැගී සිට එම පුද්ගලයා හෝ ආයතනය පාලනය කරමින් තුලනය කිරීම

(ලකුණු 06)

න්‍යායේ භාවිතාව

- න්‍යාය ප්‍රථමයෙන්ම භාවිතයට ගත්තේ 1789 දී ඇමෙරිකානු ව්‍යවස්ථාව සම්පාදනයේදීය.
- ඉන් අනතුරුව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කළ සෑම රටක්ම න්‍යාය අඩුවැඩි වශයෙන් භාවිතයට ගෙන ඇත.
- භාවිතයේදී පැන නගින ප්‍රධාන ගැටළුව වන්නේ මොන්ටෙස්කියු දක්වන ආකාරයටම ශුද්ධ බල බෙදීමක් කළ නොහැකි වීමය. එසේ කළහොත් ආණ්ඩුක්‍රම ආයතන හුදකලා වී ආණ්ඩු ක්‍රම අකාර්යක්ෂම විය හැකි බවට අදහස් ප්‍රකාශ වී ඇත.

(ලකුණු 02)

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය

- කුමන අඩුපාඩු තිබුණද ආඥාදායක පාලනයකින් ජනතාව බේරාගෙන ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා භාවිතයට ගතහැකි ඉතාම හොඳ උදාහරණයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය සැළකේ.

(ලකුණු 01)

II. නීතියේ ආධිපත්‍යවය

අරමුණ

න්‍යායේ සංකල්පීය පදනම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේදී එහි ඇති වැදගත්කම පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම

ප්‍රවේශය

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍යම කොන්දේසියක් ලෙස සලකන්නේ නීතියට අනුව පාලනය කිරීමයි. මේ පිළිබඳව අවධාරණය කරන සංකල්පය ලෙස නීතියේ ආධිපත්‍යවය හඳුන්වාදිය හැක.

(ලකුණු 01)

අන්තර්ගත විය යුතු මූලික කරුණු

- නීතියේ ආධිපත්‍යවය සංකල්පය ඉදිරිපත් කළේ 1885 වර්ෂයේදී බ්‍රිතාන්‍ය ජාතික නීතිඥයෙකු වූ ඒ. වී. ඩයිසි විසින් ප්‍රකාශයට පත්කළ Law of Constitution යන කෘතිය තුළිනි.

- ඩයිසි නීතියේ ආධිපතත්වය හා සම්බන්ධ මූලික කරුණු තුනක් පෙන්වා දේ.
  - i. රාජ්‍ය පාලනයේදී සාමාන්‍ය නීතිය උත්තරිතර වීම
  - ii. නීතිය ඉදිරියේ සියලු දෙනාම එකසමාන වීම සහ නීතියේ සමාන ආරක්ෂාව සියළුදෙනාට එක හා සමානව හිමිවීම
  - iii. පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කොට පවත්වා ගෙන යාම
- සංකල්පයේ හරය වන්නේ ආණ්ඩුකරණය නීතියට අනුව පවත්වාගෙන යාමය. මේ අනුව පාලකයා මෙන්ම පාලිතයාද නීතියට යටත්වන අතර නීතිය ඉදිරියේ සමාන වේ. නීතියට ඉහලින් කිසිවෙකු නොමැත. නීතිය ඉදිරියේ කිසිවෙකුට විශේෂ වරප්‍රසාද හිමි නොවේ.
- ඩයිසිට අනුව රටක් තුළ තිබිය යුත්තේ එක් පොදු නීති ක්‍රමයක් පමණි. මෙයින් අදහස් කරන්නේ ව්‍යවස්ථානුකූල නීතිය, එය පදනම් කරගෙන ව්‍යවස්ථාදායකය විසින් පනවන නීති යහ අධිකරණ තීන්දු යන කොටස් තුනේ එකතුවයි.
- දඬුවම් කළ හැක්කේ පොදු නීතිය කඩ කළහොත් පමණි. විනිශ්චය කළ යුත්තේ රටේ පවතින සාමාන්‍ය උසාවි විසින් ඒ අවස්ථාවේ පවතින නීතිය පදනම් කරගෙනය. දිය යුත්තේ නීතියෙන් නියම කර ඇති දඬුවම් පමණි. යම් අපරාධයක් විනිශ්චය කිරීමට අළුතින් නීති පැනවීමට සහ අළුතින් උසාවි පිහිටුවිය නොහැක.
- පුරවැසි අයිතිවාසිකම් නීතියෙන් හිමිවූ දේවල් නොවන බවද නීති මගින් කළ යුත්තේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම බවද එමගින් අවධාරණය කෙරේ.

(ලකුණු 08)

නිගමනය

- ඩයිසි මතය විවිධාකාරයෙන් විවේචනයට ලක්වුවද ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අත්‍යවශ්‍යම දෙයක් ලෙස නීතියේ ආධිපත්‍යවය පොදුවේ පිළිගනු ලැබේ.

(ලකුණු 01)

III. ව්‍යවස්ථානුකූලවාදය

අරමුණ

ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද සහ ආණ්ඩු බලය සංවරණය කිරීමේ උපකරණයක් හැටියට ව්‍යවස්ථානුකූලවාදයේ ඇති ප්‍රයෝජනවත්භාවය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම

ප්‍රවේශය

- ආණ්ඩු විසින් රාජ්‍ය බලය අයථා ලෙස ක්‍රියාවට නැංවීම හා එයින් ජනතාව පීඩාවට ලක්වීම නූතනයේ දේශපාලන ක්ෂේත්‍රය තුළ බෙහෙවින්ම සාකච්ඡාවට භාජනය වන කරුණක් වේ. මෙම තත්වය වළක්වාලීම සඳහා භාවිතයට ගත හැකි තවත් සංවරණයක් ලෙස සළකන්නේ ව්‍යවස්ථානුකූලවාදයයි. ව්‍යවස්ථානුකූලවාදය ක්‍රියාත්මක වන රටක අත්තනෝමතික පාලනයකට ඉඩක් නොමැති බව පොදු පිළිගැනීම වේ.

(ලකුණු 02)

ව්‍යවස්ථානුකූලවාදයේ අන්තර්ගතය

- සම්ප්‍රදායික මතය අනුව අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන ආණ්ඩුකරණය ක්‍රියාවට නැංවීමය. එහිදී ව්‍යවස්ථානුකූල නීතිය උත්තරිතර වන අතර එම හේතුවෙන් ආණ්ඩුක්‍රමය තුළ නීතියේ ආධිපත්‍යවය ක්‍රියාත්මක වේ. මේ අනුව ප්‍රජාතාන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සඳහා නීතියේ ආධිපත්‍යවය අත්‍යවශ්‍යම කොන්දේසියක් ලෙස පිළිගනී.
- ව්‍යවස්ථානුකූලවාදය මගින් රටට දේශපාලන ස්ථාවරභාවය සපයනු ලැබේ. විප්ලව හෝ කැරලි කෝලාහල වලින් තොරව දේශපාලන බලය මාරු කිරීමට හැකි වේ. තමන් කැමති පාලකයින් තෝරා ගැනීමට ජනතාවට නිදහස් හිමිකම හිමිවේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- නූතන මතය අනුව ව්‍යවස්ථානුකූලවාදය සම්බන්ධයෙන් ඉහත අදහස් පිළිගනු ලැබුවද, ව්‍යවසථාවක් තිබූ පමණින්ම ව්‍යවස්ථානුකූලවාදය ගොඩනැගෙන බව පිළි නොගනී. නූතන මතයෙන් අවධාරණය කරන ආකාරයට ව්‍යවස්ථාවක් තිබීම පමණක් නොව එයට ගරු කිරීම මගින් ගොඩනැගෙන ව්‍යවස්ථානුකූල භක්තිය යහපත් ව්‍යවස්ථානුකූලවාදයක් පැවතීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස පිළිගනී. මේ අනුව පාලකයන් මෙන්ම පාලිතයන්ද එක ලෙස ව්‍යවස්ථාවට ගරු කරමින් එය ජුජනීයතවයේ ලා සැළකිය යුතුය. සැබවින්ම එය ආගමක් මෙන් අදහන තත්වයකට පත්කළ යුතුය. එවැනි තත්වයක් තුළ ව්‍යවස්ථාව ජනතාවගේ උත්තරිතර ආරක්ෂකයා හා නියාමකයා බවට පත්වේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ව්‍යවස්ථානුකූලවාදය බිහිවීමට නම්;
  - අ. කාලීන අවශ්‍යතාවන්ට අනුව වෙනස්වෙමින් ජනතාව සමග එය ඉදිරියට යා යුතුය
  - ආ. ජනතා හිතකාමී ආණ්ඩුක්‍රමයක් ඉදිරිපත් කළ යුතුය
  - ඇ. පොදු දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයක් ඉදිරිපත් කළ යුතුය

(ලකුණු 06)

නිගමනය

- ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය සඳහා ව්‍යවස්ථානුකූලවාදය පැවතිම අවශ්‍යම වුවද, ශක්තිමත් ව්‍යවස්ථානුකූලවාදයක් ගොඩනගා ගැනීම පහසු දෙයක් නොවේ.
- එයට හේතුවන්නේ;
  - අ. ව්‍යවස්ථාව නොසළකා හරිමින් කටයුතු කිරීමට පාලකයන් සමහරවිට පෙළැඹීම
  - ආ. ව්‍යවස්ථාවන්ට තිබෙන අපූර්ණතාවන්
  - ඇ.විශේෂිත අවශ්‍යතාවන් අනුව ව්‍යවස්ථා වෙනස් කිරීමට අපහසු වීම

(ලකුණු 02)

අධිකරණ විවරණ බලය

අරමුණ

- ආණ්ඩුව හිතුවක්කාරී ලෙස හා අත්තනෝමතික ලෙස බලය භාවිතයට ගැනීම වළක්වාලමින් ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනය පවත්වාගෙන යාමේ ආධාරක උපකරණයක් ලෙස අධිකරණ විවරණ බලයේ ඇති ප්‍රයෝජනවත්භාවය පිළිබඳඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම

ප්‍රවේශය

- ව්‍යවස්ථාදායකය විසින් කරන නිති පැනවීම සහ විධායකය විසින් කරනු ලබන විධායක ක්‍රියාවන් රටේ මූලික නීතියට නැතිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියට ගැලපෙනවාද යන්න විමර්ශනය කොට නොගැලපෙනවා නම් එම නීති හෝ විධායක ක්‍රියා බලාත්මක වීම නතර කිරීමට අධිකරණයට ඇති බලය අධිකරණ විවරණ බලය ලෙස සැළකේ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සාර්ථක වීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු තවත් කොන්දේසියක් ලෙස අධිකරණ විවරණ බලය සැළකේ.

(ලකුණු 02)

අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු

- මීට ඉහතින්ද දැක්වූ පරිදි අධිකරණ විවරණ බලය යනු ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ ක්‍රියාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන්නේ නම් ඒවා බලාත්මක වීම වැළැක්වීමට අධිකරණයට ඇති බලයයි.
- මෙය ක්‍රම දෙකකට ක්‍රියාත්මක වේ.
  - අ. පනත් කෙටුම්පත් අවස්ථාවේදී ඒ පිළිබඳව අධිකරණය විසින් විමර්ශනය කිරීම මෙය පූර්ව අධිකරණ විනිශ්චය බලය ලෙස හඳුන්වනු ලැබේ. නිද. ලංකාව
  - ආ. පනත් නීති බවට පත්වූ අවස්ථාවේදී හා විධායකය විසින් කරනු ලබන ක්‍රියාවන්. මෙය පශ්චාත් අධිකරණ විවරණ බලය ලෙස හැඳින්වේ. නිද ඇමෙරිකාව, ඉන්දියාව
- අධිකරණ විවරණ බලය ලොවට හඳුන්වා දුන්නේ ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1803 දී ප්‍රකාශයට පත් කළ මාර්බරි එරෙහිව මැඩිසන් නඩු තීන්දුවෙනි. අනතුරුව මෙය ප්‍රජාතන්ත්‍ර ආණ්ඩුකරණයේ මූලික සිද්ධාන්තයක් බවට පත්වේ.
- විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ අන්තනෝමතික හා හිතුවක්කාරී ක්‍රියාවන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුදවාගෙන ව්‍යවස්ථානුකූල පාලනය පවත්වාගෙන යාම සඳහා බෙහෙවින්ම උපකාරවන උපකරණයක් ලෙස අධිකරණ විවරණ බලය පිලිගනී.

(ලකුණු 06)

නිගමනය

- ජනතාව නියෝජනය කරන ජනතාව වෙනුවෙන් වැඩ කරන විධායකයේ හා ව්‍යවස්ථාදායකයේ නිදහස් ක්‍රියාකාරිත්වයට අධිකරණ විවරණ බලය දැඩි බාධකයක් වන බවට චෝදනා එල්ල වී ඇත.
- එසේවුවද, ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනය සඳහා අධිකරණ විවරණ බලය අවශ්‍යම දෙයක් බව පිළිගනී.

(ලකුණු 02)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රශ්න අංක 03

පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දේශපාලන පක්ෂවල කාර්යයභාරය

(ii) බලපෑම් කණ්ඩායම්වල කාර්යභාරය

(iii) මහජන මතයේ භූමිකාව

(iv) දේශපාලන සමාජානුයෝජනයේ කාරක

(v) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන්හි සිවිල් සමාජයේ භූමිකාව

(ලකුණු 10 X 2=**20** යි)

(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ දේශපාලන පක්ෂවල කාර්යයභාරය

ප්‍රවේශය

"දේශපාලන පක්ෂ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අපූර්වතම සොයාගැනීමට". වශයෙන් හඳුන්වනු ලැබේ. මක්නිසාද යත් නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන පක්ෂ අත්‍යවශ්‍ය වන බැවිනි. එනම් දේශපාලන පක්ෂ නොමැතිව නූතන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ නොහැකි වේ. නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි දේශපාලන පක්ෂ විසින් ඉටුකරනු ලබන කාර්යයභාරය අතිශයින් පුළුල් වේ. එකී කාර්යයන් පහත සඳහන් පරිදි වේ. (ලකුණු 01 යි)

දේශපාලන පක්ෂ වල කාර්යභාරය

- **මහජනතාව හා ආණ්ඩුව අතර සම්බන්ධතා ඇති කිරීම**

  නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි මහජනතාව හා ආණ්ඩුව අතර සම්බන්ධතාව ඇතිකරන පුරුක ලෙස දේශපාලන පක්ෂ හඳුන්වයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන සංකල්පය අනුව රාජ්‍ය බලය මහජනතාවට හිමිවන අතර මහජනතාවට හිමිවන දේශපාලන බලය අධිකාරී බලය බවට පරිවර්තනය කිරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ ආණ්ඩුව විසිනි. මේ සඳහා මහජනතාව සහ ආණ්ඩුව එකට නොකරන්නේ දේශපාලන පක්ෂ විසිනි.

- **ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම**

  ප්‍රායෝගික වශයෙන් ගත් කළ ආණ්ඩුව හෙවත් විධායකය දේශපාලන පක්ෂ නායකත්වයෙන් සමන්විත වන බැවින් මෙන්ම ව්‍යවස්ථාදායකය දේශපාලන පක්ෂ නියෝජිතයින්ගෙන් සමන්විත වන බැවින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දේශපාලන පක්ෂ මූලික වශයෙන් දායක වේ. එසේ සම්පාදනය කරන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම විධායකය වෙත පැවරී ඇති හෙයින් අවසාන විග්‍රහයේ දී රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යය ද දේශපාලන පක්ෂ විසින් සිදුකරනු ලැබේ. බලයට පත්වන ආණ්ඩුවක් විසින් ක්‍රියාවට නංවන්නේ මැතිවරණයේදී දේශපාලන පක්ෂ ජනතාවට ඉදිරිපත් කරන ලද පොරොන්දුය. මෙම පොරොන්දු රාජ්‍ය ප්‍රතිපත්ති බවට පරිවර්ථනය කරන්නේ ආණ්ඩුබලය මෙහෙයවන දේශපාලන පක්ෂය විසිනි.

- **මහජන මතය සංවිධාන කිරීම**

  නූතන දේශපාලන ක්‍රමයන් හි විසිරී ඇති මහජන මතය එක්තැන් කිරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ දේශපාලන පක්ෂ විසිනි. එය කල හැකි වන්නේ දේශපාලන පක්ෂවලට නිශ්චිත ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලක් තිබෙන බැවිනි. මේ ආකාරයට ඒකරාශිකරන මහජන මතය මීලඟට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලැබේ.

- **මිනිස් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

  ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක මිනිස් නිදහස හා අයිතිවාසිකම් මූලික වන අතර ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියාමාර්ග තුළින් සමාජයේ මිනිස් නිදහස හා අයිතිවාසිකම් උල්ලංඝණය වේ නම් ජනතාවගේ මුරබල්ලා ලෙස නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීම විරුද්ධ පක්ෂ විසින් සිදුකරනු ලැබේ. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක දේශපාලන පක්ෂවල ප්‍රධාන කාර්යක් ලෙස ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හඳුනාගත හැක.

- **ජනතාවගේ දේශපාලන අවබෝධය පුළුල් කිරීම**

  ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක මහජන පාලනය සාර්ථකව ස්ථාපිත කිරීම සඳහා ජනතාවගේ දේශපාලන අවබෝධය ඉහළ මට්ටමක පැවතිය යුතු වේ. විශේෂයෙන් ම ජන්ද දායකයා තාර්කික ලෙස ක්‍රියා කිරීම, ජන්ද දායකයාගේ දේශපාලන සහභාගිත්වය තාර්කික මට්ටමක පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය කෙරෙහි බලපායි. ඒ සඳහා ජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය කිරීම අවශ්‍ය වන අතර දේශපාලන පක්ෂ එම කාර්යය

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com

සඳහා මැදිහත් වේ. මෙහිදී දේශපාලන පක්ෂ විසින් නොයෙක් දේශපාලන මතවාද සමාජගත කිරීම, ජනතාවගේ පොදු ප්‍රශ්න විසඳීම සඳහා කුමක් කෙසේ කළ යුතු ද යන්න පිළිබඳව ප්‍රතිපත්ති හා වැඩසටහන් ඉදිරිපත් කිරීම, පක්ෂ සාමාජිකයින්ට දේශපාලන අධ්‍යාපනයක් ලබාදීම, පක්ෂ නායකයින් විසින්, ජනමාධ්‍ය මඟින් සිදුකරන දේශපාලන විග්‍රහ තුළින් සාමාන්‍ය ජනතාවට දේශපාලනය පිළිබඳ කරුණු කාරණා පහදා දීම යනාදී වශයෙන් ජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය කිරීම සඳහා පියවර ගනී.

- **දේශපාලන නායකයින් පුහුණු කිරීම**

  ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක යථා පැවැත්ම සඳහා දේශපාලන වශයෙන් පරිනත නායකයින් අවශ්‍ය වේ. විශේෂයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණය වන්නේ එහි දක්නට ලැබෙන දේශපාලන සදාචාරාත්මක භාවය යි. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථක ක්‍රියාකාරිත්වය උදෙසා පරිනත නායකයින් සිටීම අත්‍යවශ්‍ය වේ. අනෙක් අතට ආණ්ඩු ක්‍රමය, ව්‍යවස්ථා නීතිය හා රාජ්‍ය පරිපාලනය වැනි වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ මනා දැනුමක් ද දේශපාලන නායකයින්ට තිබිය යුතු ය. එබඳු දේශපාලන නායකයින් නිර්මාණය කිරීම එකවර සිදුකළ නොහැකි අතර ඒ සඳහා යම් දිගු කාලයක් අවශ්‍ය වේ. මේ අනුව පරිනත දේශපාලන නායකයින් පුහුණු කිරීමේ කාර්යය දේශපාලන පක්ෂ විසින් සිදුකරනු ලැබේ.

- **දේශපාලන නවීකරණය**

  නවීකරණය යනු සමාජ, ආර්ථික හා දේශපාලන වශයෙන් සිදුවන පරිවර්තන ක්‍රියාවලියකි. එනම් සම්ප්‍රදායිකත්වයෙන් බැහැර වී නවීන තත්ත්වයක් නිර්මාණය කර ගැනීම මින් අදහස් කෙරේ. මෙහිදී විශේෂයෙන් ම දේශපාලන නවීකරණය යනුවෙන් හඳුන්වන්නේ සාම්ප්‍රදායික (අඩු දියුණු) දේශපාලන ක්‍රමයක් දියුණු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් බවට පත්කිරීමේ ක්‍රියාදාමය යි.

  දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලවල් දේශපාලන නවීකරණය අරමුණු කරගෙන ස්ථාපිත වී ඇති විට, එම දේශපාලන පක්ෂ ආණ්ඩු පාලනයට සම්බන්ධ වීම තුළින් දේශපාලන නවීකරණ ක්‍රියාවලිය වෙත යොමුවිය හැක. මෙම නැඹුරුව දේශපාලන වශයෙන් පමණක් නොව සමාජ ආර්ථික වශයෙන් ද නවීකරණ ක්‍රියාවලිය සිදුවීම කෙරෙහි උපයෝගී කරගත හැකි වේ. **(ලකුණු 08 යි)**

<u>නිගමනය</u>

නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි දේශපාලන පක්ෂවල කාර්යයභාරය වඩාත් පුළුල් පරාසයක් දරන අතර එම කාර්යය භාරයෙහි වැදගත්කම හේතුකොට ගෙන නූතන දේශපාලන ක්‍රමයන් හි කේන්ද්‍රීය විචල්‍ය බවට දේශපාල පක්ෂ පත් වී තිබේ. **(ලකුණු 01 යි)**

(ii) <u>බලපෑම් කණ්ඩායම්වල කාර්යභාරය</u>

<u>ප්‍රවේශය</u>

ආණ්ඩු බලය අත්කර ගැනීමේ හා හැසිරවීමේ අරමුණක් නොමැති එහෙත් ආණ්ඩුවට විවිධ ආකාරයෙන් සිදු කරන බලපෑම් මගින් ස්වකීය අරමුණු සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වන පුද්ගල කණ්ඩායම් සහ සංවිධාන බලපෑම් කණ්ඩායම් ලෙස හඳුන්වනු ලැබේ. බලපෑම් කණ්ඩායම් දේශපාලන පක්ෂවලින් වෙනස් වන්නේ ආණ්ඩු බලය අල්ලා ගැනීම හා එම බලය හැසිර වීමේ අරමුණ ඒවාට නොමැති වීමෙනි. එසේ වුව ද ඇතැම් බලපෑම් කණ්ඩායම්වල දේශපාලන ක්‍රියාකාරිත්වය දේශපාලන පක්ෂවලට දෙවැනි නොවේ. අනෙක් අතට බොහෝ බලපෑම් කණ්ඩායම් දේශපාලන පක්ෂ සමග ඉතා සමීප සම්බන්ධතා පවත්වයි. **(ලකුණු 02 යි)**

<u>අන්තර්ගත කලයුතු වැදගත් කරුණු</u>

නූතන දේශපාලන ක්‍රමයන්හි ක්‍රියාත්මක වන බලපෑම් කණ්ඩායම් ජාතික හා අන්තර් ජාතික වශයෙන් දෙයාකාර වේ. වෘත්තීය සමිති, සේවා යෝජක සංවිධාන, ව්‍යාපාරික සංවිධාන, ශිෂ්‍ය සංවිධාන, තරුණ සංවිධාන, ගොවි සංවිධාන, ආගමික සංවිධාන, ප්‍රාදේශිකවාදී සංවිධන, පාරිභෝගික සංවිධාන, ජනමාධ්‍ය සංවිධාන, යනාදී වශයෙන් ජාතික මට්ටමේ බලපෑම් කණ්ඩායම් හඳුනා ගැනීමට හැකිවේ. එමෙන්ම අන්තර් ජාතික මානව හිමිකම් සංවිධාන, සාමය පිළිබඳ සංවිධාන, මාධ්‍ය අයිතිය පිළිබඳ සංවිධාන, යුදමය සංවිධාන යනාදී වශයෙන් අන්තර් ජාතික මට්ටමේ බලපෑම් කණ්ඩායම් හඳුනා ගත හැක.

නූතන ප්‍රජානත්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන්හි යහපාලනය පවත්වාගෙන යෑම සඳහා බලපෑම් කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය අංශයක් ලෙස සලකනු ලැබේ. එමෙන්ම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේ දී බලපෑම් කණ්ඩායම්වල දායකත්වය වඩාත් ප්‍රධාන වේ.

ආණ්ඩුවට බලපෑම් කිරීම සඳහා බලපෑම් කණ්ඩායම් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග රාශියක් දක්නට ලැබේ. එම ක්‍රියාමර්ග අතුරින් වැඩවර්ජන දියත් කිරීම, පෙළපාලි, විරෝධතා, උද්ඝෝෂණ පැවැත්වීම, අන්තර් ජාතික වශයෙන් ආර්ථික සම්බාධක ඇතිකිරීමට අවශ්‍ය පරිසරය උදා කිරීම, යනාදිය වඩාත් ප්‍රබල වේ. **(ලකුණු 07 යි)**

Alevel Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාන ක්‍රමයක යහපැවැත්ම උදෙසා බලපෑම් කණ්ඩායම් ක්‍රියාකාරීත්වය අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස සැලකේ එක් අතකින් තම පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීම සඳහා බලපෑම් කණ්ඩායම් ජනතාවට ප්‍රයෝජනවත්වේ. අනෙක් අතින් ආණ්ඩුවට තොරතුරු සපයන වැදගත් මූලාශ්‍රයක් ලෙසද ඒවා වැදගත් වේ. එම නිසයි බලපෑම් කණ්ඩායම් ක්‍රියාකාරීත්වය වැදගත් වන්නේ.

(ලකුණු 01 යි)

(iii) මහජන මතයේ භූමිකාව

ප්‍රවේශය

ආණ්ඩුව හා එහි ක්‍රියාකාරීත්වය, දේශපාලන වශයෙන් වැදගත් වන පුද්ගලයින් හා දේශපාලන වශයෙන් වැදගත්වන සිදුවීම් පිළිබඳව මහජනතාව දක්වන අදහස්වල සාමාන්‍යකරණය කරන ලද මතය, මහජන මතය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ලකුණු 01 යි)

අන්තර්ගත කළයුතු වැදගත් කරුණු

මහජන මතය ඉස්මතුවන්නේ ඉහතින් සඳහන් කරන ලද සමාජ, දේශපාලන ප්‍රපංචයන්ගේ හැසිරීම මුල්කර ගෙන වන හෙයින් එය දේශපාලන ක්‍රමයක නිරන්තරයෙන් හා අඛණ්ඩව පවතින මතවාදයක් නොවේ. මහජන මතයේ ස්වභාවය වන්නේ ඉහත දැක්වූ ප්‍රපංචයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් පක්ෂපාතී හෝ විපක්ෂ මතයක් මහජනතාව අතර පැන නැගීමය. එසේ පැනනගින පක්ෂ හා විපක්ෂ මතවාද අතරෙහි යම් එකඟතාවක් ඇතිවීමෙන් පසු මහජන මතය අවසානයකට පැමිණෙයි.

ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් හෝ දේශපාලනඥයින්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් හෝ වෙනත් දේශපාලන සිදුවීමක් පිළිබඳව හෝ මූලදී ජනතාව අතර ඇතිවන කුතුහලය, ඒ පිළිබඳ කරුණු කාරණාවන් සම්පූර්ණයෙන්ම අනාවරණය වීමෙන් පසු සාමාන්‍ය දෙයක් බවට පත්වේ.

මහජන මතය වර්තමානයේ පැනනගින අතර එයට අතීතයක් හෝ අනාගතයක් හෝ නොතිබේ. එමෙන්ම ඇතැම්විට වැදගත් කරුණක් සම්බන්ධයෙන් මහජන මතය පැනනොනැගී නොවැදගත් කරුණක් සම්බන්ධයෙන් මහජන මතය ඉස්මතු වීමටද පුළුවන.

මහජන මතය සමාජයේ සියළු දෙනාගෙන්ම සහභාගීත්වයෙන් පැනනැගින දෙයක් නොවේ. සමාජයේ සියලු දෙනාම ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව හෝ දේශපාලනඥයින් පිළිබඳව හෝ දේශපාලන සිදුවීම් පිළිබඳව හෝ ස්වකීය මතය ප්‍රකාශ කිරීමක් සිදු නොකරයි. සමාජයේ පුද්ගලයින් එසේ මත ප්‍රකාශ කරන්නේ ඒ පිළිබඳව ඇති උනන්දුව, දැනුම, අවබෝධය, ඕනෑකම වැනි දේවල් මුල්කර ගෙනය.

නූතන දේශපාලන ක්‍රමයන්හි මහජන මතය හැඩගැස්වීම කෙරෙහි බලපාන කාරක රාශියක් පවතී. ඒවා නම් පවුල, අධ්‍යාපනය, ආගම්, සමාජ සංවිධාන, ජනමත නායකයින්, ආර්ථික කටයුතු, ජනමාධ්‍ය, දේශපාලන පක්ෂ යනාදියයි. එම කාරක දියුණු මට්ටමක පවතීද එසේත් නැතහොත් නොදියුණු මට්ටමක පවතීද යන්න මත මහජන මතයේ ස්වභාවය තීරණය වේ. මේ අනුව බලපෑම් සහගත මහජන ඡන්දය ඉහළ මට්ටමක පවතී. එම කාරක දියුණු මට්ටමක නොපවතී නම් දේශපාලන ක්‍රමයක් තුළ මහජන මතය තාර්කික නොවනවාත් මෙන්ම බලපෑම් සහගතද නොවේ.

(ලකුණු 07 යි)

නිගමනය

නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි මහජන මතය වැදගත් වන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය අරබයාය. එනම් ජනතාවගේ ආශාවන්, අපේක්ෂාවන්, විරෝධයන් යනාදිය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අත්‍යවශ්‍ය වන හෙයින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේදී මහජන මතයට ප්‍රබල වැදගත්කමක් හිමි වී තිබේ. ආණ්ඩුව ප්‍රතිපත්ති සම්පාදනයේදී මහජන මතය යථා පරිදි විශ්ලේෂණය කළ යුතු අතර එය භාවිතයට ගනිමින් වඩාත් ප්‍රශස්ත ආකාරයේ ප්‍රතිපත්ති සම්පාදනය කොට, එම ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ මහා මැතිවරණ දෙකක් අතර තුර කාලයේ දේශපාලන ක්‍රියාදාමයට සහභාගී වීමට ජනතාවට ඇති එක් මාධ්‍යයක් වශයෙන්ද මහජන මතය හඳුනා ගැනීමට පුළුවන.

(ලකුණු 02 යි)

(iv) දේශපාලන සමාජානුයෝජනයේ කාරක

ප්‍රවේශය

දේශපාලන සංස්කෘතිය සම්බන්ධයෙන් පුද්ගලයාගේ මූලික ගතිගුණ හා අදහස් උදහස් හා සාරධර්ම යනාදිය හැඩගැසෙන්නේ දේශපාලන සමාජානුයෝජනය මත ය. "දේශපාලන සමාජානුයෝජනය යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන සමාජයක ජීවත් වන පුද්ගලයින් එම දේශපාලන ක්‍රමයට හැඩගැස්වීමේ ක්‍රියාදාමය" වේ.

(ලකුණු 01 යි)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

පුද්ගලයාගේ දේශපාලන හැසිරීම් (චර්යාව) හැඩගැස්වීම කෙරෙහි බලපාන දේශපාලන දැනුම හා අවබෝධය ලබන්නා වූ, සිය ජීවිත කාලය තුළ දී කරනු ලබන සියලුම ආකාරයේ විධිමත් හා අවිධිමත්, සැලසුම් කළ හා නොකළ දේශපාලන ඉගෙන ගැනීම්, දේශපාලන ස්වරූපයක් නොදරුව ද දේශපාලන චර්යාව කෙරෙහි බලපාන අනෙකුත් දේශපාලන නොවන ඉගෙන ගැනීම් යනාදිය අන්තර්ගත සමස්ත ක්‍රියාදාමය දේශපාලන සමාජානුයෝජනය වේ.

රෂ් නැමති දේශපාලන විද්‍යාඥයා පෙන්වා දෙන පරිදි 'පුද්ගලයින් දේශපාලන ක්‍රමයට හුරුපුරුදු කරන්නා වූත්, ඒ ආශ්‍රයෙන් දේශපාලන ක්‍රමයට ප්‍රතිචාර දැක්වීමට පුරුදු පුහුණු කරන්නා වූත් ක්‍රියාදාමය දේශපාලන සමාජානුයෝජනය වේ'. **(ලකුණු 01 යි)**

දේශපාලන සමාජානුයෝජනයේ කාරක

- පවුල
- අධ්‍යාපන ආයතන
- ආගමික සංවිධාන
- ජනමාධ්‍ය
- වෘත්තීය සංගම්
- සමාජ, සංස්කෘතික සංවිධාන
- දේශපාලන සංකේත
- දේශපාලන පක්ෂ
- ආණ්ඩුව
- මුහුණු පොතේ

දේශපාලන ක්‍රමයක් තුළ ජීවත් වන පුද්ගලයාගේ ප්‍රාථමික දේශපාලන දැනුම හා ගතිගුණ වර්ධනය වන්නේ පවුල ඇසුරිනි. පවුලේ පියා සහ මව මෙන් ම වැඩිහිටියන්ගේ දේශපාලන ආකල්ප හා දේශපාලන ක්‍රියාකාරකම් කුඩා අවධියේ පටන් පුද්ගලයාගේ දේශපාලන මතවාද හා ගතිපැවතුම් ප්‍රභවය වීම කෙරෙහි බලපායි.

එමෙන් ම ආගමික සංවිධාන ඇසුරින් ද කුඩා අවධියේ පටන් පුද්ගලයාගේ දේශපාලන ගතිපැවතුම් හා ආකල්ප නිර්මාණය වීම සිදුකෙරේ. විශේෂයෙන් ම ආගමික සංවිධානයන් පවත්නා දේශපාලන ක්‍රමයට අනුගත වී ක්‍රියාත්මක වන හෙයින් ආගමික ආයතන මඟින් පුද්ගලයාගේ විඥානය හසුරවනු ලබන්නේ පවත්නා දේශපාලන ක්‍රමයට පුද්ගල විඥානය අනුගත වන ආකාරයෙනි. සමාජය තුළ ක්‍රියාත්මක වන ප්‍රාථමික සමිති සමාගම් සමඟ පුද්ගලයා සම්බන්ධ වීම තුළින් ද පවත්නා දේශපාලන ක්‍රමයට උචිත වන ආකාරයෙන් පුද්ගලයාගේ දේශපාලන මතිමතාන්තර ගොඩනැගේ.

ජනසන්නිවේදන මාධ්‍ය, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති යානාදී කාරකයන් මඟින් පුද්ගලයාගේ දේශපාලන විඥානය ගොඩනැගීම වඩාත් තීව්‍ර ලෙස සිදුකෙරේ.

පාසල හා විශ්වවිද්‍යාලය මඟින් පුද්ගලයාට ලබා දෙන (විෂයානු බද්ධව හා විනයානුකූලව) දේශපාලන අධ්‍යාපනය ද දේශපාලන සමාජානුයෝජනය කෙරෙහි වේ. දේශපාලන සමාජානුයෝජනය කෙරෙහි ආණ්ඩුවේ ක්‍රියාකලාපය ප්‍රබල ලෙස බලපාන කාරකයක් එනම් සමාජයේ දේශපාලන ආකල්ප, ගතිපැවතුම් මෙන් ම දේශපාලන දැනුම වැඩි වර්ධනය වීම කෙරෙහි ආණ්ඩුවේ ක්‍රියාකලාපය උපස්තම්භක වන බව දැක්විය හැක. **(ලකුණු 08 යි)**

නිගමනය

මේ අකාරයෙන් පුද්ගලයා තමා ජීවත්වන දේශපාලන ක්‍රමයේ දේශපාලන ආයතන පද්ධතියට ද දේශපාලන චාරිත්‍රවලට ද යෙදවුම් හා නිමැවුම් ක්‍රියාවලියට හෙවත් ආණ්ඩුව වෙත ජනතා ඉල්ලීම් ඉදිරිපත් කිරීම හා එම ඉල්ලීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාදාමය යනාදියට හුරුවීම නැතහොත් හැඩගැසීමේ ක්‍රියාවලිය දේශපාලන සමාජානුයෝජනය යනුවෙන් හඳුන්වනු ලැබේ. දේශපාලන සමාජානුයෝජන ක්‍රියාවලිය සෘජු ලෙස දේශපාලන සංස්කෘතිය හා සම්බන්ධ වී තිබේ. **(ලකුණු 01 යි)**

(I) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන්හි සිවිල් සමාජයේ භූමිකාව

ප්‍රවේශය

නූතන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයක් වශයෙන් සිවිල් සමාජය පිළිබඳ සංකල්පය හඳුන්වාදීමට පුළුවන. ආණ්ඩුව, පවුල හා වෙළෙඳපොළ හැර සමාජයේ ක්‍රියාත්මක වන සියලුම සමාජ සංවිධානයන්ගේ සමස්ථ එකතුව සිවිල් සමාජය යනුවෙන් හඳුන්වයි. මූලික වශයෙන් ගත්කළ සිවිල් සමාජය යනු සංවිධිත සමාජය වේ. **(ලකුණු 01 යි)**

London School of Economics මඟින් සිවිල් සමාජය පිළිබඳ ඉදිරිපත්කර ඇති අර්ථකථනය අනුව 'බෙදාගත් ආශාවන්, අරමුණු හා අගය කිරීම් උදෙසා බලය යෙදීමෙන් තොරව සාමූහිකව ක්‍රියාත්මකවන සමාජ ක්ෂේත්‍රය සිවිල් සමාජය වේ.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සිවිල් සමාජ සංවිධාන යනු රාජ්‍ය නොව සංවිධාන, සමාජ සේවා දානපති සංවිධාන, ප්‍රජා සංවිධාන, කාන්තා සංවිධාන, ආගමික සංවිධාන, අන්‍යෝන්‍ය ආධාර උපකාර සංවිධාන, වෘත්තීය සමිති, සමාජ ව්‍යාපාර, ව්‍යාපාරික සංවිධාන, මානව හිමිකම් සංවිධාන යනාදී සංවිධානයන්ගේ සමස්ථ එකතුව වේ.

සිවිල් සමාජයේ අංග ලක්ෂණ

- සාමූහික ක්‍රියාවන් - සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය සාමූහික අරමුණු සඳහා මිස පෞද්ගලික ආශාවන් හා අරමුණු සඳහා ඇතිවන්නක් නොවීම.
- බලය යෙදීමෙන් තොර වීම - සිවිල් සමාජය ක්‍රියාත්මක වන්නේ බලය මත නොව ස්වේච්ඡාව හා උවමනාව අනුවයි.
- අනන්‍යතාව - සිවිල් සමාජයට වෙන් වූ අනන්‍යතාවක් තිබේ. එය රාජ්‍ය, පවුල හා වෙළෙඳපොළෙන් වෙනස් වේ.
- දේශ සීමා නියමිත නොවීම - රාජ්‍ය, පවුල හා වෙළෙඳපොළෙන් සිවිල් සමාජය වෙන්කොට හඳුනාගන්නේ කුමන සීමා මායිම්වලින් ද, යන්න නිශ්චිතව හඳුනාගෙන නොමැත.

සිවිල් සමාජය පිළිබඳ සංකල්පය පැරණි සංකල්පයක් වූවද එය වඩාත් ඉස්මතු වූයේ මෑතකදී ය. එනම් විසිවන සියවස අගභාගයේදී ය. විශේෂයෙන් ම කලක් තුන්වන ලෝකයේ රටවල් ලෙස හැඳින්වූ අඩුදියුණු ලෝකයේ රටවල ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය පිළිබඳ මතුවූ අර්බුදකාරී තත්ත්වය හේතු කොටගෙන ය. එම අර්බුදය ඇති වූයේ විශේෂයෙන් ම අඩුදියුණු රටවල ප්‍රජාතන්ත්‍රවාදය යටපත් වී අධිකාරිවාදී හා ඒකාධිපති පාලනයකට වර්ධනය වීමෙනි. අනෙක් අතට මෙකී රටවල ආර්ථික සංවර්ධනය පහළ මට්ටමක පැවතීම ද රාජ්‍ය අංශයේ දූෂණය, වංචා ව, අකාර්යක්ෂමතාව, නාස්තිය, ඥාතී සංග්‍රහය, වගකීම් විරහිත බව, පාලනයේ විනිවිදභාවය නොමැති වීම, යනාදී ලක්ෂණ හඳුනාගත හැකි විය.

මෙකී දුර්වලතාවයන්ගෙන් එම රටවල් මුදවාගෙන ප්‍රජාතන්ත්‍රවාදය යළි තහවුරු කිරීමත්, ආර්ථික හා සමාජ සංවර්ධනය උදාකිරීමත් සඳහා පවතින ප්‍රධානතම බාධකය ලෙස හඳුනාගැනුනේ එම අඩුදියුණු රටවල ජනසමාජය ඉතාමත් පසුගාමී තත්ත්වයක පැවතීම ය. එනම් දේශපාලන සංස්කෘතිය ඉතා නොදියුණු තත්ත්වයක පැවතීම ය. මින් අදහස් කරන්නේ ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝධය ඉතා පහළ මට්ටමක පැවතීම ය. මෙය විශේෂයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ඇති අනවබෝධය විය.

මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා අනුගමනය කළ යුතු එක් ක්‍රියාමාර්ගයක් ලෙස පෙනී යන්නේ ජනතාව දේශපාලන දැනුමෙන් සන්නද්ධ කිරීම හා ජනතාව සංවිධානය කොට සබිබල ගැන්වීම ය. මේ සම්බන්ධයෙන් ආමන්ඩ් (Almond) හා වර්බා (Verba) යන දේශපාලන විද්‍යාඥයින් විසින් රචනා කරන ලද " The civil culture" නැමති ග්‍රන්ථයෙහි ඇතුල්වන අදහස් වැදගත් වේ.

සිවිල් සමාජයේ භූමිකාව

යහපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සම්බන්ධයෙන් සිවිල් සමාජයට ඉටුකළ හැකි කාර්යය භාරය හා බලපෑම පහත සඳහන් පරිදි වේ.

- **සිවිල් සමාජය ප්‍රතිරෝධක බලවේගයක් ලෙස ක්‍රියාත්මක වීම.**

  දේශපාලන අධිකාරියේ අත්තනෝමතික ක්‍රියාවන්ට එරෙහිව තනි තනි වශයෙන් පුද්ගලයින්ට මුහුණ දිය නොහැකි බැවින් පුරවැසියන්ට සංවිධානාත්මකව දේශපාලන අධිකාරියට එරෙහිව පෙළ ගැසීම.

- **ආණ්ඩුකරණය පිළිබඳ මුර බල්ලෙකු ලෙස ක්‍රියාත්මක වීම.**

  ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසිලිමත් වීම. මේ අනුව දේශපාලනඥයින් හා රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ හා අනිසි ක්‍රියාවන් කෙරෙහි දැස් යොමා සිටිමින් ඒවාට එරෙහිව සිවිල් සමාජයේ බලය යෙදවීම. එමෙන් ම සමස්ත සේවාවන් හා පොදු භාණ්ඩ සැපයීම සඳහා රජයට බලපෑම් කිරීමට සිවිල් බලය යෙදවීම.

මීට අමතරව සිවිල් සමාජ සංකල්පය මගින් පුරවැසියන් සාමූහික ජීවිතයකට හුරු පුරුදු කිරීමත්, පුරවැසි ජීවිතයේ යහපත්භාවය වර්ධනය කිරීමත් (සමාජශීලී බව) සිදුකරණු ලැබේ. **(ලකුණු 08 යි)**

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

නිගමනය

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක යහපත් ක්‍රියාකාරිත්වය උදෙසා සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අත්‍යාවශ්‍ය දෙයක් ලෙස පිළිගනු ලැබේ හේතුව එමගින් ආණ්ඩුක්‍රමය මෙන්ම පාලකයින්ද අත්තනෝමතිකවීම වලක්වා ගැනීමට හැකි වීමය.

(ලකුණු 01 යි)

ප්‍රශ්න අංක 04

පහත දැක්වෙන ඕනෑම ඒවායින් දෙකක් පිළිබඳව පරීක්ෂා කරන්න.

I. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි මහජන මන්ත්‍රී මණ්ඩලයේ හෝ ඇමරිකානු ආණ්ඩුක්‍රමයෙහි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ භූමිකාව

II. ප්‍රංශයේ ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය අතර පවතින සම්බන්ධතාව හෝ ස්විට්සර්ලන්තයේ සන්ධිය මණ්ඩලය **(Federal Council)** සහ සන්ධිය සභාව **(Federal Assembly)** අතර පවතින සම්බන්ධතාව.

III. ඉන්දීය පෙඩරල් ක්‍රමයෙහි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය අතර පවතින සම්බන්ධතාව.

IV. අන්තර්ජාතික දේශපාලනයෙහි ක්‍රියාධරයින් සහ ඔවුන්ගේ ක්‍රියාකලාපය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය

(ලකුණු 10X2=20)

4. **(I) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි මහජන මන්ත්‍රී මණ්ඩලයේ භූමිකාව**

❖ **ප්‍රශ්නයේ අරමුණ:** බ්‍රිතාන්‍ය දේශපාලනය ක්‍රමය තුළ ජනතා නියෝජනය, ව්‍යවස්ථාදායකය, විධායකය පිහිටුවීම හා එය පාලනය කිරීම, රාජ්‍ය මුදල් පසුම්බිය පාලනය කිරීම, ජනතා මතය ප්‍රකාශ කිරීම, යන කාර්යයන් සම්බන්ධයෙන් මහජන මන්ත්‍රී මණ්ඩලයේ භූමිකාව කෙබඳුවේද යන්න පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(අ)

❖ බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වේ. එයින් එක් මණ්ඩලයක් වන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලයයි. ජනතා ඡන්දයෙන් තෝරා ගන්නා නියෝජිතයින් 635 න් එය සමන්විත වේ.

❖ නිලකාලය අවුරුදු 05කි. අවශ්‍ය විටකදී අගමැතිවරයාගේ උපදෙස් පරිදි නිල කාලය අවසාන වීමට ප්‍රථමයෙන් විසුරුවා හැරීමට කිරීටයට බලය තිබේ.

❖ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක අතරින් වඩාත්ම බලවත් මණ්ඩලය වන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලයයි.

❖ මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ ප්‍රධාන බලධාරියා වන්නේ කථානායකවරයාය. මන්ත්‍රී මණ්ඩලය තුළ විනය පවත්වා ගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ කථානායකවරයාටය.

❖ මන්ත්‍රී මණ්ඩලයේ අභ්‍යන්තර ක්‍රියාදාමය පවත්වා ගෙන යන්නේ ස්ථාවර නියෝග අනුවය.

(ලකුණු 01 යි)

(ආ) **භූමිකාවන්**

❖ සාමාන්‍යයෙන් පිළිගත් මතය වන්නේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව නීති සම්පාදනය සම්බන්ධයෙන් උත්තරීතර බලයක් භුක්ති විඳින බවය. මෙම තත්වය හඳුන්වන්නේ පාර්ලිමේන්තුවේ ස්වාධිපතිත්වය ලෙසය.

❖ De Lome නමැති දේශපාලන විචාරකයා ප්‍රකාශ කළ ආකාරයට පිරිමියෙක් ගැහැණියෙකු කිරීම හෝ ගැහැණියකු පිරිමියකු කිරීම හෝ හැරුණ විට අනෙක් ඕනෑම දෙයක් කිරීමේ බලය පාර්ලිමේන්තුවට හිමිවේ.

❖ පාර්ලිමේන්තුව යනුවෙන් ප්‍රකාශ කරන විට ඉහත දැක්වූ අසහාය බලය ක්‍රියාවට නැංවීම සඳහා පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකම සහභාගී වන බව හැගී ගියද සත්‍ය තත්වය වන්නේ එම බලය සැබෑ වශයෙන්ම ක්‍රියාවට නංවන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් බවය. හේතුව අනෙක් මණ්ඩලය වූ සාමි මන්ත්‍රී මණ්ඩලය දෙවන මණ්ඩලය වීම පමණක් නොව සැබැවින්ම එය මහජන මන්ත්‍රී මණ්ඩලයේ ආධිපතීත්වයට යටත් මණ්ඩලයක් වීමය.

Alevel ඇප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

❖ මහජන මන්ත්‍රී මණ්ඩලය මඟින් ඉටුකරන කාර්යයන් පහත පරිදි වේ.

I. නීති පැනවීම. නමුත් සත්‍ය වශයෙන්ම සිදුවන්නේ විධායකය විසින් ඉදිරිපත් කරන අණපනත් වලට අනුමැතිය දීමය.

II. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම පාලනය කිරීම, නමුත් ආණ්ඩුවට සහතික කරන ලද බහුතර බලයක් මන්ත්‍රී මණ්ඩලය තුළ තිබෙන විට පාලනය කිරීමේ කාර්යය හුදු ප්‍රශ්න කිරීම් හා විවාද කිරීම යන තත්වයට සීමා වේ.

III. විධායකය පාලනය කිරීම, බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම සම්ප්‍රදායන්ට අනුව විධායකය වන අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය මහජන මන්ත්‍රී මණ්ඩලයට වගකීමට බැඳී සිටී. විධායකය මෙම කොන්දේසියට අනුව ක්‍රියාකරනවාද යන්න නිරන්තර සුපරීක්ෂාවට ලක්කිරීම මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඉතාම වැදගත් භූමිකාවක් වේ. මෙම කාර්යභාරය මහජන මන්ත්‍රී මණ්ඩලය ක්‍රියාවට නංවන්නේ ප්‍රශ්න ඇසීම, විවේචනය කිරීම, වැනි ක්‍රියාවන් මඟින් ප්‍රශ්න ඇසීම සඳහා මන්ත්‍රීවරුන්ට සතියේ සඳුදා, අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්හිදී සවස 2.45 සිට 3.45 දක්වා පැයක කාලයක් වෙන්කර ඇත. එමෙන් ම ආණ්ඩුවේ ප්‍රතිපත්ති වලට ඉතාම දැඩිලෙස විරුද්ධ වෙනවා නම් ඒ සඳහා අදහස් දැක්වීමට විරුද්ධ පක්ෂයට මාසයකට දින 12ක් වෙන්කර ඇත. මන්ත්‍රී මණ්ඩලය කල්තබන අවස්ථාවේදී විශේෂයෙන් කරනු ලබන විවාද යනාදි මෙවලම් හරහා විරුද්ධ පක්ෂය මෙම කාර්යය ඉටුකරනු ලැබේ.

IV. මෙම මෙවලම් භාවිතා කිරීම මඟින් විධායකය පාලනය කිරීමට මන්ත්‍රීමණ්ඩලයට නොහැකිවේ නම් අවසාන වශයෙන් කළ හැක්කේ විධායකයට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් අනුමත කොට විධායකය බලයෙන් පහකිරීමය.

V. රාජ්‍ය මුදල් පාලනය. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ රාජ්‍ය මුදල් පාලනය කිරීමේ පූර්ණ බලධාරියා වන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලයයි. මුදල් පනත් ආරම්භ කිරීමේ බලය හිමි වන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලයට පමණි. මහජන මන්ත්‍රී මණ්ඩලයේ අනුමතිය නොමැතිව ආණ්ඩුවට රාජ්‍ය මූල්‍ය වියහියදම් කිරීමට නෙහැක.

VI. මහජන මතය ආණ්ඩුව කරා ගෙන යාම, විවේචන කිරීම, විවාද කිරීම, ප්‍රශ්න ඇසීම, දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම, මහජන පෙත්සම් ඉදිරිපත් කිරීම යන මෙවලම් මේ සඳහා භාවිතයට ගනු ලැබේ.

VII. නායකයින් පුහුණු කිරීම. තරුණ හා නවක මන්ත්‍රීවරුන් අනාගත නායකයින් ලෙස පුහුණු කිරීම මෙයින් අදහස් වේ. **(ලකුණු 08 යි)**

(ඇ) **නිගමනය**

❖ ලෝකයේ තිබෙන ප්‍රබලම මහජන මන්ත්‍රී මණ්ඩලය සහ බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සක්‍රීයව තබා ගැනීම සඳහා අති විශාල දායකත්වයක් සපයන ඉතාම වැදගත් ජනතා ආයතනයක් ලෙස මෙය හඳුනාගත හැක.

(ලකුණු 01 යි)

4. **(I) ඇමරිකානු ආණ්ඩුක්‍රමයෙහි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ භූමිකාව**

අරමුණ: ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හිමි තත්වය, පැවරී තිබෙන බලතල හා කාර්යයන් සහ ඒවා ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම.

(අ) **ව්‍යවස්ථාමය පසුබිම සහ සංවිධාන ව්‍යූහය**

❖ ඇමරිකාවේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ කොන්ග්‍රස් මණ්ඩලය නමිනි. එය ද්වි මාණ්ඩලික ආයතනයක් වන අතර නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් මණ්ඩලය එම ආයතන දෙක වේ.

❖ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සාමාජිකයින් 435 දෙනෙකුගෙන් යුක්තය. ප්‍රාන්ත රාජ්‍යයන්ගේ ජනගහනය පදනම් කරගෙන ප්‍රාන්ත විසින් නියෝජිතයින් ජනතා ඡන්දයෙන් තෝරා පත්කරනු ලැබේ. අවම වශයෙන් ප්‍රාන්තයකට එක් නියෝජිතයෙක්වත් සිටිය යුතුය. නියෝජිතයන්ගේ නිල කාලය අවුරුදු දෙකකි.

❖ සෙනෙට් මණ්ඩලය හා සසඳන විට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විශාල ආයතනයක් වේ. **(ලකුණු 01 යි)**

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) **බලතල හා කාර්යයන්**

- මුදල් පනත් ආරම්භ කිරීමේ තනි අයිතිය ඇත්තේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටය. ඒ හැරුන විට ව්‍යවස්ථාදායකය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩල දෙකම සමාන බලයක් භුක්ති විඳී.
- මෙම බලතල ප්‍රධාන කොටස් හතරක් යටතේ හඳුනා ගතහැක.
  - I. අවධාරිත- ව්‍යවස්ථාවෙන් පවරන ලද
  - II. අර්ථ නිරූපනය හරහා ලබාගත් බලතල - එනම් ව්‍යවස්ථාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථ නිරූපනය කරමින් ලබා දී ඇති බලතල
  - III. උරුමයෙන් හිමි වූ බලතල - එනම් ඇමරිකා එක්සත් ජනපදය ස්වාධිපති ජාතික රාජ්‍යයක් වීම හේතුවෙන් හිමිවන බලතල
  - IV. සමගාමී බලතල - ප්‍රාන්ත රාජ්‍යයන් සමග එක්ව ක්‍රියාවට නංවන බලතල
- මෙම බලතල පදනම් කරගෙන නීති පැනවීමට අමතරව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය පහත දැක්වෙන කාර්යයන්ද කරනු ලැබේ.
  - I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.
  - II. පරිපාලන සේවාව අධීක්ෂණය කිරීම.
  - III. පරීක්ෂණ පැවැත්වීම.
  - IV. යුද්ධ බලතල
  - V. පැහැදිලිව ප්‍රකාශ නොකරන ලද නමුත් කළ යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙයන් අපේක්ෂිත කාර්යයන්, නිදසුන් - ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත බලතල ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නීති පැනවීම.
- මෙම බලතල හා කාර්යයන්ට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පමණක් හිමිකර දී ඇති බලතල දෙකක් පෙන්වා දිය හැක.
  - I. ජනාධිපතිවරයා පත්කිරීම - ජනාධිපතිවරණයේදී යම් අපේක්ෂකයෙකු නියමිත ඡන්ද සංඛ්‍යාව ලබාගෙන නොමැත්තේනම් එහිදී ජනාධිපතිවරයා පත්කිරීමේ බලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හිමිවේ.
  - **II.** දෝෂාභියෝග ආරම්භ කිරීමේ බලය ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝග ආරම්භ කිරීමේ තනි සහ අනන්‍ය බලය හිමි වන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටය. **(ලකුණු 07 යි)**

(ඇ) **නිගමනය**

- බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලය මෙන් ඇමරිකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ස්වාධිපති බලය හිමි ආයතනයක් නොවේ.
- ඇමරිකානු දේශපාලනය තුළ වුවද එය සෙනෙට් මණ්ඩලයට සමඟ සැසඳීමේදී හිමිවන්නේ අඩු වැදගත්කමකි. සෙනෙට් මන්ත්‍රීවරයෙකුට හිමි තත්වය, බලය හා නම්බුව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයෙකුට හිමිනොවේ.
- අවසාන වශයෙන් කිව හැක්කේ ඇමරිකානු දේශපාලන ක්‍රමය තුළ පවතින දේශපාලන ආයතන අතුරින් තත්වයෙන්, ගෞරවයෙන් හා නම්බුවෙන් අඩුම ආයතනය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වන බවය. **(ලකුණු 02 යි)**

4. (II) - ප්‍රංශයේ ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය අතර පවතින සම්බන්ධතාවය

- අරමුණ: 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ගොඩනගන ලද දෙමුහුන් විධායකයේ ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය පිළබිඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම.

(අ) **ප්‍රවේශය**

- 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ප්‍රංශය තුළ ගොඩනගා ඇති විධායකය කොටස් දෙකකින් සමන්විත වේ. මෙයින් එක් කොටසක් වන්නේ ජනාධිපතිවරයාය. දෙවන කොටස අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය වේ.
- අමාත්‍යවරුන් අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වන විට එය හඳුන්වන්නේ කැබිනට් මණ්ඩලය ලෙසය. ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වන විට එය අමාත්‍ය මණ්ඩල කවුන්සිලය ලෙස හැඳින්වේ.
- අමාත්‍ය මණ්ඩලය ප්‍රංශ ආණ්ඩුක්‍රමය තුළ ප්‍රචලිතව තිබෙන්නේ ආණ්ඩුව ලෙසය. **(ලකුණු 01 යි)**

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) **අන්තරගතකළයුතු වැදගත් කරුණු**

- අගමැති සහ අමාත්‍යවරුන් තෝරාපත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි. ප්‍රථමයෙන් ම අගමැතිවරයා පත්කළ යුතුය. එහිදී ඒ ඒ දේශපාලන පක්ෂයට හිමි ආසන සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් සැලකිල්ලට ගත යුතුය. අනතුරුව අගමැතිගේ අදහස් විමසීමෙන් පසු අනෙක් අමාත්‍යවරුන් පත්කළ යුතුය.

- අගමැති තනතුරට කෙනෙකු පත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව විධිවිධාන දක්වා නොමැත. ඒ කෙරෙහි අදාළ වන ප්‍රධාන සුදුසුකම් වන්නේ ජනාධිපතිවරයාට පෞද්ගලික වශයෙන් පිළිගැනීමට ඇති හැකියාවය. දෙවැන්න වන්නේ අගමැති තනතුරට පත්කරන තැනැත්තාට ජාතික සභාව තුළ තිබෙන නැතිනම් ලබා ගත හැකි සහයෝගයේ ප්‍රමාණයයි.

- ප්‍රංශයේ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ පාර්ලිමේන්තුවේ සාමාජිකයින් නොවන වෙනත් බාහිර අය අමාත්‍යවරුන් ලෙස පත්කිරීමට ජනාධිපතිවරයාට බලය හිමිවීමය.

- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය රැස්වන්නේ අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙනි. පසුව ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වී එම ප්‍රතිපත්ති පිළිබඳව අවසාන තීරණ වලට එළඹේ.

- ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානවලට අනුව අමාත්‍යවරුන් තනතුරුවලින් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතුවේ. මෙයට අගමැතිවරයා අයත් නොවුවද ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී දැකිය හැක්කේ ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා ද තනතුරින් ඉවත් කරන ආකාරයයි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අගමැතිවරයාට විශේෂයෙන් පවරා ඇති පහත දැක්වෙන බලතල අගමැතිවරයා ක්‍රියාවට නැංවිය යුත්තේ ජනාධිපතිවරයා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙනි.
  - I. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මෙහෙයවීම
  - II. නීති ක්‍රියාවට නැංවීම
  - III. රාජ්‍ය සේවාව පවත්වා ගෙන යාම
  - IV. අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය තීරණය කිරීම සහ පත්කළ යුතු අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව තීරණය කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මෙම විධායක කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා අගමැතිවරයා විසින් නිකුත් කරන ආඥා සහ පනවන අණපනත් වලංගු වීමට සහ බලාත්මක වීමට නම් ජනාධිපතිවරයා අනු අත්සන තබා සහතික කළ යුතුය.

- එමෙන් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරී ඇති සමහර විධායක කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා ජනාධිපතිවරයා නිකුත් කරන නියෝග හා ආඥා අගමැතිවරයා විසින් අනු අත්සන් තබා සහතික කළ යුතුය. **(ලකුණු 08 යි)**

(ඇ) **නිගමනය**

- 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ගොඩනගන ලද විධායකයේ දෙවන කොටස වන අගමැති හා අමාත්‍ය මණ්ඩලය සහ ජනාධිපතිවරයා අතර පවතින සම්බන්ධතාවන් විමසීමේදී පෙනී යන්නේ අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය ස්වාධීන හා ශක්තිමය රාජ්‍ය පාලන උපකරණයක් නොවන බවය. එය වූ කලී සැබැවින්ම ජනාධිපතිවරයාට තම විධායක බලය සහ ව්‍යවස්ථාවෙන් පැවරී ඇති අනෙක් බලතල ක්‍රියාවට නැංවීම පිණිස සහායට ගැනෙන උපකාරක මෙවලමක් පමණක් වේ. **(ලකුණු 01 යි)**

4. (II) ස්විට්සර්ලන්තයේ සන්ධීය මණ්ඩලය හා සන්ධීය සභාව අතර පවතින සම්බන්ධතාව.

- **ප්‍රශ්නයේ අරමුණ:** ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය තුළ විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම.

(අ) **හැඳින්වීම**

- ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය තුළ විධායකය හඳුන්වන්නේ සන්ධීය මණ්ඩලය ලෙසය. ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ සන්ධීය සභාව ලෙසය. සන්ධීය කවුන්සිලය සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. සන්ධීය සභාව ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් වන අතර එය

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සමන්විත වන්නේ ජාතික කවුන්සිලය හා රාජ්‍යයන්ගේ කවුන්සිලය යන ආයතන දෙකෙනි. මේ සෑම ආකාරයකම සාමාජිකයින්ගේ නිලකාලය වසර 04කි. **(ලකුණු 01 යි)**

(ආ) සම්බන්ධතාවන්

- සන්ධීය මණ්ඩලය හෙවත් ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයේ මධ්‍යම ආණ්ඩුවේ විධායකය සමන්විත වන්නේ සිව්වසරක නිල කාලයක් සඳහා ස්විට්සර්ලන්ත මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය වන සන්ධීය සභාව විසින් තෝරාපත් කරන සාමාජිකයන් සත් දෙනෙකුගෙනි.
- සන්ධීය සභාවේ මහජන මන්ත්‍රී මණ්ඩලය ලෙස සැලකෙන ජාතික කවුන්සිලයට නියෝජිකයන් තෝරා පත්කර ගැනීම සඳහා පැවැත්වෙන මැතිවරණයෙන් පසුව සන්ධීය සභාවේ අනෙක් මණ්ඩලය වන රාජ්‍යයන්ගේ කවුන්සිලය සමඟ පවත්වන එක්බද්ධ රැස්වීමකදී සන්ධීය මණ්ඩලයට සාමාජිකයින් පත්කරනු ලැබේ.
- සන්ධීය මණ්ඩලයේ ප්‍රධානියා වන සභාපතිවරයා සහ එහි දෙවැන්නා වන උප සභාපතිවරයා පත් කරන්නේද සන්ධීය සභාව විසිනි.
- සන්ධීය මණ්ඩලය ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් බලාත්මක වන්නේ සන්ධීය සභාව විසින් අනුමත කළහොත් පමණි.
- එමෙන්ම සන්ධීය මණ්ඩලය අත්සන් කරන විදේශ ගිවිසුම් සන්ධීය සභාව විසින් අනුමත කළ යුතුය.
- මෙයට අමතරව සන්ධීය මණ්ඩලය විසින් රාජ්‍යය තොරතුරු අලලා සකස් කරන විශේෂ ප්‍රකාශන වරින් වර සන්ධීය සභාවට එවන අතර ඒවා සළකා බැලීමද සන්ධීය සභාවේ කාර්යයන් වේ.
- සන්ධීය මණ්ඩලය සන්ධීය සභාවට වගකීමට බැඳී නොමැත. එසේවුවද සන්ධීය සභාවේ සාමාජිකයින් අසන ප්‍රශ්න වලට පිළිතුරු දීමට සන්ධීය මණ්ඩලයේ සාමාජිකයින් බැඳී සිටී.
- විශ්වාසභාංග යෝජනාවක් මඟින් හෝ වෙනත් වැදගත් පනතක් පරාජයට පත් කිරීම මඟින් සන්ධීය කවුන්සිලය නිලයෙන් ඉවත් කිරීමට සන්ධීය සභාවට බලය නොමැත. එබැවින් සන්ධීය කවුන්සිලය සමස්ථ නිලකාලය තුළ ස්ථාවර ආයතනයක් ලෙද ක්‍රියාත්මක වේ. **(ලකුණු 08 යි)**

(ඇ) නිගමනය:

- වර්තමාන ලෝකය තුළ සුවිශේෂී ආකාරයක විධායක, ව්‍යවස්ථාදායක සම්බන්ධතා පවත්වන වෙනස් ආණ්ඩුක්‍රමයක් ලෙස ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය හඳුන්වා දියහැක.
- ආයතන දෙක අතර සමීප සම්බන්ධතාවක් තිබුණද එකකට අනික යටත් නොවන අතර එකක් විසින් අනික පාලනය කළ හැකිද නොවේ.
- ආයතන දෙක අතර සැබෑ වශයෙන්ම පවතින්නේ සහහැසිරීමක්ය. **(ලකුණු 01 යි)**

4. (III)

ඉන්දීය පෙඩරල් ක්‍රමයෙහි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය අතර පවතින සම්බන්ධතා

- අරමුණ - ඉන්දියානු ආණ්ඩුක්‍රමය සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වුවද ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී එය වඩාත් ලං වන්නේ අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයකටය. මෙම තත්වය ගොඩනගා තිබෙන්නේ මධ්‍යම - ප්‍රාන්ත සම්බන්ධතා ජාලාව මඟිනි. මෙම සම්බන්ධතා ජාලයේ ස්වරූපය හා ඒවා ක්‍රියාවට නැංවෙන ආකාරය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(අ) ප්‍රවේශය

- ඉන්දීය ආණ්ඩුක්‍රමය දෙස බාහිර වශයෙන් බලන අයෙකුට එක්වරම පෙනී යන්නේ එය සන්ධීය ආණ්ඩුක්‍රමයක් වන බවය.
- නමුත් සත්‍ය තත්වය වන්නේ ඉන්දීය ආණ්ඩුක්‍රමය සම්භාව්‍ය සන්ධීයවාදයෙන් බොහෝ ඈතට ගිය ඉන්දියාවේ සුවිශේෂීගත තත්වයන්ට අනුව නිර්මාණය කළ අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමයක් වන බවය.
- ඉන්දියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර් ප්‍රකාශ කළ ආකාරයට; "ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්ප්‍රදායික පෙඩරල් මූලධර්ම අනුව සකස් කළ එකක් නොවේ. එය ගොඩනගා තිබෙන්නේ සාමාන්‍ය තත්වයන් යටතේ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වීමටත්, යුද්ධ හා වෙනත් හදිසි අවස්ථා යටතේ ඒකීය ව්‍යවස්ථාවක් ලෙසත් ක්‍රියාත්මක වන ආකාරයටය."

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

❖ මෙම සුවිශේෂී තත්වය තේරුම් ගත හැක්කේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර සම්බන්ධතා ගොඩනගා ඇති ආකාරය පරීක්ෂාකර බැලීමෙන් මෙම සම්බන්ධතා අංශ තුනක් යටතේ සාකච්ඡා කළ හැක.

1. ව්‍යවස්ථාදායක බලතල ක්‍රියාවට නැංවීම පිළිබඳ සම්බන්ධතා
2. පරිපාලන සම්බන්ධතා
3. මූල්‍ය සබඳතා

(ලකුණු 01 යි)

1. ව්‍යවස්ථාදායක බලතල සම්බන්ධතා

I. සමගාමී ලැයිස්තුවේ අන්තර්ගත කරුණු 47 වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුවටද නීති පැනවිය හැක. මධ්‍යම හා ප්‍රාන්ත නීති අතර ගැටුමකදී මධ්‍යම නීතිය උත්තරීතර වේ.

II. ප්‍රාන්ත රාජ්‍ය බලතල ලැයිස්තුවේ සඳහන් කරුණු කෙරෙහි වුවද මධ්‍යම ආණ්ඩුවට නීති පැනවිය හැකිවීම.

III. ප්‍රාන්ත රාජ්‍ය පනවන සමගාමී නීති බලාත්මක වීම සඳහා මධ්‍යම ආණ්ඩුවේ ජනාධිපතිගේ අනුමතිය අවශ්‍ය වීම.

IV. ප්‍රාන්ත රාජ්‍යයන් ඉල්ලා සිටින විට එම ප්‍රාන්ත කෙරෙහි බලපාන නීති පැනවීමට මධ්‍යම ආණ්ඩුවට හැකිවීම.

V. මධ්‍යම ආණ්ඩුව එළඹෙන ජාත්‍යන්තර ගිවිසුම් ක්‍රියාවට නැංවීම පිණිස සමස්ථ ඉන්දියාව කෙරෙහිම බලපාන නීති පැනවීමට මධ්‍යම ආණ්ඩුවට බලය තිබීම.

VI. සමහර කරුණු සම්බන්ධයෙන් ප්‍රාන්ත රාජ්‍යයන් නීති පනවන්නේ නම් ඒ සඳහා මධ්‍යම ආණ්ඩුවේ ජනපතිගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවීම.

VII. හදිසි අවස්ථා යටතේ මධ්‍යම ආණ්ඩුව සතුවන විශේෂ බලතල යටතේ ප්‍රාන්ත ආණ්ඩු පාලනය කිරීමට මධ්‍යම ආණ්ඩුවට හැකිවීම.

VIII. මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුවේ තබා ඇති අනු සටහන් මඟින් ප්‍රාන්ත රාජ්‍ය සහ සමගාමී බලතල ලැයිස්තු පාලනය කිරීමට මධ්‍යම ආණ්ඩුවට හැකිවීම.

2. පරිපාලන සම්බන්ධතා

I. මෙහෙයුම් නියෝග හරහා ප්‍රාන්ත පාලනය කිරීමට මධ්‍යම ආණ්ඩුවට ඇති බලය.

II. මධ්‍යම ආණ්ඩුව නියම කරන සමහර කාර්යයන් කරන ලෙස ප්‍රාන්ත වලට අණ කිරීමේ බලය.

III. සමහර නාර්යයන් කරන මෙන් මධ්‍යම ආණ්ඩුවෙන් ඉල්ලා සිටීමට ප්‍රාන්ත රාජ්‍යයන්ට ඉඩලබා දීම.

IV. ප්‍රාන්ත ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ බලය මධ්‍යම ආණ්ඩුව සතුවීම.

V. මහ ඇමතිවරුන්ට එරෙහිව කොමිෂන් සභා පත්කිරීමේ බලය.

VI. සමස්ථ ඉන්දීය සේවාවන් පාලනය කිරීම මඟින්.

3. මූල්‍ය සම්බන්ධතා

I. මධ්‍යම ආණ්ඩුව නියම කරන ප්‍රාන්ත රාජ්‍ය විසින් එකතු කළ යුතු බදු.

II. මධ්‍යම ආණ්ඩුව නියම කරන ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බදු.

III. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය අතර බෙදා ගැනීම හා එකතු කරන බදු.

IV. මධ්‍යම ආණ්ඩුව විසින් ප්‍රාන්ත රාජ්‍යයන්ට සැපයෙන මූල්‍ය ආධාර.

V. මුදල් කොමිෂම හරහා. **(ලකුණු 08 යි)**

නිගමනය

❖ ඉහතින් දැක්වුනේ මධ්‍යම - ප්‍රාන්ත සම්බන්ධතා පාලනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් යොදා ඇති විධිවිධානයන්ය.

❖ මෙම විධිවිධාන මඟින් ප්‍රාන්ත තම අණසක යටතේ තබා ගැනීම මධ්‍යම ආණ්ඩුවට හැකිවී තිබේ.

❖ එම නිසයි ඉන්දීය සන්ධීය ක්‍රමය ඒකීයත්වයට ලංවූ අර්ධ සන්ධීය ක්‍රමයක් ලෙස විචාරකයින් හඳුන්වන්නේ. **(ලකුණු 01 යි)**

4. (IV)

අන්තර්ජාතික දේශපාලනයේ ක්‍රියාධරයින් සහ ඔවුන්ගේ ක්‍රියාකලාපය

❖ **අරමුණ** - අන්තර්ජාතික දේශපාලනයේ ක්‍රියාධරයින් යනු කවරුන්ද ඔවුන් ක්‍රියා කරන්නේ කෙසේද යන කරුණු පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කිරීම.

(ලකුණු 01 යි)

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(අ) **ප්‍රවේශය**

- අන්තර්ජාතික සමාජය තුළ නිදහස්, ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය අන්තර්ජාතික දේශපාලනය ලෙස හැඳින්වේ.
- නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්ට අමතරව අන්තර්ජාතික සංවිධාන (රාජ්‍ය හා රාජ්‍ය නොවන), බහුජාතික සමාගම් සහ අන්තර්ජාතික සමාජයේ බලපෑම් සහගත පුද්ගලයින් යන විචල්‍යයන්ද කාරණාද අන්තර්ජාතික දේශපාලනයේ ක්‍රියාධරයින් ලෙස සළකනු ලැබේ. නමුත් වැදගත්ම සහ බලපෑම් සහගත ක්‍රියාධරයින් වන්නේ නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්ය.

(ලකුණු 01 යි)

(ආ) **අන්තර්ගත කළයුතු මූලික කරුණු**

- වර්තමාන අන්තර්ජාතික සමාජය තුළ මේ වන විට ස්වාධිපති, නිදහස්, ජාතික රාජ්‍යයන්ගේ සංඛ්‍යාව 200ක් ඉක්මවා ගොස් ඇත.
- මෙම සෑම ක්‍රියාධරයෙක්ම අන්තර්ජාතික දේශපාලනය තුළ ක්‍රියාකරන්නේ ජාතික ආශාවන් වර්ධනය කර ගැනීම උදෙසාය. මෙම ජාතික ආශාවන් ලෙස ධනය, බලය හා ව්‍යාප්තිය යන ආශාවන් තුන පෙන්වා දිය හැක.
- මෙම ප්‍රධාන ජාතික ආශාවන් තුන හා බැඳී පවතින අනෙක් ආශාවන් ලෙස පහත සඳහන් ඒවා දැක්විය හැක.
  - I. ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම
  - II. ජාතික ආර්ථිකය වර්ධනය කරගැනීම
  - III. ජාතික ශුභ සාධනය ඉහළ නැංවීම
  - IV. ජාතික මතවාදය ආරක්ෂා කරගැනීම
  - V. ජාතික අභිමානය ආරක්ෂා කර ගැනීම
- අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන් තම ජාතික ආශාවන් සපුරා ගැනීම සඳහා ක්‍රියාකරන්නේ විදේශ ප්‍රතිපත්තිය මඟිනි. විදේශ ප්‍රතිපත්තිය සාමකාමී සම්බන්ධතා පැවැත්වීම මෙන්ම උපායෝපිත සම්බන්ධතා පැවැත්වීමද ඉලක්ක කරගත් එකක් වේ.
- රාජ්‍යයක් විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්නේ පහත දැක්වෙන මෙවලම් ප්‍රයෝජනයට ගනිමිනි.
  - I. රාජ්‍ය උපාය ක්‍රම - තානාපති උපාය ක්‍රම
  - II. ආර්ථික බලය
  - III. ප්‍රචාරණය සහ විනිවිද යාම (රහස් ඔත්තු සේවා මඟින්)
  - IV. යුද්ධය
- රාජ්‍යයන් තම ජාතික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහත දැක්වූ I,II,III මෙවලම් භාවිතයට ගැනීම අසාර්ථක වූ විට යුද්ධය අවසාන වශයෙන් භාවිතයට ගනී. **(ලකුණු 08 යි)**
- ඉහතින්ද සඳහන් කළ පරිදි අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධානම සහ බලපෑම් සහගත ක්‍රියාධරයින් වන්නේ නිදහස්, ස්වාධිපති ජාතික රාජ්‍යයන්ය. අන්තර්ජාතික සංවිධාන, බහුජාතික සමාගම් සහ වැදගත් පුද්ගලයින් රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ බල අරගලය කෙරෙහි පවතින යම් ආකාර සීමාවන් වේ. මේවායේ ක්‍රියාකලාපය තීරණය වන්නේ ඒවාට රාජ්‍යයන් අවනත වනවාද නැද්ද යන්න මතය.
- රාජ්‍යයන්ගේ හැසිරීම හා ක්‍රියාකාරිත්වය මතයි අන්තර්ජාතික සමාජය තුළ යුද්ධය හෝ සාමය පවතිනවාද යන්න තීරණය වන්නේ. **(ලකුණු 01 යි)**

4. (IV)

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය

- ප්‍රශ්නයේ අරමුණ: රාජ්‍ය ප්‍රතිපත්ති යනු මොනවාද සහ ඒවා සම්පාදනය කිරීම හා සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම.
- පිළිතුර තුළ අඩංගු විය යුතු මූලික කරුණු

(අ) **ප්‍රවේශය**

- ආණ්ඩුව විසින් කුමක් කළ යුතුද නැතිනම් නොකළ යුතු යන්න පෙන්වා දෙන ප්‍රතිපත්ති රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස හඳුන්වා දිය හැක.
- වෙනත් ආකාරයකට කියනවා නම් රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් සඳහන් කරන්නේ දේශපාලන රැගුම්කරුවෙකු හෝ කණ්ඩායමක් විසින් තමන්ට පැවරී ඇති බලය යටතේ යම් දෙන ලද තත්වයක් තුළ සාක්ෂාත් කරගත යුතු ඉලක්ක හා ඒවා සාක්ෂාත් කර ගන්නා ආකාරය දැක්වෙන අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ තීරණ වලින් සමන්විත ප්‍රතිපත්ති මාලාවක්ය.
- ඉතාම සරල වශයෙන් කියනවා නම් රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරන්නේ කාලීනව මුහුණ දෙන ප්‍රශ්න විසඳීම සඳහා ආණ්ඩුව විසින් තීරණය කොට ක්‍රියාවට නංවන ප්‍රතිපත්තීන්ය. **(ලකුණු 01 යි)**


Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) අන්තර්ගත කළයුතු මූලික කරුණු

❖ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය අතිශය සංකීර්ණ ක්‍රියාවලියක් වේ. ඒ හා සම්බන්ධතා පාර්ශවකරුවන් පහත සඳහන් පරිදි වේ.

I. විධායකය
II. ව්‍යවස්ථාදායකය
III. පරිපාලන නිලධාරීන් හා පරිපාලන ආයතන
IV. දේශපාලන පක්ෂ
V. බලපෑම් කණ්ඩායම්
VI. වෙනත් සිවිල් සංවිධාන
VII. පුද්ගලයින්
VIII. අධිකරණය -නීති අර්ථකථනය කිරීම හරහා
IX. ජනමාධ්‍ය

❖ රාජ්‍ය ප්‍රතිපත්ත් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ ක්‍රියාවලිය පෙන්නුම් කරන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රය මඟිනි. එය පහත සඳහන් පරිදි වේ.



(ලකුණු 08 යි)

(ඇ) නිගමනය:

❖ ආණ්ඩුවක ක්‍රියාකාරීත්වය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති බෙහෙවින්ම වැදගත් වේ ආණ්ඩුව විසින් කුමක් කරනවාද නැතිනම් කුමක් නොකරනවාද යන්න පෙන්වා දෙන්නේ එමඟිනි.

❖ ආණ්ඩුව විසින් කුමක් නිපදවනවාද ඒවා ජනතාවට ලබා දෙන්නේ කෙසේද යන්න පෙන්වා දෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති මඟිනි.

❖ රාජ්‍ය ප්‍රතිපත්ති වල සාර්ථක - අසාර්ථකභාවය උඩ ආණ්ඩුවේ පැවැත්ම තීරණය වේ.

(ලකුණු 01 යි)

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

C කොටස

ප්‍රශ්න අංක 05

නිදහස් ව්‍යාපාරය තුළ ලංකා ජාතික සංගමයේ භූමිකාව සාකච්ඡා කරන්න.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් දේශපාලන නිදහස ලබා ගැනීමේ අරමුණෙන් ලංකාවේ බිහි වූ විවිධ සමාජ ව්‍යාපාර අතරින් ප්‍රමුඛස්ථානය දැරූ ලංකා ජාතික සංගමයේ වැදගත්කම හා ක්‍රියාකලාපය පිළබඳ අපේක්ෂයකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

ප්‍රවේශය

ලංකාව බ්‍රිතාන්‍යය යටත් විජිත පාලනයෙන් මුදවා ගැනීම අරමුණු කරගත් සමාජ ව්‍යාපාරවල ආරම්භය සහ ක්‍රියාකාරීත්වය 19 සියවස අග භාගයේදී සහ 20 වන සියවසේ ආරම්භයේදී දකින්නට ලැබුනි. වර්ගය, ආගම, ප්‍රදේශ සහ මතවාද පදනම් කරගෙන බිහිවූ මෙම ව්‍යාපාර අතරින් ජාතික සමගිය, සහ ජාතික සංහිදියාව පිළිබිඹු කරමින් ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ඉලක්ක සහිතව ජාතික මට්ටමින් බලපෑම් කළ සංවිධානය ලෙස 1919 දෙසැම්බර් 11 වන දින ලංකා ජාතික සංගමය ස්ථාපිත කරන ලදි.

ලකුණු 02 යි

ස්වභාවය සහ අරමුණු

- ප්‍රාදේශීය හා වාර්ගික ලක්ෂණ මෙන්ම පොදු ලක්ෂණ සහිත සංවිධාන සහ කණ්ඩායම් කිහිපයකින් සමන්විත ඡත්‍ර සංවිධානයක් විය.
- පූර්ණ නිදහස නොව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය යටතේ ස්වයං පාලනයක් සහිත සාමාජික රටක් වීම සඳහා ඉල්ලා සිටීම.
- බටහිර අධ්‍යාපනය ලැබූ මධ්‍යම පන්තිය විසින් නායකත්වය දරනු ලැබීම.
- ක්ෂණික සහ දිගු කාලීන වැඩ සටහන් හා අරමුණු සහිත වීම.
- අරමුණු ළඟා කර ගැනීම සඳහා වූ ක්‍රම සහ උපාය මාර්ග අතින් ජාතිකවාදීන් යන්නෙන් කණ්ඩායම් දෙකක් විය.
- අරමුණු සාක්ෂාත් කර ගැනීමට වඩා පිළිගත් ක්‍රමවේදය පිළිපැදීමෙහිලා වඩා අවධානය යොමු කරන ලදී.

ලකුණු 04 යි

භූමිකාව

නිදහස් ව්‍යාපාරය තුළ ලංකා ජාතික සංගමයේ භූමිකාව මාතෘකා තුනක් යටතේ සාකච්ඡා කළ හැක.

1. මෙවලමක් ලෙස
2. වේදිකාවක් ලෙස ක්‍රියා කිරීම
3. ක්‍රියාධරයෙක් ලෙස ක්‍රියා කිරීම

මෙවලමක් ලෙස ක්‍රියා කිරීම

මෙවලමක් වීම යනුවෙන් අදහස් කරන්නේ ලංකා ජාතික සංගමය සහ එහි නායකයන් තම අරමුණු, ඉලක්ක සහ වැඩ සටහන් සාක්ෂාත් කර ගැනීමෙහිලා ක්‍රියා කළ ආකාරයයි.

- මෙයින් එකක් වන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත ආණ්ඩුවට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඉල්ලීම් නෛතික ලෙස ඉදිරිපත් කිරීමෙනි. දෙවනුව ස්වයං පාලනය හා ජතික නිදහස දිනාගැනීම උදෙසා ප්‍රදේශීය වාර්ගික සහ මතවාදී ලෙස බෙදී සිට ලාංකිකයන් එකට එක්තැන් කරමින් පොදු ජාතික හඬක් ජාතික සංගමය විසින් ඉදිරිපත් කිරීම. තුන්වනුව ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව වැඩිකරන ලෙස ඉල්ලා සිටීම. සිව්වෙනුව ලංකාවට ස්වයං පාලනය ලබාගැනීමෙහිලා සුපරීක්ෂාකාරීව ගමන්කල වාහනයක් ලෙස ක්‍රියාත්මක වීම. පස්වෙනුව ස්වයංපාලන ඉලක්ක ලඟාකරගැනීමෙහිලා මහජනතාව පිළිගැන්වීමට ක්‍රියාකිරීම. එනම් ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් ස්වයං පාලනය හා ජාතික නිදහස ලබා ගැනීමෙහිලා ප්‍රාදේශීය, වර්ගය සහ මතවාදී ලෙස බෙදී සිටි ලාංකිකයන් එක් ඡත්‍රය යටතේ එක්සත් කර ඉහත ඉල්ලීම් පොදු ජාතික හඬක් ලෙස ඉදිරිපත් කරන ලදි.

  ව්‍යවස්ථාදායකට තෝරා ගනු ලබන නියෝජිතයන්ගේ සංඛ්‍යාව වැඩිකර නියෝජිත රජයක් සඳහා වූ ඉල්ලීම් දිනා ගැනීම සුලභ කළේය.

  ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලීම්වල ප්‍රතිඵලයෙන් කලින් කළ හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රම ක්‍රමයෙන් වෙනස්කම්වලට ලක් වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය ඇතිවීමට හේතු විය.

  ලංකාවට ස්වයං පාලනයක් ලබා ගැනීමෙහිලා සුපරීක්ෂාකරීව ගමන් කළ වාහනයක් ලෙස ක්‍රියාත්මක විය.

  ස්වයං පාලනය ඉලක්කය ලඟ කර ගැනීමේලා මහජනයාව දිරිගැන්වීමට උත්සුක විය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

වේදිකාවක් ලෙස භූමිකාව
වේදිකාවක් වීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ අවසන් දශකයන්හි (1919-1947) ලංකාව මුහුණදුන් සමාජ, දේශපාලන, ආර්ථික හා පරිපාලන ගැටළු සම්බන්ධයෙන් ස්වාධීනව අදහස් හුවමාරු කර ගැනීමේ, තීරණ ගැනීමේ සහ සැළසුම් කිරීමේ වේදිකාවක් ලෙස ලංකා ජාතික සංගමය ලෙස ක්‍රියාත්මක වීමය. මෙය සංගමය තුළ සිටි ප්‍රතිසංස්කරණවාදීන් සහ ඒ.ඒ. ගුණසිංහ වැනි රැඩිකල්වාදීන් අතර තිබූ ප්‍රතිවිරුද්ධ අදහස් සමනය කර ගැනීමට ඉවහල්වූ ආකාරය දෙනස බලන විට පැහැදිලිවේ.

ක්‍රියාධරයෙක් ලෙස භූමිකාව
ජාතික සංගමයේ ක්‍රියාධරයෙකුගේ භූමිකාව පෙර සඳහන් කළ භූමිකාවන්ට වඩා වැදගත් වූ අතර පසු ලංකා දේශපාලනයේ ගැඹුරු ලෙස බලපෑම් ඇති කළ භූමිකාවක් ලෙස ද සැලකිය හැක. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් ලංකාවට ස්වයං පාලනයක් ලබා ගැනීමේ ජාතික සංගමයේ ඉලක්කය ළඟාකර ගැනීම සඳහා යොදාගත් ක්‍රමවේද ඇත්ත වශයෙන්ම ලංකා දේශපාලනයට පෞරාණිකවාදය හා ලිබරල්වාදී ලක්ෂණ පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ, අගයන් හා සම්ප්‍රදායන් හඳුන්වා දීමෙහි ලා දායක විය.

ලකුණු 10 යි

ඇගයීම
1870 ගණන්වල සිට බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට එරෙහිව ලාංකික ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයේ ලංකා ජාතික සංගමයේ බිහිවීම හැරවුම් ලක්ෂයක් ලෙස සැලකිය හැක. අනික් පැත්තෙන් යටත් විජිත පාලනයෙන් ලංකාව මුදවා ගැනීම සඳහා වූ උත්සාහයන් ආගමික, සමාජ හා දේශපාලන බහු මුහුණුවරක් ගනු ලැබීය. ඒ උත්සාහයන් අතර දේශපාලන උත්සාහයන් සෙසු ඒවාට වඩා ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ ඇති කර බලපෑමේ ප්‍රමාණය අනුව වැදගත් තැනක් ගනී. එහෙත් මෙවැනි දේශපාලනික බලපෑම් ජාතික සංගමයේ ජාතිකත්ව ක්‍රියාකාරීත්වයෙන් පමණක් ඇතිවුනේ යයි කිව නොහැකිය. එයට පරිබාහිරව ගත් ක්‍රියාමාර්ගයන් මඟින්ද බලපෑම් ඇති කරන ලදි. විශේෂයෙන් කම්කරු ව්‍යාපාරය සහ වාමාංශික ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයද මේ පිළිබඳව වැදගත් වේ.
එහෙත් ජාතික ව්‍යාපාරයේ සීමාසහිත අරමුණු හා ඒවා ළඟාකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරීත්වය, භාරදූරවාදී ව්‍යාපාරය මෙන් එයට මහජන පදනමක් නොමැති වීම සහ රැඩිකල්වාදීන්ගේ අදහස් හා ක්‍රියාකාරීත්වයන් ආන්තික කිරීම යන හේතු සාධකයන් නිසා ජාතික සංගමයේ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේදී පසුබෑමට ලක් වූ අතර ඉන්දීය ජාතික සංගමය මෙන් ගැඹුරු බලපෑම් ඇති කිරීමට සමත් නොවීය. මේ හේතුවෙන් ලංකා ජාතික සංගමය නියම ජාතික ව්‍යාපාරයක් ලෙස නොව හුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් ලෙසයි ක්‍රියා කළේ.

ලකුණු 04 යි

6. පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් විභාග කරන්න.

I. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය
II. සුළු ජන කොටස් සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැපයූ ආරක්ෂණ
III. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දුන් නවාංග
IV. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දුන් ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් සිදු කළ වෙනස්කම්

I. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය

අරමුණ
මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ගොඩ නගන ලද විධායක කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ ව විභාග අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම ය.

හැඳින්වීම
ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගොඩ නගන ලද ආණ්ඩු ක්‍රමය මූලික වශයෙන් කාරක සභා ක්‍රමය මත පදනම් විය. මෙම ක්‍රමය ගොඩ නැගීමෙන් අපේක්ෂා කළේ පාලන බලතල පමණක් නොව පාලන වගකීම් ද ව්‍යවස්ථාදායකයේ ලාංකික සාමාජිකයන් වෙත ලබා දීමය. මේ අනුව රාජ්‍ය මන්ත්‍රණ සභාවට පැවරුණු ව්‍යවස්ථාදායක කටයුතු ඒ මණ්ඩලය සමස්ථයක් ලෙස රැස් වී ක්‍රියාවට නංවන ලද අතර, එයට හිමි වූ විධායක කටයුතු ඒ මණ්ඩලය කාරක සභා හතකට බෙදී එමගින් ක්‍රියාවට නංවනු ලැබිණි. ක්‍රතානායකවරයා සහ රාජ්‍ය නිළධාරීන් තිදෙනා හැර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සෙසු සෑම සාමාජිකයෙකුම කාරක සභා හතෙන් කිනම් හෝ කාරක සභාවක සාමාජිකයෙකු වීම අවශ්‍ය විය. එක් එක් කාරක සභාවේ සාමාජිකයන් විසින් රහස් ඡන්දයෙන් සභාපතිවරයෙකු බැගින් තෝරාගන්නා ලදි. සභාපතිවරයා නියම කල විටක හෝ කාරක සභාවේ සාමාජිකයන් තිදෙනෙකුවත් ඉල්ලා සිටි විටක එහි ලේකම්වරයා විසින් විධායක කාරක සභාව කැඳවනු ලැබිණි. කාරක සභාවකට අයත් ඕනෑම කටයුත්තක් ක්‍රියාත්මක කිරීමට නම් එහි සභාපතිවරයා සහ ලේකම්වරයාට අතිරේකව අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකු වත් කාරක සභාවට පැමිණ සිටිය යුතු ය. විධායක කාරක සභාවක් ඉදිරියේ ඇති සෑම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ම තීන්දු ගත යුත්තේ එයට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙනි. විධායක කාරක සභාවක රැස්වීමකට සභාගි වීමටත් එහි සාමාජිකයන් ඇමතීමටත් මහලේකම්වරයාට බලය තිබුණි.

ලකුණු 02 යි

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ක්‍රියාකාරීත්වය

එක් එක් කාරක සභාව වෙත පැවරී තිබුණු ප්‍රධාන කාර්ය වූයේ ඒ ඒ කාරක සභාවට අයත් දෙපාර්තමේන්තුවල විෂයයන් සහ කාර්යයන් සම්බන්ධයෙන් සාමාන්‍ය පරීක්ෂාවක් කිරීම ය. මේ යටතේ පහත සඳහන් කාර්යයන් එයට අයත් විය. එනම්,

1. කාරක සභාවලට අයත් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම
2. අතිරේක ඇස්තමේන්තු පිළියෙල කිරීම
3. විධායක කාරකසභා විෂයන්ට අදාළ නීති කෙටුම්පත් සළකා බැලීම
4. විධායක කටයුතු සළකා බැලීම

මෙම කාර්යයන් අතුරෙන් වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ අතිරේක ඇස්තමේන්තු පිළියෙල කිරීම කාරක සභාවල ප්‍රධාන කාර්ය වූ අතර ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ මුල් අවධිය තුල කාරක සභා සීය කාලයෙන් වැඩි කොටසක් වෙන් කලේ මේ සඳහා ය.

කල් යත්ම ඇතැම් විට විධායක කාරක සභා සහිකයන් විසින් මෙම කාර්යය මහා භාණ්ඩාගාරයට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බාර කරනු ලැබිණි.

අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන සියළු ව්‍යවස්ථාදායක යෝජනාවලට ඒ ඒ විධායක කාරක සභාවේ අනුමැතිය අවශ්‍ය විය. මේ සඳහා එවැනි යෝජනා විධායක සභාව තුල සාකච්ඡාවට ලක් විය.

මේ හැර පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ද විධායක සභා මැදිහත් විය. එසේ වුවද ඉතාමත් සුළු කරුණු සම්බන්ධයෙන් වුව ද තීරණ ගැනීමට කාරක සභා වැඩි කාලයක් වැය කළේය.

විධායක කාරක සභාවලට පැවරී තිබුණු කටයුතු අධික වීම නිසා ඒවාට නිරතුරුවම රැස්වීමට සිදු වුනි. මුල් කාලය තුල විධායක කාරක සභා විසින් තීරණ ගන්නා ලද්දේ වැඩි ඡන්දයෙනි. පසු කාලයේ දී ඒකමතික ව තීරණ ගැනීමට කාරක සභා වැඩි වශයෙන් නැඹුරු විය.

මේම මූලික කරුණු වලට අතිරේකව වඩා සාර්ථක පිළිතුරක පහත සඳහන් කරුණු ද ඇතුලත් විය හැකිය.

එනම් විධායක කාරක සභාවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුල ප්‍රජාතන්ත්‍රවාදී භාවයක් පැවතීම, සහිකයන් වගකීමෙන් ක්‍රියා කිරීමට පෙළඹීම, පෞද්ගලික මන්ත්‍රීවරයාගේ නිදහස විධායක කාරක සභාවල ක්‍රියාකාරීත්වය තුලින් ආරක්ෂා වීම, කාරක සභාවල ක්‍රියාකාරීත්වය මන්දගාමී වීම, කාරක සභා අතර සම්බන්ධීකරණයක් නොමැති වීම යනාදි කරුණු දැක්විය හැකි ය. **ලකුණු 07 යි**

නිගමනය

මෙම පිළිතුරෙන් කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය පමණක් නොව කාරක සභා ක්‍රමයේ යහපත් සහ අයහපත් ලක්ෂණ ද සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

ලකුණු 01 යි

II. සුළු ජන කොටස් සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැපයූ ආරක්ෂණ

අරමුණ

මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ සෝල්බරි ව්‍යවස්ථාව මගින් මෙරට වාසය කරන සුළු ජන කොටස් සඳහා සපයන ලද ආරක්ෂණ විධිවිධාන මොනවාද යන්න හඳුනා ගනිමින් ඒ පිළිබඳ පරීක්ෂා කිරීමක් සිදු කිරීම ය.

හැඳින්වීම

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුළු ජන කොටස් සඳහා ආරක්ෂණ විධිවිධාන යොදන ලද්දේ බහුතර ජන කණ්ඩායමට අයත් නියෝජිතයන්ට පාලන කටයුතු සම්බන්ධයෙන් අසීමිත බලතල ලැබුණහොත් එම බලය සුළු ජන කණ්ඩායම්වලට අවාසි ආකාරයට යෙදවිය හැකිය යන තර්කය මතය. මේ අනුව සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථානුකූල විධිවිධාන ගණනාවක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කරන ලදි.

ලකුණු 01 යි

ආරක්ෂණ

29 (2) වගන්තිය

සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පැවති විධිවිධාන අතුරින් ප්‍රබලතම විධිවිධානය වූයේ මෙයයි. මෙම විධිවිධානය මගින් අපේක්ෂා කලේ ආගමික පදනමින් හෝ වෙනත් විශේෂිත පදනමකින් සුළු ජන කොටස් වලට අවාසි ඇති වන ආකාරයට නීති පැනවීම තහනම් කිරීමය. මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතර පක්ෂයට 2/3 කට වැඩි බලයක් එම මණ්ඩලය තුල ලබා ගැනීමට හැකියාවක් නොලැබෙනු ඇත යන උපකල්පනය මත මෙම විධිවිධානය ව්‍යවස්ථාවට ඇතුළු කරන ලදි.

බහු මන්ත්‍රී ආසන ක්‍රමය

මෙමගින් අපේක්ෂා කලේ දිවයිනේ ඇතැම් ප්‍රදේශවල ප්‍රධාන ජනවර්ගය සමග මිශ්‍රව සිටින සුළු ජන කොටස්වලට මහජන මන්ත්‍රී මණ්ඩලය තුල නියෝජිතයන් සැපයීම ය. මෙම අරමුණින් 1946 සීමා නිර්ණය කොමිසම විසින් බදුල්ල, බලන්ගොඩ, කඩුගන්නාව, අම්බලන්ගොඩ- බලපිටිය සහ මැද කොළඹ බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශවලට බෙදා වෙන් කල අතර 1959 සීමා නිර්ණය කොමිසම විසින් දකුණු කොළඹ, මැද කොළඹ, අකුරණ. මඩකළපුව සහ මුතූර් යන ඡන්ද කොට්ඨාශ බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ වශයෙන් පිහිටුවන ලදි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

මහජන මන්ත්‍රී මණ්ඩලයට නාමකාරණයෙන් මන්ත්‍රීවරු සය දෙනෙකු පත් කිරීම

පැවති නියෝජන ක්‍රමය යටතේ මහ මැතිවරණයෙන් පසුව ප්‍රමාණවත් නියෝජනයක් ලබා ගැනීමට නොහැකි වූ සුළු ජන කොටස් සිටී නම් ඔවුනට නියෝජනයක් සැපයීම සඳහා මෙම විධිවිධානය යොදන ලදි.

සෙනේට් මණ්ඩලය

මෙම මණ්ඩලය සුළු ජන කොටස්වලට නියෝජනයක් ලැබෙන පරිදි සකස් කිරීම මගින් සෙනේට් මණ්ඩලය තුල සුළු ජන කොටස් වෙනුවෙන් යම් හඬක් මතුවිය හැකි බව අපේක්ෂා කෙරිණි. මේ අනුව අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු විසින් සුළු ජාතීන් වෙනුවෙන් පිරිසක් සෙනේට් මණ්ඩලයට පත් කිරීමට විධිවිධාන යොදන ලදි.

රාජ්‍ය සේවා කොමිසම

මෙම කොමිසම පිහිටුවන ලද්දේ සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අදහසින් නොවුවද, කොමිසම පිහිටුවීම සඳහා වූ විධිවිධාන සහ කොමිසම ක්‍රියාත්මක වූ ආකාරය සුළු කණ්ඩායම්වලට අයත් රාජ්‍ය සේවකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට යම් පිටුබලයක් සැපයිනි.

ලකුණු 07 යි

නිගමනය

අපේක්ෂකයාගේ පිළිතුර වඩා හොඳ පිළිතුරක් වීමට නම් ඉහත සඳහන් විධිවිධාන සඳහන් කිරීමට අමතරව එම විධිවිධාන සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා වීමට ඉවහල් වූයේ ද නැද්ද යන්න නිදසුන් සහිතව සාකච්ඡා විය යුතු ය.

ලකුණු 02 යි

III. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් නවාංග

අරමුණ

මෙම ප්‍රශ්නයට ලබා දෙන පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ 1972 ව්‍යවස්ථාව, පැවති සොල්බරි ව්‍යවස්ථාවෙන් සහ එම ව්‍යවස්ථා රාමුවෙන් වෙන් වූයේ කුමන කරුණු වලින් ද යන්න පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම ය. එබැවින් වඩා හොඳ පිළිතුරක් වීමට නම් 1972 ව්‍යවස්ථාවෙහි ඇතුලත් නවාංග පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබෙන බව පිළිතුරෙන් ප්‍රකාශ විය යුතු ය.

හැඳින්වීම

මෙම ව්‍යවස්ථාව ප්‍රථම සමූහාණ්ඩු ව්‍යවස්ථාව වශයෙන් ද බහුලව හඳුන්වනු ලැබේ. මෙම ව්‍යවස්ථාවෙහි පවතින සුවිශේෂ ලක්ෂණ වන්නේ එතෙක් පැවති සෝල්බරි ව්‍යවස්ථාවට වෙනස්ව නව අංග ලක්ෂණ ගණනාවක් එම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දීම ය.

ලකුණු 01 යි

නවාංග

1972 ව්‍යවස්ථාවෙහි ඇතුලත් නවාංග වශයෙන් පහත සඳහන් අංග හඳුනාගත හැකිය. එනම්,

1. ප්‍රථමවරට එම ව්‍යවස්ථාව මගින් සමූහාණ්ඩුක්‍රමයක් ඇති කිරීම,
2. ජාතික රාජ්‍ය සභාව ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන ඒකායන නියෝජිතයා බවට පත් කිරීම
3. විධායකය සම්බන්ධයෙන් පැවති සංවරණ හා තුලන විධිවිධාන ඉවත් කිරීම
4. ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් බවට අවධාරණය කිරීම
5. රාජ්‍ය හා ආගම අතර සම්බන්ධතාවයට ව්‍යවස්ථානුකූල පදනමක් ලබා දීම
6. සිංහල භාෂාව එකම නිළ භාෂාව බවට ව්‍යවස්ථාවෙන් පත් කිරීම
7. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම මාලාවක් සහ මූලික අයිකිවාසිකම් ප්‍රකාශනයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
8. නාමික විධායකය වශයෙන් අගමැතිවරයා විසින් පත් කරනු ලබන ජනාධිපති නිළයක් පිහිටුවීම
9. පනත් නොව පනත් කෙටුම්පත් පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම යනාදි ය දැක්විය හැකිය.

ලකුණු 08 යි

නිගමනය

1972 ව්‍යවස්ථාවෙහි ඇතුලත් නවාංග ලෙසින් හඳුනාගත හැක්කේ ඉහත සඳහන් කරුණු ය. සාර්ථක පිළිතුරක මෙම අංග සඳහන් කිරීම පමණක් නොව ඒවා ප්‍රුඵල් වශයෙන් සාකච්ඡා ලක් කිරීම ද සිදුව තිබිය යුතුය.

ලකුණු 01 යි

IV. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දුන් ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් සිදු කළ වෙනස්කම්

අරමුණ

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ 1978 ව්‍යවස්ථාවෙන් ගොඩ නගන ලද ජනාධිපති නිලයට අයත් බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් 19 වන අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කුමන වෙනස්කම් සිදු කලේ ද යන්න පිළිබඳව අපේක්ෂකයා තුල පවතින දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම ය.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

හැඳින්වීම

මෙම සංශෝධනය මගින් මුල දී අපේක්ෂා කල ආකාරයට ජනාධිපති ධූරය හෝ එයට අයත් විධායක බලතල මුළුමනින්ම අහෝසි කිරීමට නොහැකි වුව ද, ජනාධිපතිවරයාගේ බලතල කිසියම් ප්‍රමාණයකට අඩු කරන ලදි. එමෙන්ම ජනාධිපතිගේ නිළ කාර්යයන්හි වෙනස්කම් කිහිපයක් ද සිදුකරන ලදි.

ලකුණු 01 යි

බලතල සම්බන්ධයෙන් සිදුකළ වෙනස්කම්

මේ සංශෝධනය යටතේ ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු මෙන්ම එහි මුලසුන හොබවන පුද්ගලයා වුවද කැබිනට් ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු සහ නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සම්බන්ධයෙන් භුක්ති විඳින ලද බලතල කිසියම් සීමා කිරීමකට ලක් කර ඇත.
19 වන සංශෝධනයට අනුව කැබිනට් ඇමතිවරු පත් කරන විට ඔහු/ඇය ක්‍රියාකල යුතු වන්නේ අගමැතිවරයාගේ උපදෙස් වලට අනුවය.

විෂයයන් සහ කාර්යයන් පැවරීමේ දී මෙන්ම අමාත්‍යාංශවල සංඛ්‍යාව තීරණය කිරීමේ දී ජනාධිපතිවරයාට ඒ පිළිබඳ අවසන් තීරණය ගත හැකි වුවද, එය කලයුතු වන්නේ අගමැතිවරයාගේ අදහස් විමසීමෙනි.

එමෙන්ම පෙරදී මෙන් නොව අමාත්‍ය ධූර සංඛ්‍යාව සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූල සීමාවක් ද පවතී.

19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර ජනාධිපතිවරයාට අගමැතිවරයාව සිය ධූරයෙන් ඉවත්කල හැකි වුවද මෙම සංශෝධනය යටතේ එය කල නොහැකි ය. මෙය ද ජනාධිපතිවරයාගේ බලයට ඇති සීමාවකි.

මුල් ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව මුල් වරට රැස්වීමෙන් වසරකට පසුව ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකියාව තිබුණි. මෙයට දැන් සීමාවක් පැනවී ඇත. ඒ අනුව වසර පහක් වන පාර්ලිමේන්තුවේ නිළ කාලයෙන් වසර හතර හමාරක් ඉක්ම වන තෙක් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහැක. එබැවින් 2001- 2003 අතර කාලය තුල සිදුවුනු ආකාරයේ ක්‍රියාවක් නැවත සිදු නොවනු ඇත.

ජනාධිපතිවරයාගේ මුක්තිය සීමා කිරීම ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් සිදුකල අනෙක් වෙනසයි. 19 වන සංශෝධනය යටතේ දැන් ජනාධිපතිවරයාව නිල කරුණු සම්බන්ධයෙන් අධිකරණයට කැඳවිය හැකිය. ඒ අනුව ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ජනතාවට හැකියාව ඇත. මේ අනුව ඔහුගේ නිළ කටයුතු මූලික අයිතිවාසිකම් යටතේ අධිකරණ විවරණ බලයට යටත්වනු ඇත.

මෙම සංශෝධනය මගින් ව්‍යවස්ථා සභාවක් ස්ථාපිත කරනු ලබයි. එම සභාව විසින් ජනාධිපතිවරයා කලින් හොබවන ලද විධායක බලතල වලින් සමහරක් ක්‍රියාවට නංවනු ලැබීම හේතුවෙන් ජනාධිපතිවරයාගේ බලතල වලින් සැළකියුතු ප්‍රමාණයක් අඩුවනු ඇත.

කාර්යයන් සම්බන්ධයෙන් සිදු කල වෙනස්කම්

ඉහත සඳහන් ආකාරයට බලතල සම්බන්ධයෙන් සිදු කරන ලද වෙනස්කම් වලට අතිරේකව ජනාධිපතිවරයාගේ කාර්යයන් සම්බන්ධයෙන් වෙනස්කම් කිහිපයක් මෙම සංශෝධනය යටතේ සිදු කෙරිණි. මේ යටතේ,
ජාතික ප්‍රතිසංධානය සහ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ කොමිසන් සභාවල නිසි ක්‍රියාකාරිත්වය පහසු කරලීමට ක්‍රියා කිරීම

මැතිවරණ කොමිසන් සභාවේ උපදෙස් මත නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම යනාදී රටතුල ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ඉවහල් වන කාර්යයන් ජනාධිපතිගේ කාර්ය භාරයට ඇතුලත් කර තිබේ.

ලකුණු 07 යි

නිගමනය

වඩා සාර්ථක පිළිතුරක ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් සිදුකල වෙනස්කම් පමණක් නොව කාර්යයන් සම්බන්ධයෙන් සිදුකල වෙනස්කම් ද සාකච්ඡා ලක්ව තිබිය යුතුය. 19 වන සංශෝධනය මඟින් ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන් අඩු කළ බැවින් ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රමයෙහි ඉසිලූ තත්වය පහත වැටුනු 'අතර නව සංවරණ හා තුලන ක5මය හඳුන්වා දී ඇත.

ලකුණු 02 යි

ප්‍රශ්න අංකය 07
පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් විභාග කරන්න.

(i) **ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවනතා.**

(ii) **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් හඳුන්වා දුන් නියෝජන ක්‍රමයේ යහපත් හා අයහපත් අංග ලක්ෂණ.**

(iii) **පූර්ව අධිකරණ විවරණබලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ භූමිකාව.**

(iv) **ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාව**

(v) **ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ.**

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(I) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවනතා.

මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමයේ ස්වභාවය සහ නව ප්‍රවනතා පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීමයි.

ප්‍රවේශය.

1935 දී ලංකා සම සමාජ පක්ෂය පිහිටුවීමත් සමඟ ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භක පදනම වැටුනි. ඉන්පසුව මේ දක්වා වූ අවුරුදු 80ක කාලය තුළ ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමය දෙසට වේගයෙන් වර්ධනය විය. එබැවින් 2015 ජූලි මාසය වන විට ලියාපදිංචි ඇති පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව 64 දක්වා වැඩි වී ඇත. මේ අනුව ශ්‍රී ලංකාව තුළ ඉතාම ඉහළ මට්ටමේ බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන බව පෙනී යයි.

ලකුණු 01 යි

<u>බහු පක්ෂ ක්‍රමයේ වර්ධනයට හේතු වූ සාධක</u>

- ශ්‍රී ලංකාව බහු සමාජයක් වීම.
- දේශපාලන මතවාදවල බලපෑම.
- සමානුපාතික නියෝජන ක්‍රමය.
- පළාත් සභා ක්‍රමයේ බලපෑම.

ලකුණු 01 යි

පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය අනුව කලින් කල නව ලක්ෂණ හා ප්‍රවනතා පැන නැගීම දැකිය හැක. ඒවා පහත සඳහන් වේ.

(අ) **ද්වි සභාග ක්‍රමය**

කුඩා දේශපාලන පක්ෂ ප්‍රධාන පක්ෂ දෙකේ නායකත්වය යටතේ සභාග ලෙස සංවිධානය වීම මෑත කාලීනව දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයකි. මේ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ එක්සත් ජනතා නිදහස් සන්ධානය සහ එක්සත් ජාතික පක්ෂය යටතේ එක්සත් ජාතික පෙරමුණ වශයෙන් ද්වි සභාග පක්ෂ ක්‍රමය මෑත කාලයේ දකින ලක්ෂණයකි.

(ආ) **වාමාංශික දේශපාලන පක්ෂවල බිඳ වැටීම**

1977 න් පසු වාමාංශික දේශපාලන පක්ෂ දුර්වල තත්වයට පත් වී ක්‍රම ක්‍රමයෙන් කඩා වැටීමට ලක් වී ඇත. 1935 සිට ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයේ වැදගත් තත්වයක් ඉසුලූ ලංකා සම සමාජ පක්ෂය සහ ලංකා කොමියුනිස්ට් පක්ෂ විශාල පසුබෑමකට පත් ව ඇත. නව වාමාංශික පක්ෂ කිහිපයක් බිහි වුවද ඒවාද දේශපාලන ක්ෂේත්‍රය තුළ ජනප්‍රිය වීමට සමත් වී නැත.

(ඇ) **මහජන නියෝජිතයන් තම පක්ෂ මාරු කිරීම**

මහජන නියෝජිතයන් තම පක්ෂ මාරු කිරීම සෑම පක්ෂයකම දැකිය හැකි සුලභ ලක්ෂණයක් වී ඇත. විරුද්ධ පක්ෂයේ සිටින නියෝජිතයන් දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් ආණ්ඩු පක්ෂයට මාරුවීම බෙහෙවින්ම දැකිය හැක. මෙය විරුද්ධ පක්ෂය දුර්වල වීමටද හේතු වී ඇත.

(ඈ) **කුඩා පක්ෂ බිහිවීම**

ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයේ මෑත කාලයේ කුඩා පක්ෂ රාශියක් බිහි වී ඇත. එම නිසා දේශපාලන පක්ෂවල සංඛ්‍යාව 64 දක්වා වැඩි වී ඇත. මෙයට තුඩු දුන් ප්‍රධාන හේතූන් වන්නේ වාර්ගික ප්‍රශ්නය, සමානුපාතික නියෝජන ක්‍රමය සහ පළාත් සභා ක්‍රමය යනාදියයි. මෙය මහා මැතිවරණවලින් පසු අස්ථාවර ආණ්ඩු බිහිවීමටත් හේතු වී ඇත.

(ඉ) **හමුදා බලය සහිත දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වය**

ශ්‍රී ලංකාවේ පැවති යුධ අවස්ථාවේදී ආයුධ සන්නද්ධව සිටි සමහර දේශපාලන පක්ෂ නීත්‍යානුකූලව ලියාපදිංචි වෙමින් ඒවා පිළිගත් දේශපාලනපක්ෂ ලෙස පිළිගත් අතර ඒවා ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට ඇතුළත් වී දේශපාලනයේ නියැලීම.

ලකුණු 07 යි

නිගමනය

ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික, සමාජ පරිසරය, ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයේ ස්වභාවය, සහ නියෝජන ක්‍රමයේ බලපෑම යනාදී හේතු සාධක නිසා දේශපාලන පක්ෂ ක්‍රමයේ කලින් කල නව ලක්ෂණ සහ ප්‍රවනතා මතුවෙමින් පවති. ඉදිරි අනාගතයේදී ද, එම තත්වය වර්ධනය වීමට ඉඩ ඇත.

ලකුණු 01 යි

(II) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නියෝජන ක්‍රමයේ යහපත් සහ අයහපත් ලක්ෂණ

අරමුණ

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාවේ වර්තමාන නියෝජන ක්‍රමයේ පවතින යහපත් සහ අයහපත් අංග ලක්ෂණ සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයාගේ අවබෝධය පරීක්ෂා කිරීම ය.

හැඳින්වීම

1978 ව්‍යවස්ථාවෙන් එතෙක් පැවති සරළ බහුතර ක්‍රමය වෙනුවට සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදි. මෙම නියෝජන ක්‍රමයේ ලක්ෂණ අතර යහපත් මෙන්ම අයහපත් ලක්ෂණ ගණනාවක් ම පවති.

ලකුණු 01 යි

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

යහපත් ලක්ෂණ

මෙම නියෝජන ක්‍රමයේ යහපත් අංග ලක්ෂණය වන්නේ පහත සඳහන් ඒවාය.

1. ඇතැම් කොන්දේසි වලට යටත්ව මැතිවරණයක දී ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම්වලට එම ඡන්දවලට අනුකූල වන ආකාරයේ සාධාරණ නියෝජනයක් ව්‍යවස්ථාදායකය තුල ලබා දීමට උත්සුක වීම
2. මෙම නියෝජන ක්‍රමය යටතේ විවිධ දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වලට ව්‍යවස්ථාදායකය තුල උපරිම නියෝජනයක් ලබා ගැනීමේ වැඩි ඉඩකඩක් ලැබීම
3. ව්‍යවස්ථාදායකය තුල හිතුවක්කාරී ලෙස ක්‍රියා කිරීමට ඉඩ ලබා දෙන තරම් අති බහුතර බලයක් තනි පක්ෂයකට ලැබීමේ හැකියාව වළක්වනු ලැබීම
4. ප්‍රබල ආණ්ඩු පක්ෂ සහ ප්‍රබල විරුද්ධ පක්ෂ බිහිවීම මෙම නියෝජන ක්‍රමය මගින් වළක්වනු ලැබීම
5. මෙම නියෝජන ක්‍රමය යටතේ කිසිදු නියෝජිතයෙකුට ඡන්ද කොට්ඨාශය තුල තනි මන්ත්‍රීවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අවස්ථාවක් නොලැබීම

මෙම ලක්ෂණ ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රධාන යහපත් අංග ලක්ෂණ ලෙස හඳුනාගත හැකිය.

ලකුණු 04 යි

සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් ලක්ෂණ මෙන්ම අයහපත් අංග ලක්ෂණ ද ගණනාවක් ම පවතී. ඒවානම්,

1. මෙම නියෝජන ක්‍රමය මගින් ඡන්දදායකයා සහ නියෝජිතයා (මන්ත්‍රීවරයා) අතර සම්බන්ධතාවය බිඳ වැටීම.
2. ප්‍රසාද ආසන ක්‍රමය සමානුපාතික පදනමින් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් අතර ආසන බෙදී යාමට බාධාවක් සේ ක්‍රියා කිරීම
3. මෙම ක්‍රමය යටතේ අතුරු මැතිවරණ පැවැත් වීමක් සිදු නොකරන බැවින් ආණ්ඩුව සම්බන්ධයෙන් මැතිවරණ දෙකක් අතර කාලය තුල ඡන්දදායකයාගේ අදහස් දැන ගැනීමේ අවස්ථාව ඇහිරී යාම
4. මනාප ක්‍රමය හේතුවෙන් පක්ෂ අතර තරගය වෙනුවට පක්ෂ අභ්‍යන්තරයෙහි දැඩි පස මිතුරුකම් උත්සන්න කිරීම. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වීමට මෙය විශාල වශයෙන් හේතු වනු ඇත.
5. විශාල ඡන්ද කොට්ඨාශ ක්‍රමය සෑම තරගකරුවෙකුටම සාධාරණ තරගයකට පසුබිමක් නිර්මාණය නොකිරීම
6. මැතිවරණ දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවලට කිසිදු නියෝජනයක් නොලැබෙන අතර ඇතැම් නාගරික ප්‍රදේශවලට අධි නියෝජනයක් ලැබීම
7. ජාතික ලැයිස්තු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුවේ මුළු සාමාජිකයන්ගෙන් 15% ක් තරම් මන්ත්‍රීවරු පිරිසක් ජනතාවගේ කැමැත්තෙන් නොව පක්ෂ නායකයන්ගේ කැමැත්තෙන් පත් කිරීම නියෝජිත මූලධර්මවලට ඉඳුරාම පටහැනි වීම යන අංග දැක්විය හැකිය.

ලකුණු 04 යි

නිගමනය

ඉහත සඳහන් යහපත් සහ අයහපත් ලක්ෂණවලට අතිරේකව තවත් කරුණු අපේක්ෂකයන් විසින් දැක්විය හැකිය. වඩා හොඳ පිළිතුරක් වීමට නම් හුදු කරුණු දැක්වීමෙන් ඔබ්බට ගොස් උදාහරණ සහිතව ප්‍රමාණවත් විග්‍රහයක් ඉදිරිපත් කිරීම ද අවශ්‍යය.

ලකුණු 01 යි

(III) පූර්ව අධිකරණ විවරණ බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ භූමිකාව

අරමුණ

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ පූර්ව අධිකරණ විවරණ බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ භූමිකාව පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම ය.

හැඳින්වීම

1978 ව්‍යවස්ථාව මගින් ගොඩ නගන ලද ශ්‍රේෂ්ඨාධිකරණයට අයත් කාර්යයන් අතුරින් එක් ප්‍රධාන කාර්යයක් වනුයේ පූර්ව අධිකරණ විවරණ බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් එය සතු භූමිකාවයි. ව්‍යවස්ථාවේ 120 වන වගන්තියට අනුව පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතක විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල දැයි පරීක්ෂා කොට තීන්දු දීමේ තනි හා අනන්‍ය බලය පැවරී තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයටය. පූර්ව අධිකරණ විවරණ බලය යනුවෙන් හඳුන්වන්නේ මෙයයි.

ලකුණු 01 යි

අධිකරණ විවරණ බලය ක්‍රියාවට නංවන ආකාරය

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන සාමාන්‍ය පනත් කෙටුම්පතක් (an ordinary bill) හෙවත් හදිසි නොවන කෙටුම්පතක් සම්මත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කලයුතු ක්‍රියාපිළිවෙත කවරේද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 සහ 121 වන වගන්ති වල සඳහන් ය. ඒ අනුව සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කිරීමට දින 7 කට පෙර ගැසට් පත්‍රයේ පල කලයුතු වේ. එම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් පහත සඳහන් කරුණු මත අභියෝගයට ලක් කිරීමේ අරමුණෙන් රටේ ඕනෑම පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කල හැකිය. එනම්,

1. ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් සමග හෝ ව්‍යවස්ථාවේ වෙනත් විධිවිධානයක් සමග එම පනත් කෙටුම්පත හෝ විධිවිධානයක් එකඟ නොවන බව

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

2. පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කිරීම අවශ්‍ය බව හෝ
3. ජනමතවිචාරණයක දී ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය බව.

මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එම පෙත්සම යොමුකල තැන් පටන් සති තුනක් ඇතුලත ලබා දීම අවශ්‍ය කෙරේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ලබා දෙන තෙක් ඒ එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු පියවරක් පාර්ලිමේන්තුව විසින් නොගත යුතු වේ.

මීට අමතරව හදිසි පනත් කෙටුම්පතක් එනම් ජාතියේ හිතසුව පිණිස වහා අවශ්‍ය යැයි ඇමති මණ්ඩලය විසින් සළකනු ලබන යම් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පැය විසි හතරක් ඇතුළත දිය යුතු වේ. නොඑසේ නම් ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දින තුනක් ඇතුලත දැනුම් දිය යුතු වේ. මෙවැනි පනත් කෙටුම්පත් සාමාන්‍ය පනත් කෙටුම්පත් මෙන් ගැසට් පත්‍රයේ පල නොකරන අතර පනත් කෙටුම්පත පරීක්ෂා කර බැලීම සඳහා අග්‍රවිනිශ්චයකාරවරයා වෙත යොමු කල යුත්තේ ජනාධිපතිවරයා විසින් පමණි. මෙහි දී නීතිපතිවරයාට පමණක් අධිකරණය ඉදිරියේ කරුණු දැක්වීමට හැකියාව ඇත.

ඉහත සඳහන් ආකාර දෙකෙන් ඕනෑම ආකාරයකට ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ එම තීරණයට මුල් වූ හේතු සමග දිය යුතු වේ.

ලකුණු 08 යි

නිගමනය

අපේක්ෂකයා විසින් සපයන ලද පිළිතුර සාර්ථක පිළිතුරක් බව නිගමනය කිරීමේ දී ඉහතින් දක්වන ලද කරුණු පිළිබඳ අවබෝධය අපේක්ෂකයාට තිබේ දැයි පරීක්ෂකවරයා විසින් තහවුරු කරගත යුතු ය. ඉතාමත් සාර්ථක ලෙසින් පිළිතුර ඉදිරිපත් කරන අපේක්ෂයෙකු අධිකරණයේ භූමිකාව විභාග කිරීමේ දී අනීත උදාහරණ ද ඇසුරු කරගනු ඇත.

ලකුණු 01 යි

(IV) ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාව

අරමුණ

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ අපේක්ෂකයා තුල පවතින දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම ය.

හැඳින්වීම

පළාත් සභා ක්‍රමය පිහිටුවන ලද්දේ 1987 ඉන්දු ලංකා ගිවිසුම පදනම් කරගනිමින් සම්පාදනය කල 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1987 අංක 42 දරණ පළාත් සභා යටතේ ය. මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාවය ප්‍රකාශ වන විධිවිධාන ගණනාවක් 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුල මෙන් ම පළාත් සභා පනත තුල ද තිබේ. මේ පිළිබඳ පැහැදිලි සහ නිරවුල් අවබෝධයක් අපේක්ෂකයාට තිබේ ද යන්න මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

ලකුණු 01 යි

සම්බන්ධතාවය

පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාව ගොඩ නැගීම ආකාර කිහිපයකින් සිදු වේ.

1. පලාත් සභාවක ආණ්ඩුකාරයා යනු මධ්‍යම ආණ්ඩුව විසින් පත් කරනු ලබන මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර සම්බන්ධතාව ඇති කරන ජනාධිපතිවරයාගේ නියෝජිතයා ය. එබැවින් ආණ්ඩුකාරයාගේ භූමිකාව පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාවය ගොඩ නැගීමට බෙහෙවින් හේතු වනු ඇත.
2. යම් පළාත් සභාවක පරිපාලනය බිඳ වැටී ඇති අවස්ථාවක මධ්‍යම ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් සෘජු ව මැදිහත් වීමේ හැකියාවක් ද පවතී.
3. මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර සම්බන්ධතාව ගොඩ නැගීම මූල්‍ය කටයුතු මගින් ද සිදුවේ. පළාත් සභාවලට ලබා දී ඇති ආදායම් මාර්ග පළාත් සභාවලට කිසිසේත් ම ප්‍රමාණවත් නොවන බැවින් මධ්‍යම ආණ්ඩුවේ ප්‍රදානයන් මත රඳ පැවතීමට පළාත් සභාවලට සිදු වේ.

පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාව ඇති කිරීමට ඉවහල් වන ඉහත කරුණුවලට අමතරව පළාත් සභා සිය ප්‍රතිපත්ති සැළසුම් තීරණය කිරීම මධ්‍යම ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සිදුකල යුතු වීම, සමගාමී ලැයිස්තුවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමේ බලය මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා යන දෙපාර්ශ්වයට ම හිමි වීම, පළාත් සභාවලට හිමිවන ප්‍රඥප්ති සෑදීමේ බලය යටතේ සකස් කල කෙටුම්පත් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර මධ්‍යම ආණ්ඩුවේ නීතිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වීම යනාදි කරුණු දැක්විය හැකිය.

ලකුණු 08 යි

නිගමනය

වඩා සාර්ථක පිළිතුරක දී අපේක්ෂකයා ඉහත සඳහන් කරන ලද කරුණු ද ඇතුළත් වන ලෙස පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාවය පිළිබඳ සාකච්ඡාවක් ඉදිරිපත් කලයුතු අතර එහි දී එම සම්බන්ධතාව පෙන්වීමට උදාහරණ ද ඉදිරිපත් කල යුතු ය.

ලකුණු 01 යි

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(V) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

ප්‍රවේශය

පළාත් පාලන ක්‍රමය පිළිබඳව පුළුල් අවබෝධයක් තිබේද යන්න පරීක්ෂා කර බැලීමයි මෙම ප්‍රශ්නයේ අරමුණය.

මධ්‍යම ආණ්ඩුවේ පනත් මඟින් බලය අවධාරිත කිරීමේ ක්‍රමය පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පිහිටුවා ඇත. ඒ අනුව දැනට මහ නගර සභා සහ ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතන තුනක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. **ලකුණු 01 යි**

ප්‍රධාන ලක්ෂණ

(අ) පළාත් පාලන ආයතන ව්‍යවස්ථාව මඟින් පිළිගෙන තිබීම. විශේෂ ලක්ෂණයකි. 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 4.1 වගන්තියෙන් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යන ආයතන ව්‍යවස්ථාපිත ආයතන ලෙස පිළිගෙන ඇති අතර එම ආයතන අදාළ නීතියට යටත්ව අධීක්ෂණය කිරීමේ බලය සහ අහෝසි කිරීමේ බලය පළාත් සභාවලට පැවරී ඇත.

(ආ) පළාත් පාලන ආයතනවලට මධ්‍යම ආණ්ඩුවේ අණ පනත් මඟින් බලය අවධාරිත කරන අතර අතිරේක බලතල පැවරීමේ බලය 13 වන සංශෝධනය මඟින් පළාත් සභාවලට හිමි කර තිබේ. නමුත් 1987 ට පෙර එම ආයතනවලට පවරා දී ඇති බලතල ආපසු ගැනීම පළාත් සභාවලට තහනම්ය.

(ඇ) සෑම පළාත් පාලන ආයතනයක්ම සමානුපාතික නියෝජන ක්‍රමය මඟින් වසර 4ක කාලය සඳහා තෝරා ගැනේ. පළාත් පාලන මැතිවරණ පවත්වනු ලබන්නේ මනාප ක්‍රමය පදනම් කරගත් විවෘත ලැයිස්තු ක්‍රමය භාවිතා කිරීමෙනි. එම මැතිවරණ පැවැත්වීමේ බලතල හිමි වී ඇත්තේ මධ්‍යම රජයට ය.

(ඈ) මහ නගර සභාවක ප්‍රධාන විධායකය නගරාධිපති වන අතර නගර සභා සහ ප්‍රාදේශීය සභාවල විධායකය සභාපතිවරයා වේ.

(ඉ) පළාත් පාලන ආයතන වල ප්‍රධාන මූල්‍ය මූලාශ්‍ර වන්නේ මධ්‍යම ආණ්ඩුවෙන් සහ පළාත් සභාවලින් වෙන් කරන අරමුදල්ය. ඊට අමතරව සෑම පළාත් පාලන ආයතනයකටම තමන්ගේ අරමුදල් පවත්වාගෙන යා හැකිය.

(ඊ) පළාත් පාලන ආයතනවලට පැවරී ඇති ප්‍රධාන කාර්ය වන්නේ අදාළ බල ප්‍රදේශය තුළ ප්‍රජා සෞඛ්‍ය හා පාරසරික සෞඛ්‍යාරක්ෂාව පවත්වා ගෙන යෑම සහ පොදු ප්‍රවාහන මාර්ග සකස් කර ඒවා නඩත්තු කිරීමය.

(උ) පළාත් පලාන ආයතනවල කාර්යාත්මක නිදහස ඒවාට පවරා දී ඇති බලතල සීමා වීම, මූල්‍ය සම්පත් හිඟකම, මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් සභාවේ අධීක්ෂණයට හා මෙහෙයුම් වලට යටත් වීම, මධ්‍යම ආණ්ඩුව විසින් පනවනු ලබන විවිධ අණ පනත්වල නියමයන්ට යටත්ව ක්‍රියා කිරීමට සිදුවීම සහ නාගරික සංවර්ධන අධිකාරියේ දැඩි නියමයන්ට යටත් වීම යන හේතු සාධක නිසා සීමාවේ. **ලකුණු 08 යි**

නිගමනය

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යවස්ථාපිත ආයතන වුවත් මධ්‍යම රජයේ සහ පළාත් සභාවල අණ පනත්වලට යටත්ව ක්‍රියා කිරීමට සිදු වී ඇති බැවින් ස්වාධිපති ආයතන ලෙස ක්‍රියාත්මක වන්නේ නැත. එහෙත් රටේ අභ්‍යන්තරයේ පොදු පරිපාලනය පහසු කිරීමෙහිලා සහ සංවර්ධන කාර්යයන් ඉටුකිරීමෙහිලා වැදගත් භූමිකාවක් ඉටුකරයි. **ලකුණු 01 යි**

ප්‍රශ්න අංක 08

පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න.

- **(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය.**
- **(ii) අන්තර්ජාතික යුක්ති අධිකරණය.**
- **(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ බලතල හා කාර්යයන්.**
- **(iv) පොදු රාජ්‍ය මණ්ඩලය.**

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය

ප්‍රශ්නයේ අරමුණ වන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ව්‍යුහය බලතල, කාර්යයන් සහ භූමිකාව පිළිබඳ විභාග අපේක්ෂකයන්ගේ දැනුම් සහ අවබෝධය පරීක්ෂා කිරීමය.

ප්‍රවේශයඃ-

2006 මාර්තු 15 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් පිහිටුවන ලද මහා මණ්ඩලයේ සහායක ආයතනයෙකි. මෙය පිහිටුවීමත් සමඟ 1946 සිට ක්‍රියාත්මකවූ මානව හිමිකම් කොමිසම අහෝසි විය. මෙම කවුන්සිලයේ අරමුණ වන්නේ ඒ ඒ රාජ්‍ය වල මානව හිමිකම් කඩවීම කෙරෙහි අවධානය යොමුකර ඒවාට පිළියම් යෙදීම, මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමය. **ලකුණු 01 යි**

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

කවුන්සිලයේ සංයුතිය සහ ව්‍යූහය.
මෙය මහ මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයින් 47 ගෙන් සමන්විත වෙයි. සාමාජිකයින් තෝරන්නේ කලාපීය පදනම මතය. ඒ අනුව අප්‍රිකානු කලාපයට 13ක්, ආසියානු කලාපයට 13ක්, නැගෙනහිර යුරෝපයට 06ක්, ලතින් ඇමරිකාව සහ කැරිබියානු කලාපයට 08ක්, බටහිර යුරෝපයට අනෙකුත් කණ්ඩායම්වලට 07ක් වශයෙන් සාමාජික සංඛ්‍යාව කලාපවලට හිමිවේ. මෙම සාමාජිකයින්ගේ නිල කාලය වසර 3කි. මහ මණ්ඩලයේ 2/3 බහුතරයෙන් ඕනෑම සාමාජික රාජ්‍යයක සාමාජිකත්වයෙන් අත්හිටුවිය හැකිය. කවුන්සිලය අවුරුද්දක් පාසා මාර්තු, ජූනි සහ සැප්තැම්බර් යන මාසවලදී රැස්වීමක් 03ක් පවත්වයි.

ලකුණු 03 යි

කවුන්සිලයේ බලතල, කාර්යයන් සහ භූමිකාව
මෙය පහත සඳහන් ලෙස ප්‍රධාන කොටස් තුනකට වෙන් කොට ඒවා එක් එක් කොටසට අයත් අනු කොටස් වශයෙන් සඳහන් කළ හැකිය.

1. මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම ජාත්‍යන්තර මට්ටමින් පිළිගෙන තිබෙන මානව හිමිකම් ආරක්ෂා කර ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම කවුන්සිලය වෙත පවරා ඇත. ඒ අනුව පහත සඳහන් බලතල සහ කාර්යයන් ඉටු කරයි.

(අ) සාමාජික රාජ්‍යයන්හි අභ්‍යන්තර වශයෙන් මානව හිමිකම් පිළිබඳ පරීක්ෂාවක් සහ සමීක්ෂණ පවත්වා ඒ හා බැඳුනු උපදෙස් සහ යෝජනා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

(ආ) එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයවල මානව හිමිකම් ක්‍රියාකාරකම් සමාන ලෙස සමීක්ෂණය කොට ඒ පිළිබඳ වාර්තා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

(ඇ) ලෝකයේ විවිධ රාජ්‍යවල පවතින මානව හිමිකම් තත්වයන් සොයා බැලීම සහ මානව හිමිකම් කඩවීම්වලට ප්‍රතිචාර දැක්වීම

(ඈ) එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් අත්සන් කරනු ලබන මානව හිමිකම් සම්මුතීන්, ප්‍රකාශ සහ අනෙකුත් ගිවිසුම්වල අඩංගු කරුණු ක්‍රියාත්මක කිරීම.

(ඉ) සම්මුතීන්වලට සහ අනෙකුත් ගිවිසුම්වලට අත්සන් කරන සහ අත්සන් නොකරන සියළු රටවල් ලවා එම සම්මුතීන්වල සහ ගිවිසුම්වල අඩංගු විධිවිධාන ගරුකොට සළකා සහතික කරවා ගැනීම.

(ඊ) සම්මුතීන්වලට සහ ගිවිසුම්වලට අත්සන් නොකරන රාජ්‍යයන් පවා පරීක්ෂණ කිරීම්වලට සහ සමීක්ෂණ ලට ලක් කිරීම.

2. **ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සහ කාර්යභාරය**
මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් කවුන්සිලය පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.

(අ) මානව හිමිකම් ක්ෂේත්‍රයේ තිබෙන මානව දයාවාදී නීති, මානව දයාවාදී කටයුතු, සරණාගත නීති හා ප්‍රතිපත්ති වැනි ප්‍රධාන කරුණු තෝරා ඒවායේ ප්‍රමුඛතා අනුව ලෝකය පුරා ඒවා සම්බන්ධයෙන් කටයුතු ඉටුකිරීම.

(ආ) මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ මානව හිමිකම් සහ මානව හිමිකම් වගකීම් සහතික කිරීම යන කරුණු අඩංගු නව සම්මුතීන්, ප්‍රකාශ සහ ගිවිසුම් පිළිබඳ විෂය කරුණු සකස් කර නියමයන් තීරණය කිරීම.

(ඇ) ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් දායක වීම.

(ඈ) අධ්‍යාපන කටයුතු සහ සම්මන්ත්‍රණ මඟින් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම, මානව හිමිකම් ගිවිසුම්වලට තම එකඟතාවය දක්වන මෙන් රටවල්වලට ආරාධනා කිරීම සහ මානව හිමිකම් පිළිබඳ උපදේශන සේවා සහ ශිල්ප ක්‍රම සේවා ලබාදීම.

(ඉ) රාජ්‍ය ක්‍රියාධරයින් සහ රාජ්‍ය නොවන ක්‍රියාධරයින් අතර මානව අයිතිවාසිකම් පිළබඳ සාකච්ඡා සහ සංවාද සංවිධානය කිරීම

3. **සම්බන්ධීකරණය කිරීම සහ අන්තර් ක්‍රියාකාරකම්**
එක්සත් ජාතීන්ගේ ඒජන්සි ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන අතර සම්බන්ධීකරණය ගොඩනගා අන්තර් ක්‍රියාකාරකම් ඇති කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් සහ භූමිකා ඉටුකරයි.

(අ) මානව හිමිකම් ක්ෂේත්‍රයේ හොඳහිත දිනාගෙන ඇති ජාත්‍යන්තර ක්ෂමා ආයතනය, මානව හිමිකම් කවුලුව වැනි මානව හිමිකම් සංවිධාන මගින් මානව හිමිකම් පිළිබඳ තොරතුරු සහ කරුණු එක්රැස්කිරීම.

(ආ) කාලීන සැසිවාරවලට සහභාගීවීමේ අවස්ථා සහ එම සැසිවාරවලදී පවත්වන සාකච්ඡාවලට අනුබල දෙන තොරතුරු සැපයීම් සඳහා අවස්ථා රාජ්‍ය නොවන සංවිධානවලට ලබා දීම.

ලකුණු 05 යි

නිගමනය
මානව හිමිකම් කවුන්සිලය වර්තමානයේදී මානව හිමිකම් ජාත්‍යන්තර මට්ටමෙහි ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීමෙහිලා විශාල කාර්යභාරයක් ඉටුකරන බැවින් එම කවුන්සිලය අන්තර් ජාතික ක්ෂේත්‍රයේ මානව හිමිකම් සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන වැදගත්ම අන්තර්ජාතික සංවිධානය ලෙස හැඳින්විය හැක.

ලකුණු 01 යි

II අන්තර්ජාතික යුක්ති අධිකරණය
ප්‍රශ්නයේ අරමුණවන්නේ අන්තර්ජාතික යුක්ති අධිකරණය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම සහ අවබෝධය පිරීක්සීමයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ප්‍රවේශය
මෙය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අධිකරණ ආයතනයවේ. එහි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ නෙදර්ලන්තයේ හේග් නගරයේය. එහි අධිකරණ බලය සෑම සාමාජික රාජ්‍යයකටම විවෘතව පවතී. මහ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සාමාජික නොවන රාජ්‍යයන්ටද මෙම අධිකරණයේ පිහිට පැතිය හැක. මෙය ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කරයි.

ලකුණු 01 යි

සංයුතිය
මෙය සාමාජිතකයින් 15 ගෙන් සමන්විතයි. මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩල ඒකාබද්ධව මෙම 15 දෙනා පත්කරයි. අධ්‍යාපනික හා වෘතීය සුදුසුකම් මොවුන් තේරීමේ පදනම වූවද ලෝකයේ සෑම ප්‍රධාන නීති ක්‍රමයක්ම නියෝජනය වන අයුරින් මෙම සාමාජිකයින් පත්කරනු ලැබේ. එකම රාජ්‍යයකින් විනිශ්චයකරුවන් දෙදෙනෙකු එක්වර පත්කළ නොහැක. මොවුන්ගේ නිල කාලය වසර 09කි. යළි තේරී පත්විය හැක.

ලකුණු 04 යි

බලතල හා කාර්යයන්
අන්තර්ජාතික යුක්ති අධිකරණයට පහත සඳහන් කරුණු පිළිබඳ බලතල හිමිවේ.
(ඉ) සමාන බලය ලත් විශේෂ ඒජන්සි ආයතනයන්ට සහ එක්සත් ජාතීන්ගේ සමහර ආයතනයන්ට උපදේශන ලබාදීම.
(ආ) ද්වි පාර්ශ්වික සහ බහු පාර්ශ්වික ගිවිසුම් නිර්වචන සම්බන්ධ ගැටුම් සහ අඩුපාඩු ඇති වූ විට ඒ පිළිබඳ තීරණ ගැනීම.
(ඇ) ප්‍රඥප්තියේ අඩංගු කරුණු පිළබඳ විනිශ්චය කිරීම.
(ඈ) අන්තර්ජාතික නීතිය සහ ගිවිසුම් පිළිබඳ විවරණය කිරීම සහ අන්තර්ජාතික වගකීම් උල්ලංඝනය වීම පිළිබඳ නීති ගැටළු මතුවීමේදී ඒවා විනිශ්චය කිරීම.

ලකුණු 04 යි

නිගමනය
අන්තර්ජාතික යුක්ති අධිකරණය බලතල සහිත ස්වාධීන ආයතනයක් වුවත් එහි විනිශ්චයන් ක්‍රියාත්මක කිරීම ගැටළු සහිත වේ. සමස්ථයක් ලෙස ගත්විට සාමාජික රාජ්‍යයන් ඉල්ලා නොසිටියහොත් ක්‍රියාත්මක කිරීමට නොහැකිවන බැවින් මේ අධිකරණයේ ක්‍රියාකාරිත්වය සීමාසහිතය. ජාත්‍යන්තර සම්බන්ධතා බල දේශපාලනය මඟින් පාලනය වන නිසා රාජ්‍යයන් අතර පැන නගින ගැටළු සහ ප්‍රශ්න විනිශ්චය කිරීම සඳහා නීති ක්‍රියාමාර්ග ගැනීම පහසු නොවේ. ලකුණු 01 යි

(III) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ බලතල හා කාර්යයන්

ප්‍රවේශය
ප්‍රශ්නයේ අරමුණ වන්නේ ආරක්ෂක මණ්ඩල සංයුතිය, එහි බලතල හා කාර්යයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමය.
ආරක්ෂක මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන අතරින් එකක්වන අතර ස්ථාවර ආයතනයක් ලෙසද ක්‍රියාත්මක වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතතාවය පවත්වා ගෙන යාමේ භාරදූර වගකීම මෙම මණ්ඩලය වෙත පවරා ඇත. එබැවින් මෙම මණ්ඩලය අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතතාවය සමඟ බැඳුනු විශාල බලතල හා කාර්යයන් රාශියකගෙන් යුක්ත වේ.

ලකුණු 01 යි

සංයුතිය හා ව්‍යූහය
ආරක්ෂක මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ. එයින් 05ක් ස්ථාවර සාමාජිකයින්වේ. චීනය, රුසියාව, ප්‍රංශය, මහ බ්‍රිතාන්‍ය හා ඇමරිකානු එක්සත් ජනපදය ස්ථාවර සාමාජිකයන් වේ. ඉතිරි සාමාජිකයන් 10 දෙනා අවුරුදු දෙකකට වරක් තාවකාලික පදනම මත මහ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. මෙම සාමාජිකයන් භූගෝලීය පදනම මත වෙනස්කම් දැක්වීමෙන් තොරව අප්‍රිකානු-ආසියානු රාජ්‍යවලට 05ක් , නැගෙනහිර යුරෝපයට 01ක්, ලතින් ඇමරිකාවට 02ක්, බටහිර රාජ්‍යවලට 02ක් වශයෙන් තෝරා පත්කරනු ලැබේ. එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමිවේ. සාමාන්‍ය කරුණු පිළිබඳ තීරණ සාමාජිකයන් 09 කගේ අනුමැතියෙන්ද වැදගත් කරුණු පිළිබඳ තීරණ ස්ථාවර සාමාජිකයන් 05 දෙනාගේ ඒකමතික අනුමැතියෙන්ද ගත යුතුය. ස්ථාවර නියෝජිතයකු විරුද්ධ වන්නේ නම් තීරණය අහෝසි වේ. මෙය මහ බලවතුන් සතු නිශේධ බලය ලෙස හැඳින්වේ. නමුත් ඡන්දය දීමෙන් වැළැකී සිටීම නිශේධ බලය යෙදීම ලෙස සළකන්නේ නැත.

ලකුණු 01 යි

බලතල හා කාර්යයන්
ආරක්ෂක මණ්ඩලය සාමය සහ සුරක්ෂිතතාවය පවත්වාගෙන යෑම පිළිබඳ තමන් වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම ඉටුකිරීම සඳහා පහත සඳහන් බලතල හා කාර්යයන් හිමිකරගෙන ඇත.
(අ) ජාත්‍යන්තර අර්බුදයකට තුඩුදිය හැකි ඕනෑම අර්බුදයක් හෝ තත්වයක් පිළිබඳව විභාග කිරීම.
(ආ) එවැනි අර්බුද විසඳන ආකාරය පිළිබඳව මහා මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
(ඇ) අවි ආයුධ පාලනය කිරීම සඳහා ක්‍රමවේද පිළිබඳ සැලසුම් සම්පාදනය කිරීම.
(ඈ) සාමයට තර්ජන ඇති වූ විටක හෝ ආක්‍රමණ ක්‍රියාවන් ඇති වූ විටක එහි තත්වය පිළිබඳව තීරණය කොට ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ඉ) ආක්‍රමණකාරී ක්‍රියාවන්ට එරෙහිව පනවන ලද සම්බාධක ක්‍රියාවට නංවන මෙන් සාමාජික රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටීම.
(ඊ) ආක්‍රමණිකයාට එරෙහිව හමුදා බලය යෙදවීම.
(උ) එක්සත් ජාතීන්ගේ සංවිධානය සතු හමුදා යොදවමින් උපායාත්මක ප්‍රදේශයන්හි භාරකාරත්වය ක්‍රියාවට නැංවීම.
(ඌ) මහා ලේකම්වරයා පත්කිරීම පිළිබඳව මහා මණ්ඩලයට නිර්දේශ කිරීම හා මහා මණ්ඩලය සමඟ එක්වී අන්තර්ජාතික යුක්ති අධිකරණයේ විනිශ්චයකරුවන් 15 දෙනා පත්කිරීම. **ලකුණු 07 යි**

නිගමනය
ආරක්ෂිත මණ්ඩලයේ ව්‍යුහය, එහි නිත්‍ය සාමාජිකයන්ගේ නිශේධ බලය සහ එම මණ්ඩලය සතු සාමය පවත්වා ගෙන යෑම පිළිබඳ බලතල හා කාර්යයන් බලන විට එම මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධාන පද්ධතිය තුළ වැදගත් ස්ථානයක් උසුලයි. අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතතාව පවත්වා ගෙන යෑම පිළිබඳව මහා මණ්ඩලයට වඩා බලවත් ආයතනයක් ලෙසද සැලකේ. **ලකුණු 01 යි**

(IV) පොදු රාජ්‍ය මණ්ඩලය

ප්‍රවේශය
ප්‍රශ්නයේ අරමුණ වන්නේ පොදු රාජ්‍ය මණ්ඩලයේ සංයුතිය, ආයතනික ව්‍යුහය, එහි කාර්යයන් හා භූමිකාව පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමය.
පොදු රාජ්‍ය මණ්ඩලය යනු පටු අරමුණු සහිත මැදි මට්ටමේ අන්තර්ජාතික රාජ්‍ය සංවිධානයකි. මෙය හුදු ස්වේච්ඡා සංවිධානයක් වන අතර ඕනෑම සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස්විය හැක. එයට ලිඛිත ව්‍යවස්ථාවක් නැත්තාසේම ලිඛිතව ප්‍රකාශ කරන ලද අරමුණු මාලාවක්ද නැත. එහෙත් සාමාජික රාජ්‍යයන් සම්ප්‍රදායන් මඟින් බැඳ තබා ඇති සාර්ථක වැදගත් ආයතනයකි. **ලකුණු 01 යි**

සංයුතිය හා ව්‍යුහය
මෙම මණ්ඩලය 1949 ලන්ඩන් ප්‍රකාශනය මඟින් ක්‍රමවත් ලෙස පිහිටුවන ලදි. මෙය සාමාජිකයන් 54 දෙනෙකුගෙන් සමන්විතය. සාමාජික රාජ්‍යයන් අතරින් බොහෝමයක් බ්‍රිතාන්‍ය යටත් විජිතයට අයත් රාජ්‍යයන්ය. මෑත කාලයේදී එයට පරිබාහිර රාජ්‍යයන්ද මෙහි සාමාජිකත්වය ලබාගෙන ඇත. ලන්ඩන් ප්‍රකාශනය මඟින් බ්‍රිතාතන්‍ය මහ රැජින එහි නායිකාව ලෙස පත්කරන ලදි. සාමාජික රාජ්‍යයන් එකිනෙක අතර නෛතික බැඳීම් නොමැති අතර ඒ වෙනුවට මෙම රාජ්‍යයන්ගේ භාෂාව, ඉතිහාසය, මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය පිළිබඳව අගය කිරීම මත මේ රාජ්‍යයන් අතර එක්සත්භාවය ගොඩනැඟී ඇත.
පොදු රාජ්‍ය මණ්ඩලයේ ආයතනික පද්ධතිය අතරින් රාජ්‍ය නායකයින් ගේ සමුළුව වැදගත් ආයතනයකි. සෑම වසර දෙකකට වතාවක් මෙම සමුළුව පවත්වනු ලැබේ. මෙම සමුළුවේදී ගනුලබන තීරණ අනුව ඊළඟ අවුරුදු දෙක සඳහා මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සැළසුම් කරනු ලැබේ. මෙයට අමතරව අමාත්‍ය මට්ටමේ සහ අමාත්‍යාංශය මට්ටමේ රැස්වීම් වසරක් පාසා පවත්වනු ලබයි.
පොදු රාජ්‍ය මණ්ඩලයේ පරිපාලන කටයුතු මෙහෙයවීම, අනෙක් ආයතන සමඟ සබඳතා පැවැත්වීම, නායක සමුළුවට පහසුකම් සැපයීම, සහ ආර්ථික සංවර්ධන සැළසුම් ක්‍රියාවට නැංවීම යනාදී කාර්යයන් ඉටුකිරීම සඳහා මහ ලෙකම් කාර්යාලයක් පිහිටුවා ඇත. එහි මහ ලේකම්වරයා නායක සමුළුව මඟින් පත්කෙරේ. **ලකුණු 04 යි**

මණ්ඩලයේ කාර්යයන් සහ භූමිකාව
(අ) ගැටුම් නිරාකරණය කිරීමෙහිලා සහයෝගය දැක්වීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍ර ආයතන බලගැන්වීම, මානව හිමිකම් වර්ධනය කිරීම සහ ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාකිරීම.
(ආ) සාමාජික රාජ්‍යයන්හි ජනතාවට සමාජ සුරක්ෂිතතාවය සහ නීතියේ ආධිපත්‍යයේ හා යහ පාලනයේ ප්‍රයෝජන ලබා දීම.
(ඇ) වෙනස්කම් දැක්වීම පිටුදැක, සමාන අවස්ථා ලබා දී මණ්ඩලයේ සාමාජික රාජ්‍යයන්හි සිටින පුරුෂයන් හා ස්ත්‍රීන් සවිබල ගැන්වීම අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් තරුණයන්ගේ හැකියාවන් වර්ධනය කිරීමටත් අපේක්ෂාවන් ඉටු කිරීමටත් දායක වීම.
(ඈ) සංවර්ධනය හා සාමාජික රාජ්‍යයන්ගේ ආශා ආරක්ෂා කිරීමට දායක වීම, වෙළඳාම හා ආයෝජනය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වීම සහ එම රාජ්‍යවල ජනතාවගේ දරිද්‍රතාවය තුරන් කිරීමටත් තිරසාර සංවර්ධනයටත් උපකාරී වීම.
(ඉ) කුඩා රාජ්‍යයන්ගේ ආරක්ෂාව හා පැවැත්ම සඳහා ක්‍රියාත්මකවීම සහ ඒ වෙනුවෙන් අන්තර්ජාතික සමාජයේ අවධානය යොමු කරවීම.
(ඊ) පොදු රාජ්‍ය මණ්ඩලයේ කාර්යයන් ලෝකයාට හුවා දක්වා ඒ පිළිබඳ ලෝක ජනතාවගේ අවධානය දිනා ගැනීම.
(උ) සාමාජික රාජ්‍යයන් අතර සහයෝගීතාවය සහ විශ්වාසය වර්ධනය කර එක පවුලක් සේ ක්‍රියා කිරීම. **ලකුණු 04 යි**

නිගමනය
පොදු රාජ්‍ය මණ්ඩලය ව්‍යවස්ථාවක් නැති, නෛතික රාමුවක් තුළ ක්‍රියාත්මක වන මණ්ඩලයක් වුවත් සාමාජිකයන් එකට බැඳ තබන ප්‍රධාන පුරුක සම්ප්‍රදාය වේ. එනම් සාමාජික රාජ්‍යයන් නොයෙක් දේශපාලන ක්‍රම අනුගමනය කළත් දේශපාලන වශයෙන් බ්‍රිතාන්‍ය සම්ප්‍රදායන් අනුගමනය කරයි. සාමාජික රාජ්‍යයන් බැඳ තබන අනෙක් සාධකයන් වන්නේ ඉංග්‍රීසි භාෂාව සහ ක්‍රිකට් ක්‍රීඩාවයි. මේ මඟින් සාමාජික රාජ්‍යයන් ආර්ථික , සමාජීය, වාණිජ සහ සංස්කෘතික වශයෙන් එකිනෙකට ආධාර උපකාර කරගනී.
ලකුණු 01 යි

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.